# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

## 5.1 සමස්ත නිරීක්ෂණ

**දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.7 ක් ලෙස ජංගම ගිණුමේ හිඟයෙහි පහළ යෑමක් සහ ගෙවුම් තුලනයේ එ.ජ. ඩොලර් මිලියන 1,369 ක අතිරික්තයක් වාර්තා කරමින් 2014 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය වර්ධනය විය.** භාණ්ඩ ආනයන වර්ධනය ඉහළ යෑමත් සමඟ වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වුවද, සේවා වෙළඳාමෙන් ලද විදේශ විනිමය ලැබීම් සහ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ යෑම ජංගම ගිණුමේ හිඟය අඩු වීමට උපකාරී විය. ජංගම ගිණුමේ වර්ධනයත්, විදේශීය සෘජු ආයෝජන සහ රජය, බැංකු හා පෞද්ගලික අංශයන් වෙත වූ ලැබීම් ලෙස මූල්‍ය ගිණුම වෙත අඛණ්ඩව මූල්‍ය ප්‍රවාහයන් ලැබීමත් හේතුවෙන් 2014 වසරේ දී ගෙවුම් තුලනයේ ඉහළ අතිරික්තයක් වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස රටෙහි දළ නිල සංචිත 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 8.2 ක් දක්වා වර්ධනය වූ අතර, එය ආනයනික මාස 5.1 කට සමාන විය. මේ අතර, ඉහළ අපනයන ඉපැයුම් ඇතුළු විදේශ විනිමය ලැබීම් ඉහළ යෑම හමුවේ ශ්‍රී ලංකා රුපියල වසරේ පළමු භාගයේ දී අධිප්‍රමාණය වූ නමුත් ප්‍රධාන වශයෙන් ආනයන වියදම් ඉහළ යෑම සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ආශ්‍රිත ශුද්ධ විදේශ විනිමය ගෙවීම් හේතුවෙන් වසරේ දෙවන භාගයේ දී මෙම තත්ත්වය වෙනස් විය. මේ අනුව, 2014 වසර තුළ දී රුපියල සාපේක්ෂව ස්ථාවරව පැවති අතර, මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක අධිප්‍රමාණය විය.

**විදේශීය අංශයෙහි පෙන්නුම් කළ වර්ධනයන් හමුවේ වුවද, ගෝලීය සහ දේශීය සාධක හේතුවෙන් 2014 වසර අවසාන වන විට ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තුළ ඇති විය හැකි යම් අභියෝගයන් පිළිබඳ අවධාරණය කෙරිණි.** මෙම අභියෝග විනිමය අනුපාතිකය සහ විදේශීය විනිමය සංචිත කෙරෙහි යම් පීඩනයක් ඇති කළ අතර, එමගින් සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් අනාගතයේ ඇති විය හැකි අහිතකර තත්ත්වයන්ට මුහුණ දීමට අවශ්‍ය අතිරික්තයන් ගොඩනැගීමේ සහ සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය පිළිඹිබු කෙරිණි. විශේෂයෙන්, විදේශීය අංශයේ වර්ධනය වෙමින් පැවති අසමතුලිතතාවයන් පාලනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් 2012 වසර මුලදී හඳුන්වා දුන් ප්‍රතිපත්ති මගින් ඇති වූ හිතකර බලපෑම, ආනයන මත පනවා තිබූ සමහර සීමා කිරීම් ලිහිල් කිරීම, ගෝලීය ආර්ථිකයේ වර්ධනය මන්දගාමී වීම සහ සාම්ප්‍රදායික නොවන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග නිසා ගෝලීය වෙළඳපොළෙහි සිදු වූ උච්චාවචනයන් හේතුවෙන් 2014 වසර අවසාන වනවිට අඩු විය. මේ සමඟ, විදේශ විනිමය සඳහා වූ ඉහළ ඉල්ලුම හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ මත වූ පීඩනය ඉහළ යෑම විදේශීය අංශය තුළ ඉදිරියේ දී ඇති විය හැකි අභියෝග අවධාරණය කළේය. ඒ අනුව, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතිරික්තයන් ගොඩනැංවීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගත් අතර, ජාත්‍යන්තර සංචිත මට්ටම වර්ධනය කිරීම සඳහා ඉන්දියානු සංචිත බැංකුව සමඟ විදේශ විනිමය හුවමාරු ගිවිසුමකට එළඹීම සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම මෙයට ඇතුළත් වේ.

**5.1 සංඛ්‍යා සටහන**

**ගෙවුම් තුලන විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් මිලියන | | රුපියල් මිලියන | |
|---|---|---|---|---|
| | 2013 (අ) | 2014 (ආ) | 2013 (අ) | 2014 (ආ) |
| **ජංගම ගිණුම** | **-2,541** | **-2,018** | **-323,961** | **-263,428** |
| **වෙළඳ ගිණුම** | **-7,609** | **-8,287** | **-979,074** | **-1,081,987** |
| අපනයන | 10,394 | 11,130 | 1,344,054 | 1,453,176 |
| ආනයන | 18,003 | 19,417 | 2,323,128 | 2,535,163 |
| **සේවා (ශුද්ධ)** | **1,180** | **1,880** | **152,521** | **245,496** |
| ලැබීම් | 4,685 | 5,605 | 605,104 | 731,863 |
| ගෙවීම් | 3,505 | 3,725 | 452,583 | 486,367 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-1,751** | **-1,839** | **-226,086** | **-240,065** |
| ලැබීම් | 132 | 153 | 17,003 | 20,040 |
| ගෙවීම් | 1,883 | 1,992 | 243,090 | 260,104 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **5,639** | **6,227** | **728,678** | **813,128** |
| ද්විතීයික ආදායම් : ලැබීම් | 6,428 | 7,046 | 830,407 | 920,035 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 6,407 | 7,018 | 827,689 | 916,344 |
| රජයේ සංක්‍රාම | 21 | 28 | 2,718 | 3,691 |
| ද්විතීයික ආදායම් : ගෙවීම් | 788 | 819 | 101,728 | 106,906 |
| **ප්‍රාග්ධන ගිණුම** | **71** | **58** | **9,188** | **7,684** |
| ප්‍රාග්ධන ගිණුම : ලැබීම් | 90 | 73 | 11,596 | 9,586 |
| ප්‍රාග්ධන ගිණුම : ගෙවීම් | 19 | 15 | 2,409 | 1,903 |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම** | **-2,470** | **-1,960** | **-314,773** | **-255,744** |
| **මූල්‍ය ගිණුම** | **3,064** | **1,936** | **388,700** | **252,409** |
| **සෘජු ආයෝජන : වත්කම්** | **65** | **67** | **8,399** | **8,725** |
| **සෘජු ආයෝජන : වගකීම්** | **933** | **944** | **120,817** | **123,304** |
| **විවිධ ආයෝජන : වත්කම්** | **...** | **...** | **-29** | **-29** |
| ණය සුරැකුම්පත් | ... | ... | -29 | -29 |
| **විවිධ ආයෝජන : වගකීම්** | **2,068** | **1,996** | **265,723** | **260,728** |
| හිමිකම් | 226 | 184 | 29,048 | 24,063 |
| ණය සුරැකුම්පත් | 1,843 | 1,812 | 236,676 | 236,665 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | **-191** | **688** | **-24,531** | **89,993** |
| මුදල් සහ තැන්පතු | -459 | 276 | -58,839 | 36,115 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 225 | 98 | 29,128 | 12,795 |
| අනෙකුත් ගිණුම් ලැබිය යුතු | 42 | 314 | 5,181 | 41,082 |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | **1,048** | **1,298** | **137,452** | **169,506** |
| මුදල් සහ තැන්පතු | 108 | -292 | 14,960 | -38,152 |
| ණය | 1,118 | 1,847 | 144,640 | 240,985 |
| මහ බැංකුව | -453 | -719 | -57,683 | -93,904 |
| තැන්පතු භාරගන්නා ආයතන | 124 | 1,358 | 15,940 | 177,243 |
| රජය | 841 | 646 | 108,284 | 84,199 |
| අනෙකුත් අංශ | 605 | 563 | 78,099 | 73,447 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -235 | -407 | -30,495 | -53,256 |
| අනෙකුත් ගිණුම් ගෙවිය යුතු | 58 | 151 | 8,348 | 19,929 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි) | - | - | - | - |
| **සංචිත වත්කම්** | **1,112** | **1,548** | **151,454** | **202,442** |
| මූල්‍ය රත්‍රන් | 351 | 9 | 44,862 | 1,154 |
| විශේෂ ගැනුම් හිමිකම් | 12 | -6 | 1,410 | -748 |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | - | - | - | - |
| අනෙකුත් සංචිත වත්කම් | 749 | 1,545 | 105,182 | 202,036 |
| මුදල් සහ තැන්පතු | 1,297 | 496 | 176,818 | 64,720 |
| සුරැකුම්පත් | -548 | 1,049 | -71,636 | 137,316 |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **-594** | **24** | **-73,927** | **3,335** |
| **සමස්ත ශේෂය (ඇ)** | **985** | **1,369** | **226,086** | **397,126** |
| ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස | | | | |
| වෙළඳ ගිණුම | -11.3 | -11.1 | | |
| භාණ්ඩ හා සේවා | -9.6 | -8.5 | | |
| ජංගම ගිණුම | -3.8 | -2.7 | | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුම | -3.7 | -2.6 | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.11 සංඛ්‍යා සටහන සහ ඒ හා සම්බන්ධ සටහන පරිශීලනය කරන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.2 විදේශ වෙළඳ ප්‍රතිපත්තිය සහ ආයතනික සහය

ලෝක ආර්ථිකය හා ශ්‍රී ලංකාව අතර ඇති සබඳතාවය වැඩිදියුණු කිරීම කෙරෙහි වූ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය 2014 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම අරමුණ උදෙසා, වසර තුළදී රජය සහ පෞද්ගලික අංශයේ ආයතන විසින් අපනයන අංශයෙහි ක්‍රියාකාරිත්වය සහ ඉදිරි කටයුතු පුළුල් කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩවලට විදේශ වෙළඳපොළට පිවිසීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රයත්න දැරීම, වෙළඳ සහ තීරු බදු ප්‍රතිපත්ති තවදුරටත් තාර්කීකරණය කිරීම සහ ආයෝජන දිරිමත් කිරීම යනාදිය මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය. අපනයන දිරිමත් කිරීම, විදේශ වෙළඳ ප්‍රතිපත්තියේ ප්‍රමුඛතාවය දිය යුතු ප්‍රධාන අංශය වූ අතර, තෝරාගත් දේශීය කර්මාන්ත කිහිපයක් සුරක්ෂිත කිරීමේ අරමුණින් යුතුව ආනයන තාර්කීකරණය කිරීම සඳහා ඇතැම් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**ශ්‍රී ලාංකීය නිෂ්පාදිතයන්ට විදේශීය වෙළඳපොළ වෙත පිවිසීමට ඇති හැකියාව ශක්තිමත් කිරීම සඳහා වසර තුළ දී ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත.** දැනට පවත්නා වෙළඳ ගිවිසුම් ඵලදායී ලෙස උපයෝජනය කිරීම, නව වෙළඳ ගිවිසුම් සඳහා එළඹීමට ඇති හැකියාවන් සොයා බැලීම, වෙළඳපොළ පර්යේෂණ කටයුතු ශක්තිමත් කිරීම සහ විදේශ වෙළඳපොළවලදී සිදු කරන අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු වර්ධනය කිරීම මෙලෙස ගන්නා ලද ක්‍රියාමාර්ගවලින් කිහිපයකි. තවද, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළඳපොළ වන යුරෝපා සංගමය වෙත සහනදායී කොන්දේසි යටතේ භාණ්ඩ අපනයනය කළ හැකි වන විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) නැවත ලබාගැනීම සඳහා සාකච්ඡා ආරම්භ කර ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ ප්‍රවේශය වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ද්විපාර්ශ්වික ගිවිසුම් උපයෝජනය කිරීම සම්බන්ධයෙන් 2014 වසරේදී සතුටුදායක ප්‍රගතියක් දක්නට ලැබුණි.** ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ, ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත සිදු කළ අපනයන 2013 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 367 සිට 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 376 ක් දක්වා වර්ධනය විය. 2014 වසරේ දී ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත සිදු කළ මුළු අපනයනවලින් සියයට 60 ක් පමණ ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කර තිබේ. රටවල් දෙක අතර පවතින ආර්ථික සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව වාණිජ ලේකම්වරුන් අතර සාකච්ඡාවල දෙවන

වටය ඉන්දියාවේ දී පැවැත්වීය. තවද, පාකිස්ථාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ වූ නොවිසඳුන ගැටලු කිහිපයක් නිරාකරණය කර ගැනීමේ අරමුණින් යුතුව වෙළඳාම සඳහා වූ පොදු කාරක මණ්ඩලයක් පත් කළ අතර, එමගින් රේගු අතර සහයෝගීතාවය, වෙළඳ මතභේද නිරාකරණය, තීරු බදු නොවන බාධක සහ වෙළඳපොළ ප්‍රවේශය පිළිබඳ ගැටලු යන කරුණු සලකා බලන ලදී. පාකිස්ථාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ 2014 වසරේ දී ශ්‍රී ලංකාව විසින් එ.ජ. ඩොලර් මිලියන 52 ක වටිනාකමින් යුත් භාණ්ඩ පාකිස්ථානය වෙත අපනයනය කළ අතර, එය ශ්‍රී ලංකාව විසින් පාකිස්ථානය වෙත සිදු කළ මුළු අපනයනවලින් සියයට 70 ක් පමණ විය. තවද, යෝජිත චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) හරහා ශ්‍රී ලංකාව සහ චීනය අතර ඇති ද්විපාර්ශ්වීය වෙළඳ සබඳතා පුළුල් කර ගැනීම සඳහා අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. වෙළඳ බාධක ලිහිල් කිරීම සහ ආර්ථික සහයෝගීතාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, යෝජිත චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සඳහා වූ සාකච්ඡාවල දෙවන වටය, 2014 නොවැම්බර් මාසයේ දී පැවැත්විණි. මෙම යෝජිත ගිවිසුමට අයත් වන ප්‍රධානතම අංශය ලෙස ඇඟලුම් අංශය හඳුනාගෙන ඇති අතර, විශාල චීන වෙළඳපොළ වෙත ශ්‍රී ලංකා ඇඟලුම්වලට පිවිසීමේ හැකියාව මෙමඟින් ලැබෙනු ඇත.

**2014 වසරේ දී කලාපීය සහ බහුපාර්ශ්වීය ගිවිසුම් යටතේ වූ වෙළඳාම ද අඛණ්ඩව සිදු කරන ලදී.** ශ්‍රී ලංකාව විසින් බංගලාදේශය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය සහ පාකිස්ථානය යන රටවලට දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණය (SAFTA) යටතේ 2013 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2 ක වටිනාකමින් යුත් අපනයන සිදු කළ අතර එය 2014 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 13 ක් විය. මෙම ගිවිසුම යටතේ සෑම සාමාජික රටක් විසින්ම තම සෘණ ලැයිස්තුව (Negative List) සියයට 20 කින් අඩු කිරීමට කටයුතු කරන ලදී. 2014 වසර තුළ දී, ආසියානු පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA) යටතේ ස්ථාවර කමිටු රැස්වීම් වාර තුනකට ශ්‍රී ලංකාව සාර්ථක ලෙස සහභාගී වූ අතර, තීරු බදු සහන වැඩි කිරීම, නිෂ්පාදිත රට පිළිබඳව වූ කොන්දේසි ලිහිල් කිරීම හා වෙළඳාම පහසු කිරීම, ආයෝජනය සහ සේවා සඳහා වන එකඟතා රාමුව ක්‍රියාත්මක කිරීමේ පෙර දැක්ම පිළිබඳව සාකච්ඡා කිරීම යනාදිය සිදු කරන ලදී. මෙම ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් 2014 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 120 ක වටිනාකමකින් යුත් භාණ්ඩ, ගිවිසුමේ අනෙකුත් සාමාජික රටවල් වෙත අපනයනය කරන ලද අතර, 2013 වසරේ දී එම අපනයන වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 84 ක් විය. ආසියානු පැසිෆික් වෙළඳ ගිවිසුමේ සිටින සාමාජිකයන් අතුරින් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන ප්‍රධාන වෙළඳපොළ, චීනය වන අතර, චීනය සඳහා කරන ලද අපනයන ගිවිසුම යටතේ සිදු කරන ලද මුළු අපනයනවලින් සියයට 75 ක් පමණ විය. තවද, 2014 වසර තුළදී සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුමට (SATIS) අයත් සාමාජික රටවල් විසින් ගිවිසුමේ බැඳීම් පිළිබඳ උපලේඛන සම්පූර්ණ කිරීමේ කටයුතුවල නිරත වූ අතර, බංගලාදේශය, භූතානය, ඉන්දියාව සහ නේපාලය තම අනුමත කළ අවසාන අර්පණ ලැයිස්තු භාර දී ඇත. මේ අතර, ශ්‍රී ලංකාව ගිවිසුමේ බැඳීම් පිළිබඳව උපලේඛනය විමර්ශනය කරමින් සිටී.

**විදේශ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ආයතනික සහය 2014 වසර තුළ දී තවදුරටත් වර්ධනය විය.** 2015-2020 සඳහා ජාතික අපනයන උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේ වගකීම පැවරී ඇති අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් සැපයුම් දාම ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ හා භාණ්ඩ විවිධාංගීකරණය කිරීම සහ එකතු කළ අගය සහිත අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වෙළඳපොළ ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් යුරෝපා කලාපය, ඇමෙරිකා එක්සත් ජනපදය, ආසියාව, මැද පෙරදිග සහ අප්‍රිකාව ආවරණය වන පරිදි පැවැත් වූ අතර, වෙළඳපොළ පර්යේෂණ වැඩසටහන් බ්‍රසීලය, දකුණු අප්‍රිකාව සහ චීනය වෙත යොමු විය. තවද, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 'Ceylon Cinnamon' යන වෙළඳ නාමය ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, කොලොම්බියාව සහ පේරු යන ප්‍රධාන වෙළඳපොළවල මෙන්ම ලෝක බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ද (WIPO) ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලදී. අපනයන සඳහා තවදුරටත් පහසුකම් සලසමින් ශ්‍රී ලංකා රේගුව විසින් බැංකු පහසුකම්, නිරෝධායන පහසුකම්, තත්ත්ව සහතික නිකුත් කිරීම යනාදිය පරිගණක පද්ධතියක් මගින් ඍජුවම සිදු කරගත හැකි වන පරිදි සියලු පහසුකම් සේවා සඳහා එක් ස්ථානයක් (one-stop service centre) හඳුන්වා දීමට යෝජනා කර ඇති අතර, එහි ආනයන අපනයන ගනුදෙනු සඳහා මාර්ගගත ගෙවීම් ක්‍රමයක් ද ඇතුළත් වේ. ඕනෑම වාණිජමය හා දේශපාලනික අවදානමකට එරෙහිව අපනයනකරුවන්ට අවශ්‍ය රක්ෂණ ආවරණ ලබා දීම සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) අඛණ්ඩව කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ දෙවර්ගය සඳහාම 2014 වසර තුළ දී ලබාදෙන ලද රක්ෂණ ආවරණවල වටිනාකමෙහි සියයට 21.0 ක ඉහළ වර්ධනයක් දක්නට ලැබුණි. අපනයන ප්‍රවර්ධනය සඳහා

රාජ්‍ය නොවන අංශයේ සහභාගිත්වය ඉහළ යාම පිළිබිඹු කරමින්, ඒකාබද්ධ ඇඟලුම් සංගමය (JAAF) විසින් රෙදිපිළි හා ඇඟලුම් අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ඒකාබද්ධ ඇඟලුම් සංගමය, යෝජිත චීන-ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම යටතේ වූ කතිකාවත් සඳහා මෙන්ම ජපානය සමග වරණීය වෙළඳ ගිවිසුමකට එළඹීමේ හැකියාව පිළබඳව සාකච්ඡාවලට ද සක්‍රීයව සහභාගි විය. ඒකාබද්ධ ඇඟලුම් සංගමය විසින් වසර තුළදී බ්‍රසීලයට වෙළඳ නියෝජිත මණ්ඩලයක් යැවීම සංවිධානය කළ අතර විශේෂයෙන්ම, චීනය, තායිලන්තය, ඉන්දුනීසියාව වැනි රටවල 'ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ඇඟලුම්' යන සංකල්පය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. ඒකාබද්ධ ඇඟලුම් සංගමය විසින් ශ්‍රී ලංකාවේ අපනයන සැකසුම් කලාප තුළ පිහිටා තිබෙන ඇඟලුම් කර්මාන්තශාලාවල අපනයනවලට අදාළ ලේඛන සැකසීම සඳහා ඉලෙක්ට්‍රොනික පද්ධතියක් හඳුන්වා දෙන ලදී. අතිශය තරගකාරී ඇඟලුම් කර්මාන්තය තුළ ඉතා වැදගත් වන්නා වූ ගනුදෙනු කාලය හා ගනුදෙනු පිරිවැය අඩු කර ගැනීම සඳහා කර්මාන්තශාලාවලට මෙමගින් හැකි වනු ඇත. මේ අතර, ලංකා වාණිජ මණ්ඩලය විසින් ද 2014 වසරේ දී ජාත්‍යන්තර වෙළඳාම සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා ඕමානය, සිංගප්පූරුව, ඉන්දුනීසියාව, ජපානය, මාලදිවයින, චීනය සහ ජර්මනිය වැනි රටවලට ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ දූත මණ්ඩල පිටත් කර යැවීම වැනි වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී.

**අපනයන කෙරෙහි යොමු වූ කර්මාන්තයන්හි ආයෝජන දිරිගැන්වීම සඳහා 2014 වසර තුළ දී ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී.** මැණික් හා ස්වර්ණාභරණ සහ කරවල වැනි තෝරාගත් නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීම සඳහා ආර්ථික කලාප කිහිපයක් පිහිටුවීමට යෝජනා කර ඇත. 2014 අයවැය මගින් යෝජනා කරන ලද පර්යේෂණ හා සංවර්ධන, නවෝත්පාදන සහ සන්නාම ප්‍රවර්ධනය සඳහා වන සියයට 300 ක බදු දීමනාව පර්යේෂණ සහ සංවර්ධන කටයුතු දිරිමත් කිරීම සඳහා තවදුරටත් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදී. අපනයන දිරිමත් කිරීමේ අරමුණින්, අපනයන භාණ්ඩ නිෂ්පාදනය කරන්නන් සඳහා අදාළ වන ආදායම් බදු අඩු කරන ලද අතර, ආයෝජන දිරිමත් කිරීම සඳහා දියුණු මට්ටමේ යන්ත්‍රෝපකරණ සඳහා වන ක්ෂය වෙන්කිරීම් වැඩි කිරීමට ද අවසර දෙන ලදී.

**ජාතික සංවර්ධන රාමුව තුළ විදේශ වෙළඳාම ප්‍රවර්ධනය ඒකාබද්ධ කිරීම ඉහළ නැංවීම සඳහා, 2014 වසරේ දී වෙළඳ හා තීරු බදු ප්‍රතිපත්තිය ලිහිල් කරන ලදී.** ඉහළ එකතු කළ අගයක් සහිත භාණ්ඩ සහ ඉහළ තාක්ෂණික නිෂ්පාදිත අපනයනය කරන රටක් බවට පරිවර්තනය වීමට ඇති කාලීන අවශ්‍යතාවය තේරුම් ගනිමින් තේ, රබර්, පොල්, කුරුඳු සහ අනෙකුත් කුළුබඩු ප්‍රාථමික මට්ටමෙන් අපනයනය කිරීමේදී පනවා තිබූ ඉහළ සෙස් බද්ද තවදුරටත් පවත්වා ගෙන යන ලදී. තවද, තේ අපනයන මත අය කරන සෙස් බදුවලින් සියයට 50 ක් 'Ceylon Tea' ප්‍රචලිත කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳපොළවල පවත්වන ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට ද යෝජිතය. කුඩා තේ වතු හිමියන්ගේ තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමට මූල්‍ය පහසුකම් ලබාදීමට ද නව වගාවන් සහ නැවත වගාවන් සඳහා වන සහනාධාර ඉහළ නැංවීමට ද යෝජිතය. ජාත්‍යන්තර වෙළඳපොළවල් සහ ප්‍රදර්ශනවලදී අපනයනකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදිත ප්‍රදර්ශනය කිරීමට වැඩි ඉඩකඩක් ලබා දෙමින් ව්‍යාපාර කටයුතු සඳහා පිටරටට රැගෙන යන නියැදීන් සඳහා වන එකතු කළ අගය මත වන බදු නිදහස් කිරීම සඳහා දැනට පවතින උපරිම සීමාව තවදුරටත් ඉහළ නංවන ලදී. තවද, අපනයන වෙළඳපොළ වෙත ස්වර්ණාභරණ නිපදවීමේදී යෙදවුමක් ලෙස යොදාගන්නා රත්‍රන් ආනයනය සඳහා තීරු බදු සහන ලබා දෙමින් ස්වර්ණාභරණ අපනයනය දිරිමත් කරන ලදී.

**ආනයන තාර්කීකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී.** පොල් කර්මාන්තය දිරිමත් කිරීමේ අරමුණින් යුතුව ආහාරයට ගන්නා තෙල් වර්ග, පොල් තෙල් සහ පාම් තෙල් ආනයනය මත 2013 වසරේ දී පැනවූ ඉහළ බදු 2014 වසරේදී ද පවත්වා ගෙන යන ලදී. දේශීය රබර් නිෂ්පාදනය දිරිමත් කිරීමේ අරමුණින් යුතුව රබර් කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 350 ක සහතික මිලක් ක්‍රියාත්මක කරන ලද අතර රබර් ආනයන සඳහා වන සෙස් බද්ද රබර් කිලෝ ග්‍රෑමයකට රුපියල් 10 කින් වැඩි කරන ලදී. දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මෑත කාලයේ දී ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී. 2014 වසරේ දී කිරි පිටි, බටර්, යෝගට් සහ අනෙකුත් කිරි නිෂ්පාදන ආනයනය මත වූ ඉහළ සෙස් බද්ද තවදුරටත් පවත්වා ගනිමින් දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ ප්‍රතිපත්තිය ශක්තිමත් කරන ලදී. තවද, දියර කිරි ලීටරයක් සඳහා වූ සහතික මිල රුපියල් 70 ක් දක්වා රුපියල් 10 කින් වැඩිකිරීමට යෝජනා කරන ලද අතර දේශීය කිරි නිෂ්පාදනය සහ දේශීය කිරි නිෂ්පාදිත පරිභෝජනය දිරිමත් කිරීම සඳහා දේශීය කිරි නිෂ්පාදිත මිල ගණන් අඩු කරන ලදී. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් කිරි නිෂ්පාදිත සඳහා වන ආනයන වියදම අඩු කර ගැනීමටත්, කිරි ගව පාලන අංශයෙහි රැකියා අවස්ථා වැඩි වශයෙන් ලබාදීමටත් අපේක්ෂා කෙරේ. බලශක්තිය ඉතිරි කරන මෝටර් රථ භාවිතය දිරිමත් කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික මෝටර් රථ සඳහා

වන ආනයන තීරු බදු අඩු කළ අතර, රථ වාහන ආනයනය සඳහා වන බදු ව්‍යුහය සරල කරමින් බදු වර්ග කිහිපයක් පැනවීම වෙනුවට නිෂ්පාදන බද්ද පනවන ලදී. තවද, 2015 වසරේ දී සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,000 ට අඩු මෝටර් රථ සඳහා වන ආනයන බදු අඩු කළ අතර, දෙමුහුන් වාහන සඳහා වන නිෂ්පාදන බදු ඉහළ නංවන ලදී.

**2014 වසර තුළදීත් ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානයේ (WTO) බහු පාර්ශ්වීය ක්‍රියාමාර්ගයන් සඳහා සහභාගි විය.** බාලි පැකේජය ලෙස හඳුන්වන 2013 දෙසැම්බර් මාසයේ දී බාලිහි පැවැත් වූ 9 වන අමාත්‍ය මණ්ඩල සම්මන්ත්‍රණයේ දී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා, ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයන් විසින් ආරම්භ කරන ලදී. 2008 වසරේ සිට දෝහා සාකච්ඡා වටයේ සැලකිය යුතු වැඩිදියුණුවක් සිදු නොවුණු බැවින් වෙළඳාම සඳහා පහසුකම් සැපයීම, කෘෂිකර්මාන්තය සහ දියුණු වන රටවල පවත්නා ගැටලු ඇතුළත් සීමිත කාරණා කිහිපයක් සම්බන්ධයෙන් බාලි පැකේජය ක්‍රියාත්මක කිරීමට සාමාජික රටවල් එකඟ විය. වසර තුළ දී, අවධානයට ලක් වූ මූලික ක්ෂේත්‍රය වූයේ වසර 10 ක් පුරා සාකච්ඡාවට ලක් වූ වෙළඳාම සඳහා පහසුකම් සැපයීම සඳහා වන ගිවිසුමය. ඒ අනුව, 2014 වසර තුළ දී ශ්‍රී ලංකාව ඇතුළු සාමාජික රටවල් වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සඳහා වන ගිවිසුම පිළිබඳව නීතිමය විමර්ශනයක් පැවැත් වූ අතර, සාමාජික රටවල් විසින් වහාම ක්‍රියාත්මක කළ හැකි විධානයන් පිළිබඳව දැනුම් දීම් සිදු කරන ලදී. තවද, ලෝක වෙළඳ ගිවිසුමෙහි සංශෝධන සඳහා පෙරාතු ලේඛනය පිළියෙළ කර අවසාන කරන ලදී. ඉතා සුපරික්ෂාකාරී ලෙස උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව, 2014 වසරේ නොවැම්බර් මාසයේ දී සම්මත කරන ලද පෙරාතු ලේඛනයෙහි සඳහන් කරුණු සඳහා සාමාජික රටවල් එකඟතාවයකට එළඹි අතර, එය දැනට ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයින්ට පිළිගැනීම සඳහා විවෘතව පවතී. බාලි පැකේජය යටතේ වූ අනෙකුත් ක්ෂේත්‍ර වන ආහාර සුරක්ෂිතතාවය සඳහා රාජ්‍ය අංශයන්හි තොග පවත්වා ගැනීම කෙරෙහි කෘෂිකාර්මික අංශයේ පවතින නැම්යාව, තීරු බදු සලාක පරිපාලනය හා අපනයන තරගකාරිත්වය සහ දියුණු වෙමින් පවතින රටවල හා ඌන සංවර්ධිත රටවල පවතින ගැටලු යනාදිය පිළිබඳව සාකච්ඡා ද ආරම්භ කෙරුණි.

**විදේශ වෙළඳාම මත ඇතිවන ගෝලීය සහ දේශීය අභියෝග හේතුවෙන් රටට පැහැදිලි සහ පූර්වෝපායික වෙළඳ ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පෙන්නුම් කෙරේ.** ඉහළ ඒක පුද්ගල ආදායමක් ළඟා කරගැනීමත් සමඟ ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත්වෙන විට බොහෝ වෙළඳපොළවල් වෙත සහනදායී කොන්දේසි යටතේ ප්‍රවේශ වීමට ඇති හැකියාව සීමා වනු ඇත. අපනයනකරුවන් හට ඉහළ ගෝලීය තරගකාරිත්වය හමුවේ නැගී සිටීමට සහ නව වෙළඳපොළ හා නව තාක්ෂණය වෙත ප්‍රවේශ වීමට හැකි වන පරිදි ආයතනික සහය අඛණ්ඩව ලබාදිය යුතු වේ. එමනිසා, ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන දිරිගැන්වීම, අන්තර්ජාතික වෙළඳපොළෙහි තරගකාරිත්වයක් ඇති කිරීම සඳහා නිෂ්පාදන වියදම අඩු කිරීම, එක් වෙළඳපොළකට සීමා වීමෙන් ඇති වන වෙළඳපොළ අවදානම අඩු කිරීම සඳහා නිෂ්පාදන සහ වෙළඳපොළ විවිධාංගීකරණය කිරීම සහ නියමිත කාලය තුළදී වෙළඳපොළ වෙත නිෂ්පාදිත සැපයීම සඳහා වෙළඳාම සම්පූර්ණ කිරීමට ගතවන කාලසීමාව අඩු කිරීම සඳහා අභ්‍යන්තර පද්ධතීන් සහ ක්‍රියාපටිපාටීන් වැඩිදියුණු කිරීම යනාදිය වෙත විදේශීය වෙළඳ ප්‍රතිපත්තිය තවදුරටත් යොමු විය යුතුය. තවද, ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳපළ කිහිපයක පවතින භූ-දේශපාලනික ගැටලු ශ්‍රී ලංකාවේ අපනයන අංශයට අභියෝගයක් වී ඇති බැවින් අනෙකුත් වෙළඳපොළ වෙත පිවිසීම සඳහා කාලීනව ක්‍රමෝපායයන් ගැනීම අවශ්‍ය වේ.

## 5.3 භාණ්ඩ වෙළඳාම, වෙළඳ ශේෂය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව

### 5.3.1 අපනයන ක්‍රියාකාරිත්වය

**ස්ථායී දේශීය සාර්ව ආර්ථික වාතාවරණය සමඟ විදේශීය ඉල්ලුම ඉහළ යෑම, 2014 වසරේ දී දේශීය කර්මාන්තවලට ඉහළ අපනයන ක්‍රියාකාරිත්වයක් ළඟාකර ගැනීම සඳහා උපකාරී විය.** මේ අනුව, අපනයන ආදායම 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 10,394 ට සාපේක්ෂව 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 11,130 ක් දක්වා සියයට 7.1 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා ප්‍රධාන අපනයන කාණ්ඩ සියල්ලක්ම දායක විය.

**මුළු අපනයනයෙන් සියයට 75 ක් පමණ වන කාර්මික අපනයන, 2014 වසරේ අපනයන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.** 2014 වසරේ කාර්මික අපනයන ආදායම පෙර වසර හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 8,262 ක් දක්වා සියයට 6.6 කින් වර්ධනය වූ අතර, රෙදිපිළි හා ඇඟලුම් අපනයනවල සැලකිය යුතු වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මුළු අපනයන වර්ධනය සඳහා සියයට 50 කට වැඩි ප්‍රමාණයකින් දායක වෙමින්, රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 4,930 ක් දක්වා සියයට 9.4 කින් වර්ධනය විය. යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කළ ඇඟලුම් අපනයන පිළිවෙළින් සියයට 10.6 කින් සහ සියයට 8.8 කින් වර්ධනය වූ අතර, සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත කළ ඇඟලුම් අපනයන, 2013 වසරේ දී වාර්තා කළ සියයට 8.9 වර්ධනය

සමඟ සැසඳීමේ දී 2014 වසරේ දී සියයට 10.5 කින් වර්ධනය විය. සාම්ප්‍රදායික නොවන වෙළඳපොළවල් වෙත අපනයන ව්‍යාප්ත කිරීමට බලධාරීන් සහ කර්මාන්තකරුවන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග එම වෙළඳපොළවල් වෙත කළ අපනයනවල ඉහළ වර්ධනය සඳහා උපකාරී විය. ප්‍රධාන වශයෙන් බටහිර වෙළඳපොළවල් වෙත කළ පාවහන් අපනයන ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන්, 2014 වසර තුළ දී සම් භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 139 ක් දක්වා සියයට 80.8 කින් වර්ධනය විය. ශ්‍රී ලංකාවේ පාවහන් අපනයනකරුවන් සුප්‍රකට ජාත්‍යන්තර සන්නාමයන් අතර විලාසිතා පාවහන් සැපයුම්කරුවන් ලෙස කීර්තිනාමයක් අත්පත් කර ගෙන තිබේ. 2014 වසර තුළ දී, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ද සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් නැව් සහ ගුවන්යානා සඳහා භාවිතා කරන ඉන්ධන අන්තර්ගත වූ ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම, ඉන්දියාව සහ සිංගප්පූරුව වැනි ප්‍රධාන කලාපීය වෙළඳුන්ගේ ඉහළ තරගකාරිත්වය මධ්‍යයේ එ.ජ. ඩොලර් මිලියන 338 ක් දක්වා සියයට 21.0 කින් අඩු විය. තව ද, නැව් සඳහා භාවිතා කරන ඉන්ධන අපනයනය කිරීමේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාව අඩු තරගකාරිත්වයක් පෙන්නුම් කරන අතර, කලාපීය වෙළඳපොළවලින් ආනයනය කරන ඉන්ධන මත විශාල වශයෙන් රඳා පැවතීම සහ තෙල් ගබඩා පහසුකම් සීමිත වීම හේතුවෙන් ඒකක පිරිවැය වැඩි වීම මේ සඳහා හේතු විය. මැණික් හා ස්වර්ණාභරණ අපනයනයන්ගේ වර්ධනය අඛණ්ඩව පැවති අතර, ප්‍රධාන දියමන්ති අපනයනකරුවෙකුගේ මෙහෙයුම් කටයුතු නතර වීම හේතුවෙන් වසර තුළ දී දියමන්ති අපනයනය සියයට 32.8 කින් අඩු විය.

**මුළු අපනයන ආදායම සඳහා ආසන්න වශයෙන් හතරෙන් එකක පමණ දායකත්වයක් සපයන කෘෂිකාර්මික අපනයන වසර තුළ දී තවදුරටත් වර්ධනය විය.** 2014 වසර තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 2,794 ක් දක්වා සියයට 8.2 කින් වර්ධනය වූ අතර, මේ සඳහා පොල් නිෂ්පාදිත, තේ සහ ඇතැම් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයනවල සිදු වූ වර්ධනය හේතු විය. පෙර වසරේ පැවති යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් කපාපු පොල් සහ පොල් තෙල් වැනි පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයනයන්හි ඉහළ ක්‍රියාකාරිත්වයක් පැවතීම, 2014 වසරේ දී පොල් නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 356 ක් දක්වා සියයට 74.2 කින් වර්ධනය වීමට හේතු විය. මුළු අපනයනවලින් සියයට 15 ක් පමණ වන තේ අපනයන ආදායම, 2013 වසරේ දී වාර්තා වූ සියයට 9.2 ක වර්ධනයට සාපේක්ෂව 2014 වසරේ දී සියයට 5.6 කින් වර්ධනය විය. තේ අපනයන වර්ධනය මන්දගාමී වීම තුළින් මුළු තේ අපනයනයෙන් සියයට 59 ක් පමණ මිලදී ගන්නා රුසියාව සහ මැද පෙරදිග වැනි ප්‍රධාන අපනයන වෙළඳපොළවලින් වූ ඉල්ලුමෙහි අඩු වීම පිළිබිඹු වේ. ඉන්ධන මිල ගණන් අඩු වීම හේතුවෙන් මෙම රටවල ආදායම විශාල ලෙස පහත වැටුණු අතර, භූ-දේශපාලනික ගැටලු හේතුවෙන් ඇති වූ ආර්ථික සම්බාධක මධ්‍යයේ රුසියානු රූබලය විශාල වශයෙන් අවප්‍රමාණය විය. කෙසේ වුවද, ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර වෙළඳපොළෙහි විශාල ඉල්ලුමක් පවතින ඉහළ ගුණාත්මක බවකින් යුත් සාම්ප්‍රදායික තේ සැපයූ බැවින් ශ්‍රී ලංකා තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල එ.ජ. ඩොලර් 4.97 ක් දක්වා 2013 වසරට සාපේක්ෂව සියයට 3.1 කින් වර්ධනය වූ අතර, එය තේ කිලෝ ග්‍රෑමයක ජාත්‍යන්තර සාමාන්‍ය මිල වූ එ.ජ. ඩොලර් 2.72 සමඟ සැසඳීමේ දී ඉහළ අගයක් විය. පුවක් සහ පළතුරු අපනයන පිළිවෙළින් සියයට 300.5 කින් සහ සියයට 51.7 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීම හේතුවෙන්, සුළු කෘෂිකාර්මික අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 165 ක් දක්වා සියයට 63.1 කින් වර්ධනය විය. මෙම වසර තුළ දී කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති මුහුදු ආහාර සහ එළවළු අපනයනයේ ද යහපත් ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණි. කෙසේ වුවද, 2013 වසරේ දී විශිෂ්ට ක්‍රියාකාරිත්වයක් පෙන් වූ කුළුබඩු අපනයනවල වර්ධනය 2014 වසරේ දී මන්දගාමී විය. කුළුබඩු අපනයන ආදායම 2013 වසරේ දී පැවති සියයට 38.8 ක වර්ධනය සමඟ සැසඳීමේ දී 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 265 ක් දක්වා සියයට 25.6 කින් අඩු විය. 2014 වසරේ දී කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි, වසාවාසි හා සාදික්කා වැනි ප්‍රධාන අපනයන භෝගවල අස්වැන්න 2013 වසරේ පැවති ඉහළ අස්වැන්නට

**5.1 රූප සටහන**

**භාණ්ඩ අනුව අපනයන - 2014**



**5.2 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය**

| කාණ්ඩය | 2013 | | 2014 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ.ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස් වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,581.1** | **24.8** | **2,793.9** | **25.1** | **212.8** | **8.2** | **28.9** |
| තේ | 1,542.2 | 14.8 | 1,628.3 | 14.6 | 86.1 | 5.6 | 11.7 |
| රබර් | 71.3 | 0.7 | 45.3 | 0.4 | -26.0 | -36.5 | -3.5 |
| පොල් | 204.6 | 2.0 | 356.4 | 3.2 | 151.7 | 74.2 | 20.6 |
| කුළු බඩු | 355.4 | 3.4 | 264.6 | 2.4 | -90.9 | -25.6 | -12.3 |
| එළවළු | 24.9 | 0.2 | 40.1 | 0.4 | 15.2 | 60.9 | 2.1 |
| සකස් නොකළ දුම්කොළ | 47.6 | 0.5 | 41.3 | 0.4 | -6.3 | -13.2 | -0.9 |
| සුළු කෘෂිකාර්මික අපනයන | 101.3 | 1.0 | 165.2 | 1.5 | 63.9 | 63.1 | 8.7 |
| මුහුදු ආහාර | 233.7 | 2.2 | 252.7 | 2.3 | 19.0 | 8.1 | 2.6 |
| **කාර්මික අපනයන** | **7,749.4** | **74.6** | **8,262.0** | **74.2** | **512.6** | **6.6** | **69.7** |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,508.3 | 43.4 | 4,929.9 | 44.3 | 421.6 | 9.4 | 57.3 |
| රබර් නිෂ්පාදිත | 887.8 | 8.5 | 889.8 | 8.0 | 2.0 | 0.2 | 0.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 427.7 | 4.1 | 338.0 | 3.0 | -89.8 | -21.0 | -12.2 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 445.5 | 4.3 | 393.6 | 3.5 | -51.9 | -11.7 | -7.1 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 235.2 | 2.3 | 289.3 | 2.6 | 54.0 | 23.0 | 7.3 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 312.3 | 3.0 | 342.9 | 3.1 | 30.7 | 9.8 | 4.2 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 36.3 | 0.3 | 52.4 | 0.5 | 16.1 | 44.5 | 2.2 |
| ප්‍රවාහන උපකරණ | 146.3 | 1.4 | 151.8 | 1.4 | 5.4 | 3.7 | 0.7 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 76.8 | 0.7 | 138.9 | 1.2 | 62.1 | 80.8 | 8.4 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 40.4 | 0.4 | 41.3 | 0.4 | 0.9 | 2.2 | 0.1 |
| අනෙකුත් කාර්මික අපනයන | 632.7 | 6.1 | 694.1 | 6.2 | 61.5 | 9.7 | 8.4 |
| **ඛනිජ අපනයන** | **51.6** | **0.5** | **59.5** | **0.5** | **7.9** | **15.3** | **1.1** |
| **වර්ග නොකළ අපනයන** | **12.2** | **0.1** | **14.7** | **0.1** | **2.5** | **20.7** | **0.3** |
| **මුළු අපනයන (ආ) (ඇ)** | **10,394.3** | **100.0** | **11,130.1** | **100.0** | **735.8** | **7.1** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඈ)** | **129.11** | | **130.56** | | | | |

(අ) තාවකාලික
(ආ) ගලපන ලද
(ඇ) ප්‍රති අපනයන ඇතුළත් නොවේ
(ඈ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සාපේක්ෂව අඩු වීම, කුළුබඩු අපනයන ආදායම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, රබර් මිල ගණන් සහ පරිමාවෙහි අඩු වීමක් පිළිබිඹු කරමින් රබර් අපනයන ආදායම ද එ.ජ. ඩොලර් මිලියන 45 ක් දක්වා සියයට 36.5 කින් අඩු විය. චීනය, ඉන්දියාව වැනි ප්‍රධාන රබර් පරිභෝජනය කරන ආර්ථිකයන් වෙතින් ස්වභාවික රබර් සඳහා වූ ඉල්ලුම අඩු වීම සහ ගෝලීය රබර් සැපයුම ඉහළ යෑම හේතුවෙන් පසුගිය වසර හතර මුළුල්ලෙහිම ජාත්‍යන්තර වෙළඳපොළෙහි රබර් මිල ගණන් අඩු විය. පාෂාණ හා ගල් වර්ග, ලෝ පස්, ලෝහ, බොර හා අළු සහ වටිනා ලෝහ ඇතුළත් ඛනිජමය අපනයන 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 59 ක් දක්වා සියයට 15.3 කින් වර්ධනය විය.

**ශ්‍රී ලංකාවේ අපනයන සඳහා දේශීය වශයෙන් මෙන්ම විදේශීය අංශයෙන් ද බොහෝ අභියෝග එල්ල විය.** ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර අපනයනවලින් සියයට 40 ක පමණ දායකත්වය ලබා දෙන එම නිෂ්පාදිත සඳහා ප්‍රධාන වෙළඳපොළ වූ යුරෝපා සංගමය වෙත සිදු කරන අපනයන සඳහා 2015 ජනවාරි මාසයේ මැද භාගයේ සිට බලපැවැත්වෙන පරිදි සීමා පැනවීම, මුහුදු ආහාර අපනයනකරුවන් හට විශාල අභියෝගයක් වී ඇත. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් රජය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදුකෙරෙමින් පවතින බැවින් 2015 වසර තුළදී මෙම ගැටලුව විසඳෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, රුසියාව, ශ්‍රී ලංකා තේ සඳහා ප්‍රධානතම ගැනුම්කරු වන බැවින් 2015 වසර තුළ දී රුසියානු රූබලය තවදුරටත් අඛණ්ඩව අවප්‍රමාණය වුවහොත් එය ශ්‍රී ලංකාවේ තේ අපනයන සඳහා අහිතකර ලෙස බලපානු ඇත. එසේම, ශ්‍රී ලංකා තේ සඳහා මැද පෙරදිග වෙළඳපොළෙන් ඇති ඉල්ලුම ද අඩු විය හැකි අතර, මෙම ආර්ථිකයන්හි ඉන්ධන ආදායම අඛණ්ඩව අඩු වීම මෙයට හේතු වේ. තවද, යුරෝපීය වෙළඳපොළට විශේෂයෙන්ම රෙදිපිළි හා ඇඟලුම් සඳහා සහනදායී පදනම මත ප්‍රවේශය ලබාදෙන විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යළි ලබා ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, මෙම සහනදායී වෙළඳපොළ ප්‍රවේශ අවස්ථාවන්ට අමතරව, ඉහළ වටිනාකමකින් යුත් භාණ්ඩ නිපදවීම,

කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය දේශීය වශයෙන් නිපදවීම, ඵලදායීතාවය ඉහළ නැංවීම සහ තාක්ෂණික නවෝත්පාදනය ද තියුණු තරගකාරිත්වයට මුහුණ දීමට අත්‍යවශ්‍ය වේ. තවද, රෙදිපිළි හා ඇඟලුම්, තේ සහ රබර් නිෂ්පාදිතවල ප්‍රභේදනයන් මෑත වසරවල දී සැලකිය යුතු ලෙස වර්ධනය වුව ද, ශ්‍රී ලංකාවේ අපනයන ආදායමෙන් තුනෙන් දෙකකට පමණ දායකත්වය සපයන මෙම නිෂ්පාදිත මත වන රැඳියාව හේතුවෙන් අපනයන නිෂ්පාදන සංකේන්ද්‍රණය වීම ප්‍රධාන ගැටලුවක් වී තිබේ.

### 5.3.2 ආනයන ක්‍රියාකාරිත්වය

**2012 සහ 2013 වසර දෙකෙහිදීම පහත වැටුණු ආනයන වියදම 2014 වසරේ දී මධ්‍යස්ථ ලෙස වර්ධනය විය.** 2014 වසරේ දෙවන භාගයේ දී ආනයන වර්ධනය ඉහළ මට්ටමක පැවති අතර, ප්‍රධාන වශයෙන් ආනයන බදු අඩු වීම සහ ජපාන යෙන් අගය විශාල ලෙස අවප්‍රමාණය වීම නිසා පෞද්ගලික භාවිතය සඳහා වූ රථ වාහන ආනයන ඉහළ යෑම මේ සඳහා හේතු විය. මේ අනුව, 2013 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 18,003 ක් වූ ආනයන වියදම 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 19,417 ක් දක්වා සියයට 7.9 කින් වර්ධනය විය. මේ අතර, 2014 වසර තුළ දී ඉන්ධන හැර අනෙකුත් ආනයන සඳහා වූ වියදම එ.ජ. ඩොලර් මිලියන 14,819 ක් දක්වා සියයට 8.2 කින් වර්ධනය විය. 2014 වසරේ දී මුළු ආනයනවලින් ප්‍රතිශතයක් ලෙස පාරිභෝගික භාණ්ඩ ආනයනය 2013 වසරේදී වූ ප්‍රවණතාවයම පෙන්නුම් කරමින් වැඩි වූ අතර, ආයෝජන භාණ්ඩ ප්‍රතිශතය අඩු විය. කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ ආනයන ප්‍රතිශතය වර්ධනය වීම තුළින් ඉහළ ආදායම් මට්ටම් සමග ජනතාවගේ ජීවන තත්ත්වයන් උසස් වීම පිළිබිඹු කෙරේ. කෙසේ වුවද, ආයෝජන භාණ්ඩ ආනයන ප්‍රතිශතය පහත වැටීම තුළින් අනාගත වර්ධන අපේක්ෂාවන් මන්දගාමී විය හැකි බැවින් එය අවධානම හඟවන සාධකයක් වේ.

**ආනයන වියදමෙහි වර්ධනය සඳහා ප්‍රධානතම දායකත්වය අන්තර් භාණ්ඩ මගින් ලැබුණු අතර, මේ සඳහා ඛනිජ තෙල් නිෂ්පාදිත සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.** මුළු ආනයනයන්ගෙන් සියයට 60 ක් පමණ වන අන්තර් භාණ්ඩ ආනයන වියදම, 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 11,398 ක් දක්වා 2013 වසරට සාපේක්ෂව සියයට 8.0 කින් වර්ධනය විය. වසරේ දෙවන භාගයේ දී ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිල ගණන් සැලකිය යුතු මට්ටමකින් අඩු වුවද, ප්‍රධාන වශයෙන් තාප විදුලිබල උත්පාදනය ඉහළ යෑමත් සමග ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් 2014 වසරේ දී ඉන්ධන ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,597 ක් දක්වා සියයට 6.7 කින් වර්ධනය විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කළ බොර තෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල 2013 වසරේ දී එ.ජ. ඩොලර් 109.84 ක් වූ අතර, 2014 වසරේ දී එය එ.ජ. ඩොලර් 104.53 ක් දක්වා අඩු විය. කෙසේ වුවද, 2014 වසරේ අවසාන කාලයේ දී බොර තෙල් ආනයන මිල, වසරෙහි සාමාන්‍ය මිල මට්ටමට වඩා ඉතා පහළ අගයක පැවතුණි. මේ අතර, වසර තුළ රෙදිපිළි හා ඇඟලුම් අපනයනවල වර්ධනයට සමගාමීව නූල්, රෙදි සහ රෙදි විවීමට ගන්නා කෙඳි වර්ග ආදි රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 2,328 ක් දක්වා සියයට 13.8 කින් වර්ධනය විය. 2014 වසර තුළ දී කඩදාසි හා සන කඩදාසි, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, තිරිඟු හා ඉරිඟු, රසායනික නිෂ්පාදිත සහ පොහොර සඳහා වූ ආනයන වියදම් ද වර්ධනය විය. මේ අතර, ස්වර්ණාභරණ කර්මාන්තයේ දී අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන දියමන්ති, වටිනා ගල් හා ලෝහ ආනයනයන්හි සියයට 17.8 ක පහළ යෑමක් 2013 වසරේ දී වාර්තා වූ අතර, 2014 වසරේ දී එය තවදුරටත් සියයට 63.7 කින් අඩු විය. ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකාවේ දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයනය කරන ප්‍රධාන ආයතනයක ක්‍රියාකාරිත්වය නතර වීම හේතු විය. තවද, බැංකු මගින් දේශීය කර්මාන්ත වෙත රත්‍රන් අලෙවි කිරීම වර්ධනය වීම හේතුවෙන් රත්‍රන් ආනයනය සඳහා වූ ඉල්ලුම ද අඩු විය. විශේෂයෙන්ම, 2014 වසරේ සිව් වන කාර්තුව තුළ පැවති අයහපත් කාලගුණ තත්ත්වය ඉදිකිරීම් කටයුතු සඳහා අහිතකර ලෙස බලපෑම හේතුවෙන් සිමෙන්ති සඳහා වූ ඉල්ලුමෙහි අඩු වීම පිළිබිඹු කරමින්, 2014 වසර තුළ දී සිමෙන්ති ක්ලින්කර ආනයන වියදම සියයට 6.3 කින් අඩු විය.

**5.2 රූප සටහන** **භාණ්ඩ අනුව ආනයන - 2014**



**5.3 සංඛ්‍යා සටහන**

**ආනයන සංයුතිය**

| කාණ්ඩය | 2013 වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | 2013 ආයකත්වය % | 2014 (අ) වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | 2014 (අ) ආයකත්වය % | වටිනාකමේ වෙනස එ.ජ.ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස්වීමට වූ ආයකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **3,182.5** | **17.7** | **3,852.5** | **19.8** | **670.0** | **21.1** | **47.4** |
| ආහාර හා පාන වර්ග | 1,368.1 | 7.6 | 1,633.7 | 8.4 | 265.7 | 19.4 | 18.8 |
| සහල් | 17.9 | 0.1 | 281.7 | 1.5 | 263.8 | 1,473.9 | 18.7 |
| සීනි සහ රසකැවිලි | 290.6 | 1.6 | 257.1 | 1.3 | -33.5 | -11.5 | -2.4 |
| කිරි නිෂ්පාදිත | 291.0 | 1.6 | 339.4 | 1.7 | 48.4 | 16.6 | 3.4 |
| පරිප්පු | 104.1 | 0.6 | 121.2 | 0.6 | 17.1 | 16.4 | 1.2 |
| වෙනත් | 664.4 | 3.7 | 634.4 | 3.3 | -30.0 | -4.5 | -2.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 1,814.4 | 10.1 | 2,218.8 | 11.4 | 404.4 | 22.3 | 28.6 |
| රථවාහන | 582.2 | 3.2 | 896.7 | 4.6 | 314.5 | 54.0 | 22.2 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 378.3 | 2.1 | 380.5 | 2.0 | 2.3 | 0.6 | 0.2 |
| ගෘහ උපකරණ | 192.2 | 1.1 | 156.4 | 0.8 | -35.8 | -18.6 | -2.5 |
| රෙදිපිළි සහ උපාංග | 201.7 | 1.1 | 282.7 | 1.5 | 81.0 | 40.2 | 5.7 |
| වෙනත් | 460.0 | 2.6 | 502.5 | 2.6 | 42.5 | 9.2 | 3.0 |
| **අන්තර් භාණ්ඩ** | **10,553.7** | **58.6** | **11,397.7** | **58.7** | **843.9** | **8.0** | **59.7** |
| ඉන්ධන | 4,308.2 | 23.9 | 4,597.3 | 23.7 | 289.2 | 6.7 | 20.4 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,045.8 | 11.4 | 2,327.6 | 12.0 | 281.7 | 13.8 | 19.9 |
| දියමන්ති සහ අගනා ගල් වර්ග හා ලෝහ | 482.9 | 2.7 | 175.4 | 0.9 | -307.4 | -63.7 | -21.7 |
| රසායනික නිෂ්පාදිත | 734.3 | 4.1 | 808.2 | 4.2 | 73.9 | 10.1 | 5.2 |
| තිරිඟු සහ ඉරිඟු | 323.2 | 1.8 | 404.7 | 2.1 | 81.5 | 25.2 | 5.8 |
| පොහොර | 238.7 | 1.3 | 272.4 | 1.4 | 33.8 | 14.1 | 2.4 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 2,420.8 | 13.4 | 2,812.0 | 14.5 | 391.2 | 16.2 | 27.7 |
| **ආයෝජන භාණ්ඩ** | **4,252.7** | **23.6** | **4,152.2** | **21.4** | **-100.5** | **-2.4** | **-7.1** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,357.2 | 7.5 | 1,308.9 | 6.7 | -48.3 | -3.6 | -3.4 |
| ප්‍රවාහන උපකරණ | 667.8 | 3.7 | 707.3 | 3.6 | 39.5 | 5.9 | 2.8 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 2,221.9 | 12.3 | 2,131.0 | 11.0 | -90.9 | -4.1 | -6.4 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 5.8 | ... | 4.9 | ... | -0.9 | -15.0 | -0.1 |
| **වර්ග නොකළ ආනයන** | **13.9** | **0.1** | **14.4** | **0.1** | **0.6** | **4.1** | **...** |
| **මුළු ආනයන (ආ) (ඇ)** | **18,002.8** | **100.0** | **19,416.8** | **100.0** | **1,414.0** | **7.9** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඈ)** | **129.11** | | **130.56** | | | | |

(අ) තාවකාලික
(ආ) ගලපන ලද
(ඇ) ප්‍රති ආනයන ඇතුළත් නොවේ.
(ඈ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන් : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම
සීමාසහිත සෙරන්ඩිබ් ෆ්ලාර් මිල්ස් පුද්ගලික සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2014 වසරේ දී **ආහාර සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම වර්ධනය වූ අතර, ආනයන පරිමාව ඉහළ යෑම මේ සඳහා මූලික වශයෙන් හේතු විය.** මුළු ආනයනයෙන් සියයට 20 ක් පමණ වූ සමස්ත පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,853 ක් දක්වා සියයට 21.1 කින් වර්ධනය විය. ආහාර හා පාන වර්ග සඳහා වූ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,634 ක් දක්වා සියයට 19.4 කින් වර්ධනය වූ අතර, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 2,219 ක් දක්වා සියයට 22.3 කින් වර්ධනය විය. ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වර්ධනය වීම සඳහා පෞද්ගලික භාවිතය සඳහා වූ රථ වාහන වෙනුවෙන් වූ ඉහළ ආනයන වියදම ප්‍රධාන වශයෙන් දායක විය. රථ වාහන සඳහා වූ ආනයන බදු අඩු කිරීම සහ ජපාන යෙන් අගය විශාල වශයෙන් අවප්‍රමාණය වීම හේතුවෙන් 2014 වසර තුළ දී මෝටර් රථ සහ යතුරු පැදි වැනි පෞද්ගලික භාවිතය සඳහා වූ රථ වාහන ආනයන වියදම සියයට 54.0 කින් වර්ධනය විය. රෙදිපිළි හා උපාංග සහ ජංගම දුරකථන වැනි විදුලි සන්දේශ

**5.4 සංඛ්‍යා සටහන** **ප්‍රධාන ආනයනයන්හි පරිමාවන්**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2010 | 2011 | 2012 | 2013 | 2014 (අ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **126** | **28** | **36** | **23** | **600** |
| පළමු කාර්තුව | 121 | 8 | 15 | 9 | 6 |
| දෙවන කාර්තුව | 2 | 2 | 7 | 6 | 102 |
| තෙවන කාර්තුව | 2 | 9 | 10 | 4 | 145 |
| සිව්වන කාර්තුව | 1 | 9 | 4 | 4 | 348 |
| **තිරිඟු (ආ)** | **1,051** | **1,242** | **1,084** | **895** | **1,179** |
| පළමු කාර්තුව | 352 | 322 | 353 | 197 | 271 |
| දෙවන කාර්තුව | 171 | 455 | 235 | 326 | 324 |
| තෙවන කාර්තුව | 292 | 254 | 291 | 170 | 291 |
| සිව්වන කාර්තුව | 236 | 211 | 205 | 201 | 292 |
| **සීනි** | **548** | **606** | **569** | **548** | **520** |
| පළමු කාර්තුව | 145 | 163 | 158 | 126 | 131 |
| දෙවන කාර්තුව | 145 | 170 | 135 | 175 | 162 |
| තෙවන කාර්තුව | 154 | 124 | 114 | 118 | 152 |
| සිව්වන කාර්තුව | 104 | 149 | 162 | 129 | 75 |
| **බොර තෙල් (ආ)** | **1,819** | **2,070** | **1,486** | **1,743** | **1,824** |
| පළමු කාර්තුව | 332 | 557 | 558 | 482 | 548 |
| දෙවන කාර්තුව | 541 | 555 | 413 | 545 | 365 |
| තෙවන කාර්තුව | 541 | 410 | 137 | 315 | 462 |
| සිව්වන කාර්තුව | 405 | 547 | 379 | 401 | 449 |
| **පිරිපහදු කළ ඛනිජ තෙල් (ආ)** | **2,882** | **3,501** | **3,961** | **2.907** | **3,385** |
| පළමු කාර්තුව | 789 | 702 | 1,036 | 673 | 970 |
| දෙවන කාර්තුව | 881 | 807 | 903 | 756 | 762 |
| තෙවන කාර්තුව | 507 | 1,022 | 997 | 791 | 1,006 |
| සිව්වන කාර්තුව | 705 | 970 | 1,025 | 687 | 647 |
| **පොහොර** | **649** | **801** | **640** | **600** | **765** |
| පළමු කාර්තුව | 88 | 131 | 129 | 61 | 202 |
| දෙවන කාර්තුව | 238 | 207 | 176 | 139 | 190 |
| තෙවන කාර්තුව | 165 | 266 | 226 | 187 | 95 |
| සිව්වන කාර්තුව | 158 | 197 | 108 | 214 | 277 |

(අ) තාවකාලික
(ආ) ගලපන ලද

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම
සීමාසහිත සෙරෙන්ඩිබ් ෆ්ලාර් මිල්ස් පුද්ගලික සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

උපකරණ සඳහා වූ ආනයන වියදම ද වර්ධනය විය. 2014 වසර තුළ දී පැවති අහිතකර කාලගුණ තත්ත්වයන් හේතුවෙන් දේශීය සහල් නිෂ්පාදනය අඩු වූ බැවින්, 2013 වසරේ ආනයනය කළ සහල් මෙට්‍රික් ටොන් විසි තුන් දහසට (එ.ජ. ඩොලර් මිලියන 18 ක වටිනාකමින් යුත්) සාපේක්ෂව 2014 වසරේ දී සහල් මෙට්‍රික් ටොන් හය ලක්ෂය දක්වා (එ.ජ. ඩොලර් මිලියන 282 ක වටිනාකමින් යුත්) සැලකිය යුතු ලෙස සහල් ආනයනය ඉහළ යැම, ආහාර සඳහා වූ ආනයන වියදමෙහි වර්ධනය සඳහා හේතු විය. තවද, දේශීය සහල් මිල ගණන් ඉහළ යැමෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කර ගැනීම අරමුණු කරගනිමින් සහල් ආනයනය සඳහා වූ බදු අඩු කිරීම ද සහල් ආනයනය ඉහළ යැම සඳහා දායක විය. ආනයන මිල ගණන් ඉහළ යැම හේතුවෙන් කිරිපිටි ආනයන වියදම ඉහළ ගිය අතර, දේශීය නිෂ්පාදන පහත වැටීම හේතුවෙන් ආනයනික ආහාර ද්‍රව්‍ය සඳහා වූ ඉල්ලුම වැඩි වීම සහ ඇතැම් ආහාර ද්‍රව්‍ය සඳහා ආනයන බදු අඩු වීම මයිසූර් පරිප්පු සහ ආහාරයට ගත හැකි ඇට වර්ග ආනයන වර්ධනය වීම සඳහා හේතු විය. කෙසේ වුවද, සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ දී, සීනි සහ රසකැවිලි නිෂ්පාදිත, තෙල් හා මේද සහ මුහුදු ආහාර සඳහා වූ ආනයන වියදම අඩු විය.

2014 වසර තුළ දී ප්‍රධාන වශයෙන් **යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන අඩු වීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වියදම සුළු වශයෙන් පහත වැටුණි.** ඒ අනුව, 2014 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 4,152 ක් දක්වා සියයට 2.4 කින් අඩු විය. ඉංජිනේරු උපකරණ, විද්‍යුත් උපකරණ, විදුලි සන්දේශ උපකරණ, කාර්යාලයීය යන්ත්‍ර සූත්‍ර, රෙදිපිළි කර්මාන්තයේ දී භාවිතා කරන යන්ත්‍ර සූත්‍ර සහ යන්ත්‍ර සූත්‍ර උපකරණ කොටස් යනාදියෙන් සමන්විත යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා වූ ආනයන වියදම 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,131 ක් දක්වා සියයට 4.1 කින් පහත වැටුණි. මේ අතර, ඉදිකිරීම් අංශය සඳහා පැවති අහිතකර කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම පිළිබිඹු කරමින් සිමෙන්ති, යකඩ හා වානේ සහ ඛනිජ නිෂ්පාදිත ඇතුළත් වන ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වූ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,309 ක් දක්වා සියයට 3.6 කින් අඩු විය. කෙසේ වුවද, බස්රථ සහ ත්‍රීරෝද රථ ආනයනය ඉහළ යැම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 707 ක් දක්වා සියයට 5.9 කින් වර්ධනය විය.

### 5.3.3 වෙළඳ ශේෂය

2014 වසරේ **පළමු භාගයේදී අඩු වූ වෙළඳ හිඟය දෙවන භාගයේදී ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත වසර සඳහා වූ වෙළඳ හිඟය 2013 වසරට සාපේක්ෂව පුළුල් විය.** 2014 වසරේ පළමු භාගයේ දී අපනයන ආදායම 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 17.0 කින් වර්ධනය වූ අතර, ආනයන වියදම සියයට 1.2 කින් අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස එම කාලය තුළ දී වෙළඳ හිඟය පසුගිය වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සියයට 20.3 කින් පහත වැටුණි. කෙසේ වුවද, 2014 වසරේ දෙවන භාගයේ දී ආනයන ශීඝ්‍ර ලෙස වර්ධනය වීම හා අපනයනවල වර්ධනය මන්දගාමී වීම හේතුවෙන් සමස්ත වසර සඳහා වූ වෙළඳ හිඟය පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 8,287 ක් දක්වා සියයට 8.9 කින් පුළුල් විය. පසුගිය වසර දෙකෙහිම වෙළඳ හිඟයේ

**5.3 රූප සටහන** **අපනයන, ආනයන සහ වෙළඳ ශේෂය**




අඩුවීමක් වාර්තා වීමෙන් පසුව මෙම වසරේ දී මෙම ඉහළ යාම සිදු විය. කෙසේ වුවද, දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය 2013 වසරේ දී පැවති සියයට 11.3 ට සාපේක්ෂව 2014 වසරේ දී සියයට 11.1 ක් දක්වා අඩු විය. 2012 සහ 2013 වසරවල දී දක්නට ලැබුණු වෙළඳ ශේෂයේ යහපත් වර්ධනයන් සඳහා 2012 වසර ආරම්භයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය මගින් ක්‍රියාත්මක කළ විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග විශාල වශයෙන් දායක විය. කෙසේ වුවද, ඉන්ධන මෙන්ම ඉන්ධන නොවන වෙළඳ ද්‍රව්‍ය සඳහා ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් අඩු වීමේ ප්‍රවණතාවය සහ බොහෝ දියුණු හා නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීම මූලිකව අපේක්ෂා කළ මට්ටමට වඩා මන්දගාමීව සිදු වීම සමග කෙටි කාලීනව විදේශීය අංශය වෙත ඇති විය හැකි අහිතකර බලපෑම්වලට පිළියමක් ලෙස යෝග්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

### 5.3.4 වෙළඳ මිල අනුපාතය

අපනයන මිල ගණන් ඉහළ යෑමේ සහ ආනයන මිල ගණන් පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස 2014 වසර තුළ දී වෙළඳ මිල අනුපාතය කැපී පෙනෙන ලෙස වර්ධනය විය. 2014 වසර තුළ දී අපනයන මිල දර්ශකය පෙර වසරට සාපේක්ෂව දර්ශක අංක 105.5 ක් දක්වා සියයට 2.7 කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය දර්ශක අංක 108.1 ක් දක්වා සියයට 1.5 කින් අඩු විය. ඒ අනුව, වෙළඳ මිල අනුපාතය 2013 වසරේ දී වූ දර්ශක අංක 93.6 ක සිට 2014 වසරේ දී දර්ශක අංක 97.6 ක් දක්වා සියයට 4.3 කින් වර්ධනය විය.

2014 වසර තුළ දී කෘෂිකාර්මික සහ කාර්මික අපනයනයන්හි ඉහළ මිල ගණන් පිළිබිඹු කරමින් අපනයන මිල දර්ශකය ඉහළ ගියේය. කෘෂිකාර්මික අපනයන කාණ්ඩය සැලකීමේ දී ප්‍රධාන වශයෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළෙහි පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත සඳහා ඉහළ මිලක් ලැබීම හේතුවෙන් පොල් නිෂ්පාදිතවල සාමාන්‍ය අපනයන මිල දර්ශකය සියයට 15.0 කින් වර්ධනය විය. 2014 වසරේ පළමු භාගය තුළ දී තේ අපනයනයන්හි සාමාන්‍ය මිල දර්ශකය ඉහළ ගිය ද, මූලික වශයෙන්ම ශ්‍රී ලංකාවේ තේ සඳහා ප්‍රධාන අපනයන වෙළඳපොළවල් වන රුසියාව සහ මැද පෙරදිග රටවල්වලින් වූ ඉල්ලුම අඩු වීම හේතුවෙන් දෙවන භාගය තුළ දී එය පහත වැටුණි. කෙසේ වුවද, කල්කටා සහ මුම්බාසා වෙන්දේසිවල තේ මිල ගණන් අඩු වීම හමුවේ වුව ද 2014 වසරේ දී තේ සඳහා වූ මිල දර්ශකය පෙර වසරට සාපේක්ෂව සියයට 1.9 කින් සුළු වශයෙන් වර්ධනය විය. පළතුරු, ඇට වර්ග සහ වාෂ්පශීලී තෙල් වැනි නිෂ්පාදිතයන්හි සතුටුදායක මිල ගණන් පිළිබිඹු කරමින් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතවල අපනයන මිල දර්ශකය වර්ධනය විය. කෙසේ වුවද, 2014 වසර තුළ දී ගෝලීය වෙළඳපොළ තත්ත්වයන් පිළිබිඹු කරමින් රබර් අපනයන මිල දර්ශකය සියයට 10.5 කින් පහත වැටුණි. කාර්මික අපනයන මිල දර්ශකය 2014 වසර තුළ දී සියයට 3.0 කින් ඉහළ ගිය අතර, රෙදිපිළි සහ ඇඟලුම් අපනයන මිල ගණන් සියයට 3.3 කින් ද, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් මිල ගණන් සියයට 9.7 කින් ද වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. නවීන තාක්ෂණය භාවිතය සහ නව සොයා ගැනීම් තුළින් ඇඟලුම් කර්මාන්තයේ අවසාන නිෂ්පාදිතවල ගුණාත්මක තත්ත්වයන් ඉහළ නැංවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සඳහා ප්‍රමුඛ වෙළඳපොළවල් වෙත පිවිසීමේ හැකියාව ලැබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රෙදිපිළි හා ඇඟලුම්හි ඒකක මිල ගණන් ඉහළ ගියේය. මේ අතර, 2014 වසර තුළ දී ඛනිජ තෙල් නිෂ්පාදිත, මූල ලෝහ හා උපාංග සහ ප්‍රවාහන උපකරණ යනාදියෙහි අපනයන මිල දර්ශක පහත වැටුණි.

**5.4 රූප සටහන** **වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක**



**5.5 සංඛ්‍යා සටහන**

## වෙළඳ දර්ශක (අ)

2010 = 100

| කාණ්ඩය | වටිනාකම් දර්ශකය | | | පරිමා දර්ශකය | | | ඒකක වටිනාකම් දර්ශකය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 (ආ) | වර්ධනය % | 2013 | 2014 (ආ) | වර්ධනය % | 2013 | 2014 (ආ) | වර්ධනය % |
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **112.0** | **121.2** | **8.2** | **97.4** | **103.2** | **5.9** | **115.0** | **117.5** | **2.2** |
| තේ | 107.1 | 113.1 | 5.6 | 95.0 | 98.5 | 3.7 | 112.8 | 114.9 | 1.9 |
| රබර් | 41.2 | 26.2 | -36.5 | 45.5 | 32.3 | -29.0 | 90.5 | 81.0 | -10.5 |
| පොල් | 123.5 | 215.1 | 74.2 | 112.7 | 170.7 | 51.5 | 109.6 | 126.0 | 15.0 |
| කුළු බඩු | 171.5 | 127.7 | -25.6 | 115.2 | 85.8 | -25.5 | 148.9 | 148.8 | -0.1 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 141.8 | 231.4 | 63.1 | 162.6 | 232.2 | 42.8 | 87.2 | 99.7 | 14.3 |
| **කාර්මික අපනයන** | **127.2** | **135.6** | **6.6** | **128.7** (ඇ) | **133.2** | **3.6** | **98.9** (ඇ) | **101.8** | **3.0** |
| රෙදිපිළි හා ඇඟලුම් | 134.4 | 147.0 | 9.4 | 121.1 | 128.2 | 5.8 | 111.0 | 114.7 | 3.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 162.5 | 128.4 | -21.0 | 116.9 | 92.6 | -20.8 | 139.0 | 138.7 | -0.2 |
| රබර් නිෂ්පාදිත | 159.5 | 159.8 | 0.2 | 109.0 | 108.1 | -0.8 | 146.3 | 147.9 | 1.0 |
| **ඛනිජ ද්‍රව්‍ය අපනයන** | **212.8** | **245.4** | **15.3** | **81.0** | **158.6** | **95.7** | **262.6** | **154.7** | **-41.1** |
| **මුළු අපනයන** | **120.6** | **129.1** | **7.1** | **117.3** (ඇ) | **122.3** | **4.3** | **102.8** (ඇ) | **105.5** | **2.7** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **128.6** | **155.7** | **21.1** | **119.2** | **143.3** | **20.2** | **107.9** | **108.6** | **0.7** |
| ආහාර හා පාන වර්ග | 103.4 | 123.5 | 19.4 | 105.4 | 125.8 | 19.4 | 98.1 | 98.2 | 0.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 157.6 | 192.7 | 22.3 | 135.1 | 163.5 | 21.0 | 116.7 | 117.9 | 1.0 |
| **අන්තර් භාණ්ඩ** | **131.1** (ඇ) | **141.6** | **8.0** | **111.1** (ඇ) | **122.9** | **10.6** | **118.0** (ඇ) | **115.2** | **-2.4** |
| ඉන්ධන | 141.7 (ඇ) | 151.2 | 6.7 | 103.4 (ඇ) | 117.7 | 13.9 | 137.1 (ඇ) | 128.4 | -6.3 |
| පොහොර | 99.4 | 113.4 | 14.1 | 88.4 | 112.6 | 27.3 | 112.3 | 100.8 | -10.3 |
| රසායනික නිෂ්පාදිත | 141.2 | 155.4 | 10.1 | 128.1 | 138.3 | 8.0 | 110.3 | 112.4 | 1.9 |
| තිරිඟු සහ ඉරිඟු | 121.8 | 152.5 | 25.2 | 84.8 | 123.5 | 45.6 | 143.6 | 123.5 | -14.0 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 113.1 | 128.7 | 13.8 | 104.7 | 115.8 | 10.5 | 108.0 | 111.1 | 2.9 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 121.8 | 143.7 | 18.0 | 116.9 | 131.1 | 12.1 | 104.2 | 109.6 | 5.3 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ | 127.9 | 46.5 | -63.7 | 131.7 | 57.7 | -56.2 | 97.1 | 80.5 | -17.1 |
| **ආයෝජන භාණ්ඩ** | **154.4** | **150.7** | **-2.4** | **157.6** | **158.2** | **0.3** | **97.9** | **95.3** | **-2.7** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 165.2 | 159.3 | -3.6 | 153.9 | 153.0 | -0.6 | 107.3 | 104.1 | -3.0 |
| ප්‍රවාහන උපකරණ | 112.7 | 119.4 | 5.9 | 103.5 | 114.4 | 10.6 | 108.9 | 104.3 | -4.2 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 166.1 | 159.3 | -4.1 | 183.9 | 180.7 | -1.7 | 90.3 | 88.2 | -2.4 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 174.0 | 147.9 | -15.0 | 161.8 | 162.2 | 0.3 | 107.5 | 91.2 | -15.2 |
| **මුළු ආනයන** | **134.3** | **144.8** | **7.9** | **122.3** (ඇ) | **134.0** | **9.5** | **109.8** (ඇ) | **108.1** | **-1.5** |
| **වෙළඳ මිල අනුපාතය** | | | | | | | **93.6** (ඇ) | **97.6** | **4.3** |

(අ) එ.ජ.ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2014 වසර තුළ දී අන්තර් සහ ආයෝජන භාණ්ඩයන්හි සාමාන්‍ය ආනයන මිල ගණන් පෙර වසර සමඟ සැසඳීමේ දී පහළ මට්ටමක පැවතුණු අතර, පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් සුළු වශයෙන් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් ඉන්ධන මිල ගණන් අඩු වීම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයනය සඳහා වූ ආනයන මිල දර්ශකය සියයට 2.4 කින් පහත වැටුණි. 2014 වසරේ පළමු භාගය තුළ දී ඉන්ධන ආනයන මිල දර්ශකය ඉහළ ගිය ද, ගෝලීය ආර්ථික කටයුතු දුර්වල වීම හේතුවෙන් ඉන්ධන සඳහා වූ ඉල්ලුම අඩුවීම මෙන්ම විශේෂයෙන් ඛනිජ තෙල් අපනයන රටවල සංවිධානයට (OPEC) අයත් නොවන රටවල ඉන්ධන සැපයීම ඉහළ යෑම හේතුවෙන් වසරේ දෙවන භාගය තුළ දී ඉන්ධන ආනයන මිල දර්ශකය අඛණ්ඩව පහත වැටුණි. මෙම ප්‍රවණතා හේතුවෙන් 2014 වසරේ දී ඉන්ධන ආනයන මිල දර්ශකය සියයට 6.3 කින් අඩු විය. 2013 වසරට සාපේක්ෂව පොහොර ආනයන මිල දර්ශකය 2014 වසරේ දී සියයට 10.3 කින් පහත වැටුණු අතර එය සමස්ත ආනයන මිල ගණන් අඩු වීම සඳහා සැලකිය යුතු ලෙස දායක විය. මේ අතර, තිරිඟු හා ඉරිඟු, දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ, සහ රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදිත යනාදියෙහි ආනයන මිල ගණන් ද සැලකිය යුතු ලෙස පහත වැටුණි. සියලුම උප කාණ්ඩයන්හි මිල ගණන්වල අඩු වීම පිළිබිඹු කරමින් 2014 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන

මිල දර්ශකය සියයට 2.7 කින් අඩු විය. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි අමුද්‍රව්‍ය සහ මූල ලෝහ මිල ගණන් පහත වැටීමට සමගාමීව ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන මිල දර්ශකය සියයට 3.0 කින් පහත වැටුණි. තවද, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ජපාන යෙන් අගය විශාල වශයෙන් අවප්‍රමාණය වීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන මිල දර්ශකය අඩු විය. ආහාර සහ ආහාරමය නොවන ආනයන කාණ්ඩයන්හි සාමාන්‍ය ආනයන මිල ගණන් පිළිවෙළින් සියයට 0.1 කින් සහ සියයට 1.0 කින් වර්ධනය වූ අතර, එය පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන මිල දර්ශකය සියයට 0.7 කින් ඉහළ නැංවීමට හේතු විය. 2014 වසර තුළ දී ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි කිරි නිෂ්පාදිත මිල ගණන් සුළු වශයෙන් අඩු වුවද, එම නිෂ්පාදිත සඳහා වූ ආනයන මිල දර්ශකය සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වුවද, සීනි නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල සැපයුම ඉහළ යෑම හේතුවෙන් සීනි සහ රසකැවිලි ආනයන මිල ගණන් පහත වැටුණි. මේ අතර, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති රෙදිපිළි හා උපාංග, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ පෞද්ගලික භාවිතය සඳහා වන රථ වාහන යනාදියෙහි ආනයන මිල ගණන් ද වර්ධනය විය.

### 5.3.5 වෙළෙඳ දිශාව

2014 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරු **ලෙස ඉන්දියාව තවදුරටත් පැවති අතර, අනතුරුව චීනය හා ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් විය.** කාර්මික රටවල් විශේෂයෙන්ම, ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය තවදුරටත් විශාලතම අපනයන ගමනාන්තයන් ලෙස පැවති අතර, ආසියාව, විශේෂයෙන්ම ඉන්දියාව සහ චීනය ප්‍රධාන ආනයන ප්‍රභවයන් ලෙස පැවතුණි. 2014 වසරේ දී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වූ වෙළෙඳ ගනුදෙනුවල වටිනාකම එ.ජ. ඩොලර් බිලියන 4.6 කට වඩා වැඩි වූ අතර, එය මෙම වසරේ ශ්‍රී ලංකාවේ සමස්ත විදේශීය වෙළෙඳාමෙන් සියයට 15 ක් පමණ විය. මේ අතර, චීනය හා ශ්‍රී ලංකාව අතර වෙළෙඳාම මුළු වෙළෙඳාමෙන් සියයට 12 ක් පමණ විය.

**ඇමෙරිකා එක්සත් ජනපදය 1979 වසරේ සිට දීර්ඝ කාලයක් ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන ගැනුම්කරු විය.** ශ්‍රී ලංකාවේ මුළු අපනයනයන්හි ප්‍රතිශතයක් ලෙස ගත් විට ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කළ අපනයන 2013 වසරේ දී වාර්තා වූ සියයට 24.0 සිට 2014 වසරේ දී සියයට 24.5 ක් දක්වා ඉහළ ගිය අතර, එම අපනයනවලින් ලද ආදායම පසුගිය වසරට සාපේක්ෂව සියයට 9.5 කින් වර්ධනය විය. ඇඟලුම් සහ රබර් නිෂ්පාදිත අපනයන ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කළ මුළු අපනයනවලින් පිළිවෙළින් සියයට 72.9 ක් සහ සියයට 10.4 ක් විය. 2014 වසරේ දී දෙවන විශාලතම අපනයන ගමනාන්තය වූ එක්සත් රාජධානිය වෙත කළ අපනයන මුළු අපනයනවලින් සියයට 10.0 ක් විය. ඇඟලුම් සහ රබර් නිෂ්පාදිත අපනයන එක්සත් රාජධානිය වෙත කළ මුළු අපනයනවලින් පිළිවෙළින් සියයට 80.9 ක් සහ සියයට 3.6 ක් විය. ශ්‍රී ලංකාවේ මුළු ඇඟලුම් අපනයන ආදායම වූ එ.ජ. ඩොලර් මිලියන 4,682 න් ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය වෙත කළ අපනයන පිළිවෙළින් සියයට 42.5 ක් සහ සියයට 19.3 ක් විය. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා තෙවන විශාලතම ගැනුම්කරු වූ ඉන්දියාව වෙත කළ අපනයන මුළු අපනයනවලින් සියයට 5.6 ක් වූ අතර, අනතුරුව පිළිවෙළින් ඉතාලිය සහ ජර්මනිය ප්‍රධාන අපනයන ගමනාන්ත විය. සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, කුළුබඩු, ප්‍රවාහන උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ඛනිජ තෙල් නිෂ්පාදිත ඉන්දියාව වෙත කළ ප්‍රධානතම අපනයන විය. 2014 වසරේ දී, මුළු අපනයනවලින් සියයට 5.5 ක් වූ ඉතාලිය වෙත කළ අපනයන පෙර වසරට සාපේක්ෂව සියයට 20.3 කින් වර්ධනය වූ අතර, ඇඟලුම් අපනයන වර්ධනය වීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2014 වසරේ දී මුළු අපනයනවලින් සියයට 4.5 ක් වූ ජර්මනිය වෙත කළ අපනයන සියයට 6.3 කින් වර්ධනය විය. 2014 වසරේ දී මුළු තේ අපනයනයන්ගෙන් පිළිවෙළින් සියයට 14.0 ක් සහ සියයට 12.8 ක් මිල දී ගත් රුසියාව සහ තුර්කිය, තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම තේ ගැනුම්කරුවන් විය. කෙසේ වුවද, 2014 වසරේ අග භාගයේ දී රුසියානු මුදලේ අගය විශාල ලෙස අවප්‍රමාණය වීම සහ ඛනිජ තෙල් මිල ගණන් තියුණු ලෙස අඩු වීම වැනි අයහපත් ආර්ථික තත්ත්වයන් හේතුවෙන් රුසියාව වෙත කළ තේ අපනයන පෙර වසරට සාපේක්ෂව සියයට 5.0 කින් අඩු විය. මේ අතර, තුර්කිය වෙත කළ තේ අපනයන සියයට 48.1 කින් වර්ධනය විය.

**අපනයන වෙළෙඳපොළවල් සංකේන්ද්‍රණය වීම, අපනයන ආදායම්වල අස්ථායීභාවය ඇති වීමට හේතු විය හැකි බැවින් එය අපනයන ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටලුවක්ව පවතී.** ශ්‍රී ලංකාව, යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි රටවල් කිහිපයක් මත විශාල වශයෙන් රඳා පවතින අතර එම රටවල් වෙත සිදුකරන අපනයන මුළු අපනයනවලින් තුනෙන් දෙකක් පමණ වේ. තවද, ශ්‍රී ලංකාවේ තේ අපනයනවලින් සියයට 66 ක් පමණ මැදපෙරදිග සහ ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වෙත සිදු කරන අතර, එම රටවල් විශාල වශයෙන් ඉන්ධන අපනයනය මත රඳා පවතී. මෙම අවදානම අවම කිරීම සඳහා වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීමට පෞද්ගලික සහ රාජ්‍ය අංශය

**5.5 රූප සටහන** අපනයන වෙළඳ දිශාව




**5.6 රූප සටහන** ආනයන වෙළඳ දිශාව




එක්වූ බහුවිධ ප්‍රවේශයකින් යුත් ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ. තවද, වෙළඳපොළ ප්‍රවේශය වර්ධනය කර ගැනීම සඳහා අපනයනකරුවන් විසින් දැනට පවතින වෙළඳ පහසුකම් සහ වෙළඳ ගිවිසුම් නිසි ලෙස උපයෝජනය කිරීම සිදු කළ යුතු වේ.

**ඉන්දියාව, ශ්‍රී ලංකාවේ විශාලතම ආනයන ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර, අනතුරුව පිළිවෙළින් චීනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ප්‍රධාන ආනයන ප්‍රභවයන් විය.** 2014 වසර තුළ දී ඉන්දියාවෙන් කරන ලද ආනයන එ.ජ. ඩොලර් මිලියන 4,023 ක් දක්වා සියයට 26.9 කින් වර්ධනය වූ අතර, එය ශ්‍රී ලංකාවේ මුළු ආනයනවලින් සියයට 20.7 ක් විය. ඛනිජ තෙල් නිෂ්පාදිත, රෙදි සහ රථ වාහන ඉන්දියාවෙන් කරන ලද ප්‍රධානතම ආනයන විය. ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම ආනයන ප්‍රභවය වූ චීනයෙන් 2014 වසරේ දී කරන ලද ආනයන මුළු ආනයනවලින් සියයට 18.0 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,494 ක් දක්වා සියයට 18.3 කින් වර්ධනය විය. රෙදි වර්ග, ඛනිජ තෙල් නිෂ්පාදිත, ඉංජිනේරු උපකරණ සහ යකඩ හා වානේ චීනයෙන් කරන ලද ප්‍රධානතම ආනයන විය. 2014 වසරේ දී එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙතින් කළ ආනයන සියයට 55.8 ක වර්ධනයක් වාර්තා කළ අතර, එය සිංගප්පූරුව අභිබවා තෙවන විශාලතම ආනයන ප්‍රභවය බවට පත් විය. එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් කරන ලද මුළු ආනයනවලින් ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය සියයට 87.1 ක් විය. සිව්වන සහ පස්වන විශාලතම ආනයන ප්‍රභවයන් වන සිංගප්පූරුවෙන් සහ ජපානයෙන් කරන ලද ආනයන මුළු ආනයනයන්ගෙන් පිළිවෙළින් සියයට 6.5 ක් සහ සියයට 4.8 ක් විය. කෙසේ වුවද, එක්සත් ආරාබි එමීර් රාජ්‍යයෙන් කරන ලද ඛනිජ තෙල් ආනයන සියයට 71.7 කින් වර්ධනය වීමත් සමඟ සිංගප්පූරුවෙන් කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන පහත වැටුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සිංගප්පූරුවෙන් කරන ලද මුළු ආනයන සියයට 25.1 කින් අඩු විය. ඛනිජ තෙල් නිෂ්පාදිත සහ මෝටර් රථ පිළිවෙළින් සිංගප්පූරුවෙන් සහ ජපානයෙන් කරන ලද ප්‍රධානතම ආනයන විය.

## 5.4 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

### 5.4.1 සේවා වෙළඳාම

2014 වසරේ දී සේවා අපනයන වර්ධනය විය. සේවා අපනයන ඉපැයුම් 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,685 සමග සැසැඳීමේ දී 2014 වසරේ දී සියයට 19.6 ක වාර්ෂික වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 5,605 ක් විය. ප්‍රවාහන, සංචාරක, සන්නිවේදන, පරිගණක හා තොරතුරු සේවා ඇතුළු උප අංශයන් බහුතරයක් සේවා අංශයෙහි වර්ධනය කෙරෙහි දායක විය. මේ අතර, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළඳ කටයුතු වර්ධනය වීමත් සමග සේවා සඳහා වූ විදේශ විනිමය ගෙවීම් ද එ.ජ. ඩොලර් මිලියන 3,725 ක් දක්වා සියයට 6.3 කින් වර්ධනය වූ අතර, ඒ අනුව 2014 වසරේ දී සේවා ගිණුමෙහි එ.ජ. ඩොලර් මිලියන 1,880 ක ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය.

#### ප්‍රවාහන සේවා

ප්‍රවාහන සේවා අංශය 2014 වසරේ දී සේවා ගිණුමේ වර්ධනය සඳහා අඛණ්ඩව උපකාරී විය. මගී ගාස්තු, නැව් කුලී සහ වරාය හා ගුවන් තොටුපොළ සේවා ආශ්‍රිත ලැබීම් වර්ධනය වීම වසර තුළ දී සේවා අංශයෙහි සියයට 7.8 ක වර්ධනයක් වාර්තා වීමට උපකාරී විය. ප්‍රධාන වශයෙන් මගී ගාස්තු ලෙස වූ ලැබීම් ඉහළ යෑම, නැව් කුලී ආදායම් ඉහළ යෑම සහ වරාය හා ගුවන් තොටුපොළ ආශ්‍රිත සේවා කටයුතු වර්ධනය වීම හේතුවෙන් ප්‍රවාහන සේවා සඳහා වූ දළ විදේශ විනිමය ලැබීම් 2013 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,784 සිට 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,923 ක් දක්වා වර්ධනය විය. ජාත්‍යන්තර වෙළඳ කටයුතු වර්ධනය වීම හේතුවෙන් නැව් කුලී සහ වරාය ගාස්තු මත වූ ගෙවීම් ඉහළ යෑම සහ ශ්‍රී ලාංකිකයින් විදේශ සංචාර සඳහා කරන ලද වියදම් ඉහළ යෑම පිළිබිඹු කරමින් ප්‍රවාහන සේවා මත වූ ගෙවීම් ද පෙර වසරට සාපේක්ෂව 2014 වසරේ දී සියයට 5.8 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 402 සමග සැසඳීමේදී ප්‍රවාහන සේවා අංශයේ ශුද්ධ ගෙවීම් ප්‍රමාණය 2014 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 462 ක් විය.

**පෙර වසරට සාපේක්ෂව 2014 වසරේ දී මගී ගාස්තු ආශ්‍රිත විදේශ විනිමය ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 847 ක් දක්වා සියයට 7.1 කින් ඉහළ ගියේය.** ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ සංචාරකයින්ගේ ප්‍රමාණය ඉහළ යෑම සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන් ගාස්තු ඉහළ යෑම මේ සඳහා හේතු විය. ලෝකයේ සෙසු රටවල්

**5.6 සංඛ්‍යා සටහන — ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන

| ශීර්ෂය | 2013 (අ) | | | 2014 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **භාණ්ඩ හා සේවා** | **15,079** | **21,508** | **-6,429** | **16,735** | **23,142** | **-6,407** |
| **භාණ්ඩ** | **10,394** | **18,003** | **-7,609** | **11,130** | **19,417** | **-8,287** |
| වෙළඳ භාණ්ඩ | 10,392 | 17,802 | -7,410 | 11,130 | 19,405 | -8,275 |
| මුල්‍ය නොවන රත්‍රන් | 2 | 201 | -199 | - | 12 | -12 |
| **සේවා** | **4,685** | **3,505** | **1,180** | **5,605** | **3,725** | **1,880** |
| ප්‍රවාහන | 1,784 | 1,382 | 402 | 1,923 | 1,462 | 462 |
| මුහුදු ප්‍රවාහන | 893 | 686 | 208 | 969 | 722 | 246 |
| නැව් කුලී | 893 | 686 | 208 | 969 | 722 | 246 |
| ගුවන් ප්‍රවාහන | 890 | 696 | 194 | 954 | 739 | 215 |
| මගී ගාස්තු | 791 | 620 | 171 | 847 | 659 | 188 |
| ගුවන් කුලී | 99 | 76 | 23 | 108 | 80 | 27 |
| සංචාරක (ඇ) | 1,715 | 1,188 | 527 | 2,431 | 1,263 | 1,169 |
| ඉදිකිරීම් | 55 | 26 | 29 | 58 | 29 | 29 |
| රක්ෂණ සහ විශ්‍රාම වැටුප් | 109 | 85 | 24 | 115 | 90 | 26 |
| මූල්‍ය සේවා | 235 | 328 | -93 | 256 | 350 | -94 |
| විදුලි සන්දේශ සහ පරිගණක සේවා | 719 | 368 | 351 | 748 | 398 | 350 |
| විදුලි සන්දේශ | 114 | 87 | 27 | 120 | 98 | 22 |
| පරිගණක සේවා | 604 | 281 | 324 | 628 | 300 | 328 |
| වෙනත් ව්‍යාපාරික සේවා | 39 | 55 | -15 | 43 | 58 | -16 |
| රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන) | 28 | 73 | -45 | 31 | 77 | -45 |
| **ප්‍රාථමික ආදායම්** | **132** | **1,883** | **-1,751** | **153** | **1,992** | **-1,839** |
| සේවක වැටුප් | 15 | 66 | -51 | 19 | 68 | -50 |
| ආයෝජන ආදායම් | 117 | 1,817 | -1,701 | 135 | 1,924 | -1,789 |
| සෘජු ආයෝජන | 6 | 737 | -730 | 15 | 698 | -683 |
| ලාභාංශ | 6 | 386 | -380 | 15 | 317 | -302 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | - | 350 | -350 | - | 381 | -381 |
| විවිධ ආයෝජන | - | 645 | -645 | - | 828 | -828 |
| හිමිකම් | - | 21 | -21 | - | 69 | -69 |
| පොලී ආදායම් | - | 624 | -624 | - | 758 | -758 |
| කෙටි කාලීන | - | 48 | -48 | - | 61 | -61 |
| දිගු කාලීන | - | 575 | -575 | - | 697 | -697 |
| අනෙකුත් ආයෝජන | 20 | 436 | -416 | 18 | 398 | -380 |
| සංචිත වත්කම් | 91 | - | 91 | 102 | - | 102 |
| **ද්විතීයික ආදායම්** | **6,428** | **788** | **5,639** | **7,046** | **819** | **6,227** |
| රජය | 21 | - | 21 | 28 | - | 28 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 6,407 | 788 | 5,619 | 7,018 | 819 | 6,199 |
| **ජංගම ගිණුම** | **21,639** | **24,180** | **-2,541** | **23,934** | **25,952** | **-2,018** |
| **ප්‍රාග්ධන ගිණුම** | **90** | **19** | **71** | **73** | **15** | **58** |
| ප්‍රාග්ධන සංක්‍රාම | 90 | 19 | 71 | 73 | 15 | 58 |
| රජය | 39 | - | 39 | 52 | - | 52 |
| සංස්ථා සහ කුටුම්බ | 51 | 19 | 32 | 21 | 15 | 6 |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම** | **21,729** | **24,198** | **-2,470** | **24,007** | **25,967** | **-1,960** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 6**

## ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ සංඛ්‍යාන වැඩිදියුණු කිරීම

විදේශීය අංශයේ සංඛ්‍යාන මගින් රටක සියලුම නේවාසිකයින් විසින් ලෝකයේ සෙසු රටවල් සමඟ සිදු කරනු ලබන ජාත්‍යන්තර ගනුදෙනු ඉදිරිපත් කෙරෙයි. මෙම ගනුදෙනු ගෙවුම් තුලනය, අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, විදේශීය ණය සහ විදේශීය සංචිත වැනි ගිණුම්වලට අදාළ පරිදි ක්‍රමානුකූලව වාර්තා කෙරෙයි. මෙම ගිණුම් හා සම්බන්ධ සියලුම නිර්වචනයන්, වර්ගීකරණයන් සහ ගිණුම්කරණ නීතීන් අන්තර් සම්බන්ධතාවයකින් සිදුවිය යුතු අතර, එමගින් විදේශීය අංශයේ සමස්තයන්, ජාතික ගිණුම්, මුදල් හා මූල්‍ය සහ රාජ්‍ය මූල්‍ය වැනි අනෙකුත් අංශ හා සම්බන්ධ සංඛ්‍යාන සමඟ සංසන්දනය කිරීමට හැකි වේ.

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය හා සම්බන්ධ සංඛ්‍යාන සම්පාදනය සහ ප්‍රකාශනය කිරීමේ වගකීම සතු ශ්‍රී ලංකා මහ බැංකුව 2013 සහ 2014 වසරවල දී විදේශීය අංශයේ සංඛ්‍යාන දියුණු කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. 2013 වසරේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ දත්ත සම්පාදනය කිරීමේ දී ශ්‍රී ලංකාව ගෙවුම් තුලනය සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ අත්පොතෙහි හයවන සංස්කරණයට (BPM6) අනුකූල දත්ත සම්පාදන ක්‍රමවේදයන් භාවිතා කර ඇත. මේ අනුව, අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (IIP) සහ විදේශ සංචිත දත්ත සටහන (RDT) යනාදී නව සංඛ්‍යා දත්ත ඉදිරිපත් කිරීම් කිහිපයක් හඳුන්වා දුන් අතර, ගෙවුම් තුලනය, විදේශීය ණය වැනි දැනටමත් ප්‍රකාශයට පත් කෙරෙන විදේශීය අංශයේ සංඛ්‍යාන ආවරණය, නියමිත කාලයට ප්‍රකාශයට පත් කිරීම සහ ප්‍රකාශයට පත් කරන කාල පරාසය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කර ඇත. මීට අමතරව, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) විසින් පවත්වාගෙන යන සෘජු ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණයට (CDIS) සහභාගි වීම ආරම්භ කළ අතර, ලෝක බැංකුවේ විදේශීය ණය පිළිබඳ කාර්තුමය සංඛ්‍යාන (QEDS) සඳහා සපයන දත්තවල ආවරණය වඩා පුළුල් කෙරිණි. රජය, බැංකු අංශය සහ මූල්‍ය අධිකාරිය (ශ්‍රී ලංකා මහ බැංකුව) මගින් රැස්කර ගත් දත්ත සහ පෞද්ගලික අංශයේ දත්ත රැස්කර ගැනීම සඳහා නව සමීක්ෂණ සිදු කිරීම තුළින් දත්ත නියමිත කාලයට ඉදිරිපත් කිරීම, ආවරණය සහ කාල පරාසය යන අංශයන් තවදුරටත් දියුණු කිරීම තුළින් විදේශීය අංශයේ සංඛ්‍යානවල මෙම වර්ධනයන් සිදු කෙරිණි. මෙම වැඩිදියුණු කිරීම් සමඟ ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ දත්ත 2015 වසරේ දී ශ්‍රී ලංකාව දායක වීමට බලාපොරොත්තු වන ජා.මූ. අරමුදලේ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය (SDDS) යටතේ දත්ත නියමිත කාලයට ඉදිරිපත් කිරීම, ආවරණය සහ කාල පරාසය යන සියලු අවශ්‍යතාවයන් සපුරා ඇත. විදේශීය අංශයේ සංඛ්‍යාන වර්ධනය කිරීම සඳහා ජා.මූ. අරමුදලේ තාක්ෂණික සහාය අඛණ්ඩව ලැබුණි.

### ගෙවුම් තුලනය (BOP)

නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර නියමිත කාලපරිච්ඡේදයක් තුළ දී සිදු කරන ගනුදෙනු සාරාංශ කරනු ලබන සංඛ්‍යාත්මක ප්‍රකාශය ගෙවුම් තුලනයයි. ගෙවුම් තුලන ලේඛනය භාණ්ඩ හා සේවා ගිණුම, ප්‍රාථමික ආදායම් ගිණුම, ද්විතීයික ආදායම් ගිණුම, ප්‍රාග්ධන ගිණුම සහ මූල්‍ය ගිණුම යන ප්‍රධාන ගිණුම්වලින් සමන්විත වේ. BPM6 සංස්කරණයේ නිර්දේශිත ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවුම් තුලන සංඛ්‍යාන කාර්තුමය පදනම මත සම්පාදනය කරනු ලබයි. 2012 සහ 2013 වසර සඳහා ගෙවුම් තුලනයේ සංඛ්‍යාන BPM6 සංස්කරණය අනුව ප්‍රකාශයට පත් කිරීමත් සමඟ 2014 වසරේ දී ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන දත්ත සම්පාදනය BPM5 සංස්කරණයේ සිට BPM6 සංස්කරණයට පරිවර්තනය කෙරිණි. මෙම පරිවර්තනය පිළිබඳව 2013 වසරේ වාර්ෂික වාර්තාවේ 'විශේෂ සටහන 6' යටතේ විස්තර කර ඇත. ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන සංඛ්‍යාන 2014 වසරේ වාර්ෂික වාර්තාවේ සංඛ්‍යා සටහන 5.1: ගෙවුම් තුලනයේ සාරාංශය, සංඛ්‍යා සටහන 5.6: ජංගම සහ ප්‍රාග්ධන ගිණුම, සංඛ්‍යා සටහන 5.8. අ: සහ සංඛ්‍යා සටහන 5.8. ආ: මූල්‍ය ගිණුම මගින් පෙන්නුම් කෙරෙයි.

### අන්තර් ජාතික ආයෝජන තත්ත්වය (IIP)

අන්තර්ජාතික ආයෝජන තත්ත්වය සංකල්පමය වශයෙන් ශේෂ පත්‍රයකට සමාන වන අතර, එය යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් අවසානයේ දී රටක නේවාසිකයින් සතු විදේශීය වත්කම් සහ ඔවුන් වෙත ඇති විදේශීය වගකීම්වල වටිනාකම සහ සංයුතිය වාර්තා කරයි. BPM6 සංස්කරණයේ සම්මතයන්ට අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය මූලික වශයෙන් කාර්යය අනුව කෙරෙන වර්ගීකරණය (functional categories) පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරයි. සෘජු ආයෝජන, විවිධ ආයෝජන, මූල්‍ය ව්‍යුත්පන්න, අනෙකුත් ආයෝජන සහ සංචිත වත්කම් මෙහි මූලික අංශයන් වේ. කාර්යය අනුව වර්ග කෙරෙන එක් එක් අංශයක් මූල්‍ය උපකරණවල ස්වභාවය, නේවාසික ආයතන අංශය සහ මූල්‍ය උපකරණයන්හි පරිණත කාලය මත පදනම්ව තවදුරටත් වර්ගීකරණය කෙරෙයි. 'ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය' පිළිබඳව 2013 වසරේ වාර්ෂික වාර්තාවේ 'විශේෂ සටහන 7' හි විස්තර කර ඇත. ආරම්භයේ දී අන්තර්ජාතික ආයෝජන තත්ත්වය වාර්ෂික පදනම මත ප්‍රකාශයට පත් කරන ලදී. අනතුරුව, 2014 වසරේ පළමු කාර්තුවේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අන්තර්ජාතික ආයෝජන තත්ත්වය කාර්තුමය පදනම

මත ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාව විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට අනුව දත්ත සපයන රටක් ලෙස පිළිගැනීම සඳහා අන්තර්ජාතික ආයෝජන තත්ත්වය කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත්කිරීම අවශ්‍යතාවයක් වේ. ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය 2014 වසරේ වාර්ෂික වාර්තාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ 5.10 සංඛ්‍යා සටහන මගින් ඉදිරිපත් කර ඇත.

### විදේශීය ණය සංඛ්‍යාන (EDS)

යම් කාලපරිච්ඡේදයක් අවසානයේ දී අනේවාසිකයින් විසින් නේවාසිකයින් වෙත මුදාහල සහ නේවාසිකයින් සතුව නොපියවා ඉතිරිව ඇති වගකීම් දළ විදේශීය ණය ලෙස නිර්වචනය කෙරෙයි. 2013 වසරට පෙර ශ්‍රී ලංකාව විදේශීය ණය සංඛ්‍යාන වාර්ෂික පදනම මත ප්‍රකාශයට පත් කළේය. 2013 වසරේ සිට BPM6 සංස්කරණය අනුගමනය කිරීම ආරම්භ කිරීමත් සමග ශ්‍රී ලංකාවේ විදේශීය ණය පිළිබඳ සංඛ්‍යානයන්හි ආවරණය, නියමිත කාලයට ඉදිරිපත් කිරීම සහ කාල පරාසය තවදුරටත් පුළුල් කෙරිණි. විදේශීය ණය පිළිබඳ දත්ත ඉදිරිපත් කිරීමේ නව ක්‍රමය යටතේ සෘජු ආයෝජන ව්‍යාපාර ලබාගන්නා අන්තර් සමාගම් ණය ඇතුළත් කිරීමෙන් සමස්ත විදේශීය ණය දත්තවල ආවරණය පුළුල් කෙරුණු අතර, කාර්තුමය වශයෙන් පවත්වන/ක්‍රියාත්මක කරන සමීක්ෂණ වැඩිදියුණු කිරීම තුළින් පෞද්ගලික අංශයේ විදේශීය ණය ආවරණය පුළුල් විය. මෙම විදේශීය ණය පිළිබඳ නව සංඛ්‍යාන ආංශික සංයුතිය පදනම් කරගෙන ඉදිරිපත් කෙරෙන අතර, රජය, ශ්‍රී ලංකා මහ බැංකුව, තැන්පතු භාරගන්නා ආයතන, අනෙකුත් අංශ (පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්) සහ සෘජු ආයෝජන සමාගම් වල අන්තර් සමාගම් ණය එම අංශයන් වේ. සෑම අංශයකම විදේශීය ණය පරිණත කාලය සහ මූල්‍ය උපකරණවල ස්වභාවය මත තවදුරටත් වර්ගීකරණය කෙරේ. ණය සුරැකුම්පත්, විදේශීය ණය, මුදල් සහ තැන්පතු, වෙළඳ ණය හා අත්තිකාරම් සහ අනෙකුත් ගෙවිය යුතු ගිණුම් යනාදිය මෙම මූල්‍ය උපකරණ තුළට ඇතුළත් වේ. කෙටි කාලීන සහ දිගු කාලීන ලෙස කෙරෙන වර්ගීකරණය මූල්‍ය උපකරණවල මුල් පරිණත කාලය මත පදනම් වේ. ශ්‍රී ලංකාවේ විදේශීය ණය පිළිබඳ සංඛ්‍යාන 2014 වසරේ වාර්ෂික වාර්තාවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය පිළබඳ 5.12 සංඛ්‍යා සටහනෙහි ඉදිරිපත් කර ඇත.

### කාර්තුමය විදේශීය ණය සංඛ්‍යා දත්ත (QEDS)

විදේශීය ණය පිළිබඳ සංඛ්‍යාන ඉදිරිපත් කිරීමේ නව ක්‍රමවේදය අනුගමනය කිරීමත් සමග කාර්තුමය විදේශීය ණය සංඛ්‍යාන දත්ත එකතුව සඳහා වාර්තා කරන දත්තවල ආවරණය ද පුළුල් විය. ලෝක බැංකුව සහ ජා.මූ. අරමුදල ඒකාබද්ධව දියුණු කරන ලද කාර්තුමය විදේශීය ණය සංඛ්‍යා දත්ත එකතුව මගින් ජා.මූ. අරමුදලේ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය අනුගමනය කරන රටවල් සහ සාමාන්‍ය දත්ත ප්‍රකාශන සම්මතය අනුගමනය කරන තෝරාගත් රටවල් කිහිපයක විදේශීය ණය පිළිබඳ සංඛ්‍යාන සවිස්තරාත්මකව ඉදිරිපත් කෙරෙයි. ශ්‍රී ලංකාව දැනට සාමාන්‍ය දත්ත ප්‍රකාශන ක්‍රමය අනුගමනය කරන රටක් වශයෙන් කාර්තුමය විදේශීය ණය සංඛ්‍යාන වාර්තා කරයි. විදේශීය ණය පිළිබඳ සංඛ්‍යාන ඉදිරිපත් කිරීමේ නව ක්‍රමවේදය සමග කාර්තුමය විදේශීය ණය සංඛ්‍යාන ඉදිරිපත් කිරීමේ දී දැනට සපයා ඇති අනිවාර්යයෙන්ම සැපයිය යුතු සංඛ්‍යා සටහන්වලට අමතරව, විදේශීය ණය පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් 'සංඛ්‍යා සටහන 6: ආංශික සංයුතිය මත දළ විදේශීය ණය' මගින් ඉදිරිපත් කරයි. කාර්තුමය පදනම මත, කාර්තුවක කාල පමාවක් සහිතව මෙම නව සංඛ්‍යා සටහන් ඉදිරිපත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාවට විශේෂිත දත්ත ප්‍රචාරණ සම්මතයේ අවශ්‍යතාවයන්ට අනුව විදේශීය ණය පිළිබඳ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී.

### සංචිත දත්ත සටහන (RDT)

සංචිත දත්ත සටහන, රටක ජාත්‍යන්තර සංචිත හා විදේශ මුදල් ද්‍රවශීලතා තත්ත්වය යන සංකල්ප ඒකාබද්ධ කෙරෙන පුළුල් ආකෘතියක් වන අතර, 2013 වසරේ ජා.මූ. අරමුදල මගින් ප්‍රකාශිත 'ජාත්‍යන්තර සංචිත සහ විදේශ මුදල් ද්‍රවශීලතාව: දත්ත සටහන සඳහා වූ මාර්ගෝපදේශ' ඇසුරින් සම්පාදනය කර ඉදිරිපත් කර ඇත. ජාත්‍යන්තර සංචිත පිළිබඳ තොරතුරු ආවරණය කිරීමට අමතරව, විදේශ සංචිත දත්ත සටහන මගින් රටේ විදේශ විනිමය ආශ්‍රිත පූර්ව නිශ්චිත අනාගත ලැබීම් හා ගෙවීම් ද හඳුනා ගැනෙයි. සුරැකුම්පත්, මුදල් හා තැන්පතු, ජා.මූ. අරමුදලේ සංචිත තත්ත්වය, විශේෂ ගැනුම් හිමිකම්, රත්‍රන් ශේෂයන් සහ අනෙකුත් සංචිත වත්කම් ලෙස නිල සංචිත වත්කම් වර්ගීකරණය ඉදිරිපත් කෙරෙයි. විදේශ සංචිත වත්කම්හි පූර්ව නිශ්චිත කෙටි කාලීන ශුද්ධ ගෙවීම් තුළ ප්‍රධාන වශයෙන් වසරක කාලයක් තුළ පරිණත වීමට නියමිත රාජ්‍ය ණය ආපසු ගෙවීම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, ස්වෛරීත්ව බැඳුම්කර, ජා.මූ. අරමුදලේ සම්පස්ථ ණය පහසුකම, ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් සහ විදේශ විනිමය හුවමාරු ගනුදෙනු ආශ්‍රිත ඉදිරි ගෙවීම් ඇතුළත් වේ. 2013 වසරේ නොවැම්බර් මාසයේ සිට ඉන් ඉදිරියට මාසික පදනම මත, මාසයක කාලපමාවක් සහිතව සංචිත දත්ත සටහන සම්පාදනය කර ප්‍රකාශයට පත් කිරීම තුළින් ශ්‍රී ලංකාව විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය යටතේ තවත් එක් අවශ්‍යතාවයක් සම්පූර්ණ කර ඇත.

### සෘජු ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය (CDIS)

සෘජු ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය ජා.මූ. අරමුදල මගින් මෙහෙයවනු ලැබූ ගෝලීය සංඛ්‍යා දත්ත එකතුවක් වන අතර, එමගින් ආසන්නතම ආයෝජක ආර්ථිකය මත වර්ගීකරණය කරනු ලැබූ සෘජු ආයෝජන

ලැබීම් තත්ත්වයන් පිළිබඳ විස්තරාත්මක දත්ත (සලකා බලනු ලබන ආර්ථිකය වෙත වූ ඍජු ආයෝජන) සහ ආසන්නතම ආයෝජක ආර්ථිකය මත වර්ගීකරණය කරනු ලැබූ ඍජු ආයෝජන ගෙවීම් තත්ත්ව පිළිබඳ විස්තරාත්මක දත්ත (සලකා බලනු ලබන ආර්ථිකය විසින් විදේශයන්හි සිදු කළ ඍජු ආයෝජන) ඉදිරිපත් කෙරෙයි. ඍජු ආයෝජන දත්ත කාලපරිච්ඡේදයක් අවසානයේ දී පවත්නා තත්ත්වයක් ලෙස ඉදිරිපත් කරන අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ දී සියලු රටවල් විසින් වාර්තා කර ඇති ආයෝජන තත්ත්වයන්හි එකතුව අන්තර්ජාතික ආයෝජන තුළ වාර්තා කර ඇති මුළු ඍජු ආයෝජන තත්ත්වයට සමාන වේ. ශ්‍රී ලංකාව 2013 වසරේ සිට ඍජු ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණයට සහභාගී වීම ආරම්භ කළ අතර, වාර්ෂික පදනම මත දත්ත වාර්තා කරයි.

**ගෙවුම් තුලනයේ සේවා ගිණුම් සංඛ්‍යාන වැඩිදියුණු කිරීම**

2014 වසරේ දී ගෙවුම් තුලනයෙහි සේවා අංශයේ දත්ත ආවරණය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව සමීක්ෂණ රැසක් ආරම්භ කරන ලදී. නේවාසික ගුවන් සමාගම්, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම (බණ්ඩාරනායක ගුවන් තොටුපොළ සහ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ), අනේවාසික ගුවන් සමාගම්හි ප්‍රධාන වෙළඳ නියෝජිතයින් (GSAs), ශ්‍රී ලංකා වරාය අධිකාරිය, පෞද්ගලික බහලු පර්යන්ත, නැව් සමාගම් නියෝජිතයින්, ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහකයින්, වරායය ආශ්‍රිත අනෙකුත් සේවා සපයන්නන්, රක්ෂණ සමාගම්, විදේශයන්හි ප්‍රතිරක්ෂණ ධාරිතාවයක් සහිත රක්ෂණ තැරැව්කරුවන්, විදුලි සන්දේශ සමාගම් සහ තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවා (IT සහ ITES) අංශයන්හි සමාගම් ආවරණය කිරීම සඳහා මෙම සමීක්ෂණ වැඩිදියුණු කරන ලදී. 2015 අප්‍රේල් මාසයේ දී පැමිණීමට නියමිත ජා.මූ. අරමුදලෙහි තාක්ෂණික සහාය කණ්ඩායමේ සහාය ද ලබාගනිමින් වසර තුළ දී මෙම සමීක්ෂණයන්හි ආවරණය පුළුල් කිරීමට සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. 2015 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමේ දී 2014 සහ 2015 වර්ෂයන් සඳහා සේවා අංශයට අදාළ නව දත්ත සමූහයක් ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

විදේශීය අංශයට අදාළ සංඛ්‍යාන කාලානුරූපව පුවත්පත් නිවේදන, මාසික විවරණ, සතිපතා සහ මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන ආර්ථික දර්ශක, වාර්ෂික වාර්තාව සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා ආදිය මගින් ප්‍රකාශයට පත් කෙරෙයි. මහජනතාවට විදේශීය අංශයට අදාළ සියලු සංඛ්‍යාන තනි මූලාශ්‍රයකින් ලබා ගැනීමට අවස්ථාව සලසමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලු කාලීන දත්තයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් පිටුවෙහි ‘සංඛ්‍යාන > විදේශ අංශය’ යටතේ ප්‍රකාශයට පත් කර ඇත.

සමඟ පවත්නා සබඳතා ඉහළ නංවමින් 2014 වසරේ දී ශ්‍රී ලංකන් ගුවන් සමාගම 'OneWorld' ගෝලීය ගුවන් සේවා සමූහයේ කොටස්කරුවකු වූ අතර, එය ඉන්දියානු උප මහද්වීපයේ රටක් එවන් සමූහයකට එක් වූ පළමු අවස්ථාව වේ. ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් 2014 වසරේ දී නව ගුවන් යානා දෙකක් මිලදී ගත් අතර, දැනට පවතින ගුවන් යානා සංඛ්‍යාව 23 සිට 2015 වසරේ දී 28 දක්වා වැඩි කිරීම සඳහා නව ගුවන් යානා 5 ක් හඳුන්වා දීමට සැලසුම් කර ඇත. ශ්‍රී ලංකන් ගුවන් සමාගම සැලසුම් කර ඇති ආකාරයට නව ගුවන් යානා ලබා ගැනීම, ගුවන් ගාස්තු වැඩි කිරීම, ගුවන් ගමනාන්ත පුළුල් කිරීම සහ ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීම යනාදියෙහි ප්‍රතිඵලයක් ලෙස මැදිකාලයේ දී මගී ගාස්තු ලැබීම් වර්ධනය වනු ඇත. මේ අතර, 2015 අතුරු අයවැය මගින් මූල්‍යමය ශක්‍යතාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ මිහින් ලංකා ගුවන් සමාගම ඒකාබද්ධ කිරීමට යෝජනා කර ඇත.

2014 වසරේ දී නැව් කුලී, වරාය සහ ගුවන් තොටුපොළ ආශ්‍රිත සේවාවන් මත වූ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 1,077 ක් දක්වා සියයට 8.4 කින් වර්ධනය විය. කොළඹ වරායේ භාණ්ඩ තොග සහ බහලු මෙහෙයුම් ධාරිතාව ඉහළ යෑම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. කලාපය තුළ ජාත්‍යන්තර වෙළඳ කටයුතු වර්ධනය වීම නිසා වසර තුළ දී ප්‍රතිනැව්ගත කිරීම්හි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. තවද, ශ්‍රී ලංකාවේ ගුවන් මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ කර්මාන්තය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, 2014 වසරේ දී ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් සිය ප්‍රමුඛ පෙළේ පාරිභෝගිකයින් සමඟ ඉලෙක්ට්‍රොනික ගුවන් බිල්පත් (e - AWB) පිළිබඳ ගිවිසුම් කිහිපයක් අත්සන් කරන ලදී. මේ අතර, කොළඹ දකුණ වරායේ ධාරිතාව ඉහළ යෑම සහ ජාත්‍යන්තර වෙළඳ කටයුතුවල අපේක්ෂිත වර්ධනය මෙම අංශයෙහි ක්‍රියාකාරිත්වය තවදුරටත් වර්ධනය කරනු ඇත.

## විදේශ ගමන් සහ සංචාරක සේවා

අභ්‍යන්තර ගැටුම්කාරී තත්ත්වය නිමවීමෙන් පසුව ඇති වූ වර්ධන ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින් 2014 වසරේ දී සංචාරක කර්මාන්තය යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්වූ අතර, සංචාරක පැමිණීම් මිලියන 1.5 ක් වූ වාර්ෂික ඉලක්කය ඉක්මවීය. සංචාරක කර්මාන්තය සඳහා වූ ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළ යෑම, යටිතල පහසුකම් සංවර්ධනය, නවතම

සංචාරක ආකර්ෂණයන් සහ පෞද්ගලික අංශය හා රජය විසින් සිදු කරන ලද ප්‍රවර්ධන වැඩසටහන් මෙරටට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරී විය. ඒ අනුව, සංචාරක පැමිණීම් 2013 වසරේ දී වාර්තා කළ 1,274,593 ට සාපේක්ෂව 2014 වසරේ දී 1,527,153 ක් දක්වා සියයට 19.8 කින් වර්ධනය විය.

**2014 වසරේ දී ප්‍රධාන කලාප සියල්ලකින්ම වූ සංචාරක පැමිණීම් වර්ධනය විය.** බටහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයින් ප්‍රමාණය 479,007 ක් දක්වා සියයට 13.8 කින් වර්ධනය වීමත් සමඟ එය තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක ප්‍රභවය ලෙස පැවතුණි. කෙසේ වුවද, මුළු සංචාරක පැමිණීම්වලින් ප්‍රතිශතයක් ලෙස බටහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයින් 2012 වසරේ දී වූ සියයට 37.1 ට හා 2013 වසරේ දී වූ සියයට 33.0 ට සාපේක්ෂව 2014 වසරේ දී සියයට 31.4 ක් දක්වා තවදුරටත් පහත වැටුණි. මේ අතර, දෙවන විශාලතම සංචාරක ප්‍රභවය වන දකුණු ආසියානු කලාපය වෙතින් පැමිණි සංචාරකයින් ගණන ද මුළු සංචාරකයින්ගේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2013 වසරේ දී වාර්තා වූ සියයට 25.6 ට සාපේක්ෂව 2014 වසරේ දී සියයට 24.2 ක් දක්වා අඩු විය. අනෙකුත් කලාපවලින් වූ සංචාරක පැමිණීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම මීට හේතු විය. ඒ අනුව, නැගෙනහිර ආසියාව සහ නැගෙනහිර යුරෝපය තුළ ක්‍රියාත්මක කරන ලද ඵලදායී ප්‍රවර්ධන වැඩසටහන් හේතුවෙන් එම කලාපවලින් පැමිණි සංචාරකයින් මුළු සංචාරකයින්ගේ ප්‍රතිශතයක් ලෙස ඉහළ ගියේය. නැගෙනහිර ආසියාවෙන් පැමිණි සංචාරකයින්ගේ ඉහළ යෑම සඳහා චීනය, ඉන්දුනීසියාව සහ ජපානය සැලකිය යුතු දායකත්වයක් දැක් වූ අතර, නැගෙනහිර යුරෝපයෙන් වූ වර්ධනය සඳහා රුසියාව ප්‍රධාන වශයෙන්ම දායක විය. තනි රටක් ලෙස ගත් කල, ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණි රට ලෙස තවදුරටත් ඉන්දියාව පැවති අතර, අනතුරුව වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණි රටවල් වූයේ එක්සත් රාජධානිය, චීනය, ජර්මනිය සහ මාලදිවයිනයි. 2014 වසරේ දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් ප්‍රමාණයෙන් සියයට 46.1 ක් මෙම රටවල් පහෙන් පැමිණි සංචාරකයින්ගෙන් සමන්විත විය. සංචාරක පැමිණීම්හි ඉහළම වර්ධනය වන සියයට 136.1 ක් චීනයෙන් ද ඉන් අනතුරුව ඉන්දුනීසියාවෙන් (සියයට 68.5) සහ ඕමානයෙන් ද (සියයට 67.1) වාර්තා වූ අතර, එම රටවලින් වූ සංචාරක පැමිණීම් පිළිවෙළින් 128,166 ක්, 29,558 ක් සහ 12,756 ක් විය. සංචාරකයින්

**5.7 රූප සටහන**

**රටවල් අනුව සංචාරක පැමිණීම් - 2014**




**5.7 සංඛ්‍යා සටහන**

**සංචාරක ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2010 | 2011 | 2012 | 2013 | 2014 (අ) | වාර්ෂික වෙනස්වීම % 2014 (අ) |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් (සංඛ්‍යාව) | 654,476 | 855,975 | 1,005,605 | 1,274,593 | 1,527,153 | 19.8 |
| පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන | | | | | | |
| විනෝදාස්වාදය | 516,538 | 687,830 (ආ) | 748,436 | 915,208 (ආ) | 1,037,644 (ඇ) | 13.4 |
| ව්‍යාපාර | 83,270 | 68,436 (ආ) | 90,040 | 67,946 (ආ) | 29,381 (ඇ) | -56.8 |
| වෙනත් | 54,668 | 99,709 (ආ) | 167,129 | 291,439 (ආ) | 460,128 (ඇ) | 57.9 |
| සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්) | 6,548 | 8,559 | 10,056 | 10,961 | 15,119 | 37.9 |
| කාමර උපයෝජන අනුපාතය (%) | 70.2 | 77.1 | 71.2 | 71.7 | 74.3 | 3.6 |
| දළ සංචාරක ලැබීම් (රු. මිලියන) | 65,018 | 91,926 | 132,427 | 221,720 | 317,479 | 43.2 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.) | 99,344 | 107,393 | 131,688 | 173,954 | 207,889 | 19.5 |
| මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) | 132,055 | 138,685 | 162,869 | 270,150 | 299,890 | 11.0 |
| සෘජු සේවා නියුක්තිය | 55,023 | 57,786 | 67,862 | 112,550 | 129,790 | 15.3 |
| වක්‍ර සේවා නියුක්තිය (ඇ) | 77,032 | 80,899 | 95,007 | 157,600 | 170,100 | 7.9 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ඇස්තමේන්තු

මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

පැමිණීමේ අරමුණු සැලකීමේ දී බහුතරයක් (සියයට 68.0 ක්) විවේකය ගත කිරීම සඳහා පැමිණ ඇත. මුළු සංචාරකයින්ගේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණි සංඛ්‍යාව 2013 වසරේ දී වාර්තා වූ සියයට 5.3 සිට 2014 වසරේ දී සියයට 1.9 ක් දක්වා අඩු වූ අතර, ඥාති මිත්‍රාදීන් මුණගැසීම, ආගමික හා සංස්කෘතික කටයුතු, සෞඛ්‍ය, අධ්‍යාපන හා ක්‍රීඩා කටයුතු ආදී වෙනත් අරමුණු සඳහා පැමිණි සංඛ්‍යාව 2013 වසරේ දී වූ සියයට 22.9 ට සාපේක්ෂව 2014 වසරේ දී සියයට 30.1 ක් දක්වා ඉහළ ගොස් ඇත.

**2014 වසරේ දී සංචාරක ඉපැයුම් අඛණ්ඩව ඉහළ වර්ධනයක් වාර්තා කළේය.** සංචාරක අංශයේ විදේශ විනිමය ලැබීම් 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,715 ට සාපේක්ෂව 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,431 ක් දක්වා සියයට 41.7 කින් ඉහළ ගියේය. විදේශ සංචාරක පැමිණීම් ඉහළ යෑම මෙන්ම සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයෙකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය කාලය ඉහළ යෑම, සංචාරක ඉපැයුම් වර්ධනය වීම සඳහා හේතු විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක වියදම් හා සංචාරකයින් මෙරට ගත කරන කාලය පිළිබඳව වාර්ෂිකව සිදු කරනු ලබන සමීක්ෂණයේ නවතම දත්තවලට අනුව 2013 වසරේ දී එ.ජ. ඩොලර් 156.5 ක් ලෙස වාර්තා වූ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2014 වසරේ දී එ.ජ. ඩොලර් 160.8 ක් දක්වා ඉහළ ගොස් ඇත. මේ අතර, සංචාරකයෙකු මෙරට ගත කරන දින ගණනෙහි සාමාන්‍යය 2013 වසරේ දී දින 8.6 ක් වූ අතර, 2014 වසරේ දී එය දින 9.9 ක් දක්වා ඉහළ ගියේය. ඉහළ ක්‍රය ශක්තියක් සහිත සංචාරකයින්ගේ පැමිණීම් සාපේක්ෂ වශයෙන් ඉහළ යෑම, මෙම අංශයෙහි ඉපැයීම් ඉහළ යෑමට හිතකර ලෙස දායක විය. මේ අතර, ශ්‍රී ලාංකිකයින් විසින් විදේශ රටවල කරන සංචාරයන් සඳහා වූ වියදම

**5.8 රූප සටහන** **සංචාරක පැමිණීම් සහ ඉපැයීම්**




2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,263 ක් දක්වා සියයට 6.3 කින් ඉහළ ගිය අතර, ඒ අනුව සංචාරක සේවා උප අංශයේ ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 1,169 ක් ලෙස වාර්තා විය.

**2014 වසරේ දී සංචාරක අංශය වෙනුවෙන් කරන ලද ආයෝජන තවදුරටත් පුළුල් විය.** වසර තුළ දී ෂැන්ග්‍රිලා (Shangri-La), හයට් (Hyatt), මුවන්පික් (Movenpick), ෂෙරටන් (Sheraton), RUI, නෙක්ස්ට් (Next), බෙස්ට් වෙස්ටන් (Best Western) සහ සෙන්ටරා (CENTARA) ඇතුළු ජාත්‍යන්තර හෝටල් ජාලවල ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු විය. 2014 වසර තුළ දී නව හෝටල් ව්‍යාපෘති 68 ක් සඳහා ආයෝජන යෝජනා ලැබී ඇති අතර, එ.ජ ඩොලර් මිලියන 423.4 ක වටිනාකමක් සහිත හෝටල් ව්‍යාපෘති 40 ක් සඳහා අවසාන අනුමැතිය ලබා දී ඇත. තව ද, සංචාරක ක්ෂේත්‍රයට හෝටල් කාමර 1,112 ක් එකතු කරමින් නව හෝටල් ව්‍යාපෘති 20 ක් සිය සේවා සැපයීමේ කටයුතු මෙම වසර තුළ දී ආරම්භ කර ඇති අතර, එමගින් ධාරිතාව තවදුරටත් පුළුල් විය. රටේ ගැටුම්කාරී වාතාවරණය අවසන් වීමෙන් පසු නැගෙනහිර හා උතුරු පළාත්වල සංචාරක කටයුතුවල පිබිදීමක් සිදු වූ අතර, දේශීය හා විදේශීය ආයෝජකයින් ක්‍රමයෙන් එම පළාත් වෙත යොමු වීමක් දක්නට ලැබිණි. මීට අමතරව, මෙම පළාත්හි කුඩා හා මධ්‍යම පරිමාණයේ පෞද්ගලික ආයෝජන රැසක් ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කල්පිටිය, කුච්චවේලි සහ යාල ප්‍රදේශයන්හි පිළිවෙළින් දූපත් නවාතැන් (Island Resort), වෙරළාශ්‍රිත නවාතැන් (Beach Resort) සහ වනාන්තර ආශ්‍රිත නවාතැන් (Wildlife Resort) යන තේමාවන් යටතේ සංචාරක කලාප ව්‍යාපෘති තුනක කටයුතු ආරම්භ කරන ලදී. 2014 වසරේ දී සුපිරි මට්ටමේ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සංචාරක හෝටලයක් සෑදීම සඳහා කුච්චවේලි ප්‍රදේශයේ අක්කර 11 ක ඉඩමක් බදු දී ඇත. මේ අතර, පාසිකුඩා සංචාරක නිකේතන සංවර්ධන ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, ඒ යටතේ 2014 වසරේ දී හෝටල් 8 ක් ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත.

**සංචාරක ප්‍රවර්ධනයෙහි ඇති වැදගත්කම වසර තුළදී සිදු කරන ලද ක්‍රියාකාරකම් තුළින් ඉස්මතු කෙරේ.** දේශීය සංචාරක කර්මාන්තකරුවන්ට ව්‍යාපාර සබඳතා ඇති කර ගැනීම සහ ඔවුන්ගේ දැනට පවත්නා වෙළඳ සබඳතා ශක්තිමත් කරගැනීම සඳහා අවස්ථාවක් ලබාදෙමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2014 වසරේ දී සංචාරක වෙළඳපොළවල් 30 කට සහභාගී විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ප්‍රධාන සංචාරක නිෂ්පාදිත තේමා අටක් යටතේ ජපානයේ

පැවති විදේශ ගමන් සහ සංචාරක වෙළඳපොළට ද ශ්‍රී ලංකාවේ ඓතිහාසික විභූතිය විදහා දැක් වූ ජාත්‍යන්තර ප්‍රංශ සංචාරක වෙළඳපොළට ද සහභාගි විය. 'Sri Lanka Shines in Shanghai' නමින් මහා පරිමාණයේ ඒකාබද්ධ සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් චීනයේ ෂෙංහයිහිදී පැවති අතර, චීන සංචාරකයින් හා වෙළඳ හවුල්කරුවන් තවදුරටත් ආකර්ෂණය කර ගැනීම සඳහා සංචාරක සහ වෙළඳ ප්‍රවර්ධන ව්‍යාපාරික සමුළුවක් ද පවත්වන ලදී. මේ අතර ශ්‍රී ලංකාව සහ චීනය අතර සංචාරක ප්‍රවර්ධන කටයුතුවල වැදගත්කම හඳුනාගනිමින් රටවල් දෙක අතර සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. 2014 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 'ගෝලීය මහා පරිමාණ ප්‍රවර්ධන වැඩසටහන' ආරම්භ කරන ලදී. මෙම ප්‍රවර්ධන වැඩසටහනෙහි අංගයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක ආකර්ෂණීය ස්ථාන පිළිබිඹු වන පරිදි සැකසූ කුලී රථ 1,200 ක් එක්සත් රාජධානිය, ප්‍රංශය සහ ජර්මනිය ඇතුළු සංචාරකයින් පැමිණෙන ප්‍රධාන රටවල යොදවන ලදී. චීනයේ ප්‍රධාන නගර 4 ක බස් රථ 200 ක් යොදා ගනිමින් මාස 9 ක් පුරා බස් රථ දැන්වීම් ව්‍යාපාරයක් සංවිධානය කරන ලදී. මේ අතර, 2014 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය රටවල් 9 ක මාධ්‍යවේදීන් 124 දෙනෙකු සඳහා අනුග්‍රහය දක්වා ඇත. තවද, ශ්‍රී ලාංකිකයින්ට සහ ලෝකයේ නන් දෙසින් පැමිණෙන සංචාරකයින්ට කොළඹ නගරයේ වැදගත් ස්ථාන නැරඹීම සඳහා විවෘත තට්ටුවක් සහිත බස් රථ සේවාවක් ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ සිදු වූ යහපත් සංවර්ධන ප්‍රතිඵල පිළිබිඹු කරමින් 2014 ජනවාරි මාසයේ පැවති වාර්ෂික සංචාරක ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී චීනයේ 'Travel and Leisure' සඟරාව මගින් ශ්‍රී ලංකාව හොඳම සංචාරක ගමනාන්තය ලෙස හඳුනා ගෙන තිබේ. 'Forbes' සඟරාව මගින් ද 2015 වසරේ දී ලෝකයේ සංචාරය කිරීමට සුවදායක රටවල් 10 අතුරෙන් එකක් ලෙස ශ්‍රී ලංකාව නම් කර ඇත.

**2016 වසරේ දී මිලියන 2.5 ක සංචාරක පැමිණීම් ඉලක්කය සපුරා ගැනීම සඳහා 2015 සහ 2016 වසරවල දී සංචාරක පැමිණීම්හි සියයට 28 ක පමණ වාර්ෂික වර්ධන වේගයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.** මෙරටට පැමිණේ යැයි අපේක්ෂිත සංචාරකයින් සඳහා පහසුකම් සැලසීමට දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සංචාරක හෝටල් ව්‍යාපෘති නියමිත කාලයට නිම කිරීම අවශ්‍ය වේ. තවද, වර්තමානයේ පුහුණුව ලැබූ පිරිස, ඉදිරි ඉල්ලුම සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් අමතර පුහුණු මානව සම්පත් අවශ්‍ය වේ. එමනිසා, ඉදිරි වර්ෂවල දී මානව සම්පත් හිඟකම මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන අභියෝගයක් වන අතර, අදාළ බලධාරීන් මේ සඳහා කඩිනම් පියවර ගත යුතු වේ. ගෝලීය සංචාරක කර්මාන්තය තුළ නව තරගකාරී වෙළඳපොළවල් මතුවෙමින් පවතින බැවින් විශේෂයෙන්ම සාම්ප්‍රදායික නොවන වෙළඳපොළවල් වෙතින් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගත යුතු වේ. මැදිකාලීනව සිට දිගුකාලීනව සංචාරක කර්මාන්තයේ තිරසාර වර්ධනය පවත්වා ගැනීම සහතික කිරීම සඳහා සන්නාම ගතකිරීම සහ ක්‍රමෝපායික ලෙස ප්‍රතිස්ථාපනය කිරීම ද අත්‍යවශ්‍ය වේ.

### විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා

**2014 වසරේ දී සන්නිවේදන, පරිගණක සහ තොරතුරු සේවා අපනයනය තුළින් එ.ජ. ඩොලර් මිලියන 748 ක විදේශ විනිමය ප්‍රමාණයක් ඉපැයූ අතර, එය 2013 වසරට සාපේක්ෂව සියයට 4.1 ක වර්ධනයකි.** සන්නිවේදන සේවා උප අංශය එ.ජ. ඩොලර් මිලියන 120 ක දළ ලැබීම් ප්‍රමාණයක් සමඟින් 2014 වසරේ දී සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කළේය. ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් මත වූ ඉපැයුම් වැඩි වීම සහ දත්ත සම්ප්‍රේෂණය සඳහා කල්බදු පදනම මත ලබාගත් පරිපථ භාවිතය වැඩි වීම හේතුවෙන් ඒ ආශ්‍රිත ඉපැයුම් වැඩි වූ අතර, ඒ තුළින් සන්නිවේදන සේවා මත වූ දළ ලැබීම් වර්ධනය විය. අඛණ්ඩව සිදුවන තාක්ෂණික දියුණුව සමග සන්නිවේදන සේවාවන් ශීඝ්‍රයෙන් වර්ධනය වීම මගින් අධිවේගී අන්තර්ජාල පහසුකම් භාවිතය මෙන්ම චන්ද්‍රිකා සහ රූහැන් සහිත රූපවාහිනී පහසුකම් භාවිතය 2014 වසර තුළ දී ඉහළ ගියේය. කලාපයේ සම මට්ටමේ රටවල් සමඟ සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ විදුලි සන්දේශ කර්මාන්තය අති නවීන තාක්ෂණය භාවිත කරනු දැකිය හැකි අතර, විදුලි සන්දේශ සේවා සැපයුම්කරුවන් දෙදෙනෙකු සිව්වන පරම්පරාවේ දිගුකාලීන විකාශන (Fourth Generation Long Term Evolution - 4G LTE) සේවා දැනටමත් ආරම්භ කර ඇත. මේ අතර, ස්ථාවර මෙන්ම ජංගම දුරකථන සේවා ආයතන විසින් ජාත්‍යන්තර ඇමතුම් සඳහා අයකරන දුරකථන ගාස්තු අඩු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවෙන් විදේශීය රටවලට ලබා ගන්නා දුරකථන ඇමතුම් වැඩි වීම තුළින් සන්නිවේදන සේවා ආශ්‍රිත ගෙවීම් වර්ධනය විය.

**පරිගණක සහ තොරතුරු සේවා උප අංශයෙහි සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.** 2014 වසරේ දී පරිගණක හා තොරතුරු සේවා උප අංශය තුළින් වූ ඉපැයුම් 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 604 හා සැසඳීමේ දී සියයට 3.9 කින් වර්ධනය වෙමින් එ.ජ. ඩොලර් මිලියන 628 ක් විය. ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) වැනි මෘදුකාංග සහ තොරතුරු

තාක්ෂණය පදනම් කරගත් සේවා (ITES) මත වූ ලැබීම් මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. මෙම සේවා අංශ ඉදිරි කාලය තුළ ඉහළ වර්ධන ශක්‍යතාවයක් ඇති අංශ ලෙස හඳුනා ගෙන ඇත. 2014 වසරේ දී ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණය (IT) සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ කර්මාන්තය පිළිබඳ පවත්නා පිළිගැනීම සැලකිය යුතු ලෙස වර්ධනය විය. ගෝලීය වශයෙන් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ ප්‍රධාන ස්ථානයන් නම් කිරීමේ AT Kearney Global Services Location Index (GSLI) - 2014 නැමැති දර්ශකය අනුව ශ්‍රී ලංකාව ස්ථානයන් 05 ක් ඉදිරියට එමින් 16 වන ස්ථානයට පත්වීමෙන් මෙම පිළිගැනීම පිළිඹිබු වේ. මීට අමතරව, Gartner ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාව පළමු රටවල් 30 අතරට ඇතුළත්ව ඇත. තවද, ශ්‍රී ලංකාවේ ඊ-රාජ්‍ය ක්‍රියාමාර්ගයන්හි අඛණ්ඩ ප්‍රවර්ධනය අගයනු පිණිස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දකුණු ආසියාවේ පළමු ස්ථානය ශ්‍රී ලංකාව ලෙස ශ්‍රේණිගත කර ඇත. 2014 වසරේ එක්සත් ජාතීන්ගේ ඊ-රාජ්‍ය සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාව රටවල් 192 ක් අතරින් ස්ථානයන් 41 ක් ඉදිරියට පැමිණෙමින් 74 වන ස්ථානයට පත්ව ඇත. මේ අතර, Sri Lanka Association of Software and Serives Companies (SLASSCOM) විසින් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ පර්යේෂණයන්හි සක්‍රීය ලෙස නිරතවීම සඳහා සහ පරිගණක හා තොරතුරු සේවා අංශයෙහි යටිතල පහසුකම් තවදුරටත් වර්ධනය කිරීම සඳහා 'Campus Direct Link' නම් මාර්ගගත (online) ජාලය ආරම්භ කරන ලදී.

### 5.4.2 ප්‍රාථමික ආදායම

**2014 වසරේදී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා සහ බැංකු අංශය නිකුත් කළ බැඳුම්කර සඳහා පොලී ගෙවීම් වැඩි වූ අතර, ඒ හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් වුවද ඉහළ ගියේය.** 2014 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය, 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,751 සමග සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,839 දක්වා ඉහළ ගියේය. සංචිත වත්කම් ආයෝජනය කිරීමෙන් ලද ආදායම සහ සෘජු ආයෝජන සඳහා ලද ලාභාංශ වැඩි වීම ප්‍රාථමික ආදායම් ගිණුමෙහි ලැබීම් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, සේවක වැටුප් තුළින් ලද ආදායම ද සුළු වශයෙන් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාථමික ආදායම් ගිණුමෙහි ලැබීම් 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 132 සිට 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 153 දක්වා ඉහළ ගියේය.

**ප්‍රධාන වශයෙන් ණය සුරැකුම්පත් මත වූ පොලී ගෙවීම් වැඩි වීම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ විදේශ විනිමය ගෙවීම් ඉහළ ගියේය.** ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,883 සිට 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,992 ක් දක්වා ඉහළ ගියේය. 2014 වසරේ ආදායම් ගිණුමේ මුළු ගෙවීම්වලින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා සහ බැංකු අංශය නිකුත් කළ බැඳුම්කර සඳහා වූ පොලී ගෙවීම් පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 264 ක් සහ එ.ජ. ඩොලර් මිලියන 137 ක් විය. රජය ලබාගත් ණය සඳහා වූ පොලී ගෙවීම් 2014 වසරේ දී සුළු වශයෙන් ඉහළ ගියේය. එ.ජ. ඩොලර් මිලියන 69 ක් වූ විවිධ ආයෝජන හිමිකම් කොටස් සඳහා ලාභාංශ ගෙවීම් වසර තුළ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් ඉහළ යෑමට හේතු විය. කෙසේ නමුත්, 2014 වසරේ දී සෘජු ආයෝජන සඳහා ලාභාංශ ගෙවීම් සහ ප්‍රතිආයෝජනය කළ ඉපැයුම් 2013 වසරේ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 737 සිට එ.ජ. ඩොලර් මිලියන 698 ක් දක්වා අඩු වූ අතර, පෞද්ගලික අංශය සහ රාජ්‍ය සංස්ථා ලබාගත් ණය සඳහා වූ පොලී ගෙවීම් වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 78 ක් දක්වා සියයට 23.3 කින් අඩු විය. නොපියවා ඉතිරිව ඇති රාජ්‍ය සුරැකුම්පත් මත වූ කූපන ගෙවීම්වල විශාල වෙනසක් සිදු නොවූ අතර, ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකමෙහි නොපියවා ඉතිරිව ඇති ශේෂය අඩු වීමත් සමග 2014 වසරේ දී ඒ සඳහා වූ පොලී ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 20 දක්වා අඩු විය.

### 5.4.3 ද්විතීයික ආදායම

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ රාජ්‍ය සංක්‍රාමවලින් සමන්විත ද්විතීයික ආදායම් ගිණුම 2014 වසරේ දී සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කළේය.** ද්විතීයික ආදායම් ගිණුමේ ලැබීම් 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 7,046 ක් දක්වා සියයට 9.6 කින් වර්ධනය විය. ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ මුළු ලැබීම් තුළ සියයට 99 කට වඩා ඉහළ දායකත්වයක් දරන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉහළ යාම මේ සඳහා මූලිකවම හේතු විය. 2014 වසරේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 6,407 සිට එ.ජ. ඩොලර් මිලියන 7,018 දක්වා සියයට 9.5 කින් වර්ධනය වූ අතර, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය වීම මගින් වෘත්තීය හා පුහුණු අංශයන්ට අයත් ශ්‍රම සංක්‍රමණ අඛණ්ඩව වර්ධනය වීම පිළිබිඹු කෙරිණි. වෘත්තීය හා පුහුණු අංශයන්ට අයත් ශ්‍රම සංක්‍රමණ 2013 වසරට සාපේක්ෂව අඩු අගයකින් වුවද 2014 වසර තුළදී සියයට 5.6 කින් වර්ධනය වී ඇත. මේ අතර, 2014 වසරේ දී නුපුහුණු අංශයට අයත් ශ්‍රම සංක්‍රමණවල විශාල වෙනසක් සිදු නොවූ අතර, සියයට 0.1 ක සුළු වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, 2014 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සමස්ත සංඛ්‍යාව, 2013 වසරේ වාර්තා කළ 293,218 සිට 300,413 දක්වා සියයට 2.5 කින් වර්ධනය විය.

## 5.5 ජංගම ගිණුමේ ශේෂය

වසරේ දෙවන භාගයේදී වෙළෙඳ ගිණුමේ හිඟය වැඩිවීම හමුවේ වුවද 2014 වසරේ දී ජංගම ගිණුමේ ශේෂය වර්ධනය විය. වසරේ පළමු භාගයේ දී වර්ධනය වූ වෙළඳ ශේෂය, ආනයන ඉහළ යෑම සහ අපනයන මන්දගාමී වීම හමුවේ වසරේ දෙවන භාගයේ දී පහත වැටුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2014 වසරේ දී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් විය. කෙසේ නමුත්, සේවා ගිණුමෙහි අතිරික්තය සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ තුළින් වෙළඳ සහ ආදායම් ගිණුම්වල හිඟයෙන් කොටසක් පියවුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2014 වසරේ දී ජංගම ගිණුමේ හිඟය 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 2,541 ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,018 ක් දක්වා අඩු විය. තවද, 2013 වසරේ දී ද.දේ.නියේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.8 ක් වූ ජංගම ගිණුමේ හිඟය 2014 වසරේ දී ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.7 දක්වා අඩු විය.

## 5.6 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

ප්‍රාග්ධන සංක්‍රාම ලැබීම් අඩු වීම හේතුවෙන් 2014 වසරේ දී ප්‍රාග්ධන ගිණුමේ ශේෂය අඩු විය. 2014 වසරේ දී ප්‍රාග්ධන ගිණුමෙහි ශුද්ධ ලැබීම් 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 71 සමග සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 58 දක්වා අඩු විය. පෞද්ගලික සමාගම් සහ කුටුම්බයන් වෙත වූ ප්‍රාග්ධන ප්‍රදාන 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 51 සිට 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 21 දක්වා අඩු වීම මේ සඳහා මූලික වශයෙන් හේතු විය. මේ අතර, රජයට ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන 2013 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 39 සමග සැසඳීමේ දී 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 52 ක් දක්වා වර්ධනය විය.

## 5.7 මූල්‍ය ගිණුම

2014 වසරේ දී මූල්‍ය ගිණුම අඛණ්ඩව ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා කළේය. මෙය, වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 2,303 ක් වූ ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් එ.ජ. ඩොලර් මිලියන 4,239 ක් වූ ශුද්ධ විදේශ වගකීම්වල වෙනස්වීම් මගින් ඉක්මවා යාම තුළින් පිළිබිඹු විය. හයවන සහ හත්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම්වලින් ලද එ.ජ. ඩොලර් බිලියන 1.5 ක මුදල 2014 වසරේ දී මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධානතම ලැබීම විය. තැන්පතු භාර ගන්නා ආයතන ලබා ගත් ණය ලැබීම් සහ සෘජු ආයෝජන සම්බන්ධ ලැබීම් හා පෞද්ගලික අංශයේ ණය ගැනීම් ද මූල්‍ය ගිණුමට දායක වූ අතර, රජය වෙත වූ විදේශීය ණය ලැබීම් අඩු මට්ටමක

**5.9 රූප සටහන මූල්‍ය ගිණුමේ ලැබීම්**




පැවතුණි. ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් නිකුත් කළ ජාත්‍යන්තර බැඳුම්කරය සහ බැංකු අංශය හා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ සෘජු ආයෝජන ලැබීම්, පෞද්ගලික අංශය වෙත වූ ප්‍රධාන ලැබීම් විය. 2014 වසරේ අග භාගයේ දී නැගී එන ආර්ථිකයන් වෙතින් විදේශීය ආයෝජන ගලා යාම හමුවේ කොළඹ කොටස් වෙළඳපොළෙහි සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු විය. මේ අතර, සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනුවල සිදු වූ ඉහළ යෑම සහ බැංකු අංශය විසින් මූල්‍ය වත්කම් අත්කර ගැනීම් සුළු වශයෙන් වුවද ඉහළ යෑම ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම කරුණු හේතුවෙන් මූල්‍ය ගිණුමෙහි ශුද්ධ ලැබීම් 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,064 සමග සැසඳීමේ දී 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,936 ක් දක්වා අඩු විය.

### 5.7.1 සෘජු ආයෝජන

ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් විසින් ආයෝජන කාර්යයන් සඳහා ලබාගත් විදේශීය ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම් 2014 වසරේ දී සුළු ඉහළ යාමක් පෙන්නුම් කළේය. සමස්ත සෘජු ආයෝජන ප්‍රමාණය, 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,437 සමග සැසඳීමේ දී 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,685 ක් විය. මේ අතර, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ඉවත් කළ පසු සෘජු ආයෝජන ප්‍රමාණය 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 933 සමග සැසඳීමේ දී 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 944 ක් විය. මෙය ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 782 කින් ද ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි වූ සමාගම් වෙත වූ එ.ජ. ඩොලර් මිලියන

**5.8.අ සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම (BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන

| ශීර්ෂය | 2013 (අ) | | 2014 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| මූල්‍ය ගිණුම | **986** | **4,049** | **2,303** | **4,239** |
| සෘජු ආයෝජන | **65** | **933** | **67** | **944** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | 65 | 410 | 67 | 518 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම් | 65 | 60 | 67 | 137 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 65 | 60 | 67 | 137 |
| ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් | - | 16 | - | 10 |
| ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි නොවූ සමාගම් | - | 44 | - | 62 |
| අනෙකුත් සමාගම් | - | -0.5 | - | 65 |
| ප්‍රතිආයෝජිත ඉපැයුම් | - | 350 | - | 381 |
| ණය උපකරණ | - | 522 | - | 427 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | - | 522 | - | 427 |
| ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් | - | 517 | - | 426 |
| කොටස් හිමියන්ගේ අත්තිකාරම් | - | 370 | - | 208 |
| අන්තර් සමාගම් ණය | - | 150 | - | 224 |
| ණය ගෙවීම් | - | -3 | - | -6 |
| ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි නොවූ සමාගම් | - | 5 | - | 1 |
| විවිධ ආයෝජන | **-** | **2,068** | **-** | **1,996** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | - | 226 | - | 184 |
| කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි සමාගම් | - | 226 | - | 184 |
| ණය සුරැකුම්පත් | - | 1,843 | - | 1,812 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 1,350 | - | 250 |
| දිගු කාලීන | - | 1,350 | - | 250 |
| රජය | - | 493 | - | 1,387 |
| කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්) | - | -80 | - | -173 |
| දිගු කාලීන | - | 572 | - | 1,560 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 572 | - | 60 |
| ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 1,500 |
| අනෙකුත් අංශ | - | - | - | 175 |
| දිගු කාලීන | - | - | - | 175 |
| මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - | - |
| අනෙකුත් ආයෝජන | **-191** | **1,048** | **688** | **1,298** |
| මුදල් සහ තැන්පතු | -459 | 108 | 276 | -292 |
| මහ බැංකුව | - | -199 | - | 1 |
| කෙටි කාලීන | - | 1 | - | 1 |
| දිගු කාලීන | - | -200 | - | - |
| තැන්පතු භාරගන්නා ආයතන | -459 | 307 | 276 | -293 |
| කෙටි කාලීන | -221 | 307 | 142 | -293 |
| දිගු කාලීන | -238 | - | 134 | - |
| පිටු අංක 134 හා සම්බන්ධයි... | | | | |
| විශේෂිත අයිතමයන් | | | | |
| කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම් | | **270** | | **163** |
| සෘජු ආයෝජන | | 44 | | -22 |
| විවිධ ආයෝජන | | 226 | | 184 |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙත වූ ශුද්ධ ආයෝජන (ස්වෛරීත්ව බැඳුම්කර හැර) | | **493** | | **-113** |
| විදේශීය මිලදී ගැනීම් | | 2,434 | | 1,775 |
| විදේශීය විකුණුම් | | 1,941 | | 1,889 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

62 කින් ද, අනෙකුත් පුද්ගලික සමාගම් වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 100 කින් ද සමන්විත විය. ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ ලැබීම් හිමිකම් ප්‍රාග්ධන කොටස් එ.ජ. ඩොලර් මිලියන 10 කින් ද, කොටස් හිමියන්ගේ අත්තිකාරම් එ.ජ. ඩොලර් මිලියන 208 කින් ද, අන්තර් සමාගම් ණය එ.ජ. ඩොලර් මිලියන 224 කින් ද, එ.ජ. ඩොලර් මිලියන 6 ක ණය ආපසු ගෙවීම් සමඟ ප්‍රතිආයෝජනය කළ ඉපැයුම් එ.ජ. ඩොලර් මිලියන 346 කින් ද සමන්විත විය. විදේශීය ණය සාපේක්ෂව අඩු පිරිවැයක් යටතේ ලබාගත හැකි වීම හේතුවෙන් සමාගම් විසින් දිගු කාලීන විදේශීය ණය ලබා ගැනීම ඉහළ යෑමේ ප්‍රවණතාවක් දැක ගත හැකි විය. මෙය, 2014 වසරේ දී ශ්‍රී ලංකන් ගුවන් සමාගම එ.ජ. ඩොලර් මිලියන 175 ක ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම ඇතුළුව සෘජු ආයෝජන සමාගම් එ.ජ. ඩොලර් මිලියන 741 ක විදේශීය ණය ලබා ගැනීම මගින් ද පිළිබිඹු කෙරිණි.

**යටිතල පහසුකම් සහ සේවා යන අංශයන් විසින් වැඩිම විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගන්නා ලදී.** මුළු සෘජු ආයෝජන ලැබීම්වලින් පිළිවෙළින් සියයට 42.2 ක් හා සියයට 36.8 ක් යටිතල පහසුකම් සහ සේවා යන අංශයන්ට ලැබුණු අතර, සියයට 20.7 ක් නිෂ්පාදන අංශය ආකර්ෂණය කර ගත්තේය. යටිතල පහසුකම් අංශය වෙත ලැබුණු සෘජු ආයෝජන ප්‍රධාන වශයෙන් නිවාස සහ දේපළ සංවර්ධනය, වරාය හා බහලු පර්යන්ත සහ දුරකථන හා විදුලි සන්දේශ ජාල සේවා යන උප අංශයන් වෙත යොමු විය. සේවා අංශය වෙත වූ ලැබීම් ප්‍රධාන වශයෙන් ගුවන් සේවා, හෝටල් හා ආපනශාලා සේවා සහ තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන උප අංශයන් වෙත යොමු විය. මේ අතර, 2014 වසරේ දී විදේශීය ආයෝජන ගෙවීම් 2013 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 65 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 67 ක් විය.

### 5.7.2 විවිධ ආයෝජන

#### හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්

**2014 වසරේ දී, කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි සමාගම් වෙත වූ සෘජු ආයෝජන හැර අනෙකුත් විදේශීය ආයෝජනවලින් සමන්විත හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් ලැබීම් පහත වැටුණි.** ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රමාණාත්මක ලිහිල්කරණ වැඩසටහන සීමා කිරීම හමුවේ නැගී එන වෙළඳපොළ තුළ පැවති ආයෝජකයින්ගේ විශ්වාසය අඩු වීම පිළිබිඹු කරමින් කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විවිධ ආයෝජන මන්දගාමී විය. ඒ අනුව, 2014 වසරේ දී

කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ලැබීම් 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 226 සමඟ සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 184 ක් ලෙස සියයට 18.4 කින් අඩු විය. 2014 වසරේ කොටස් වෙළෙඳපොළ වෙත වූ ලැබීම් ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු මගින් ලද එ.ජ. ඩොලර් මිලියන 180 කින් සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු මගින් ලද එ.ජ. ඩොලර් මිලියන 4 කින් සමන්විත විය.

### ණය සුරැකුම්පත්

**2014 වසරේ දී මූල්‍ය ගිණුමේ ණය සුරැකුම්පත් වෙත වූ ප්‍රධානතම ලැබීම වශයෙන් සටහන් වූයේ රජය විසින් සිදු කළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවයි.** ශ්‍රී ලංකාව 2014 වසරේ ජනවාරි මාසයේ දී සහ අප්‍රේල් මාසයේ දී පිළිවෙළින් එ.ජ. ඩොලර් බිලියනයක සහ එ.ජ. ඩොලර් මිලියන 500 ක ජාත්‍යන්තර බැඳුම්කර දෙකක් නිකුත් කළේය. බැඳුම්කර නිකුතුව සිදු වූ කාලපරිච්ඡේදයේ දී ගෝලීය ප්‍රාග්ධන වෙළඳපොළෙහි පැවති ඉහළ උච්චාවචනයන් සහ පොලී අනුපාතිකය පිළිබඳ මිනුම වශයෙන් සැලකෙන එක්සත් ජනපද බැඳුම්කර ඵලදා අනුපාතිකය ඉහළ යෑම හමුවේ වුව ද මෙම පස් අවුරුදු බැඳුම්කර පිළිවෙළින් වාර්ෂිකව සියයට 6.00 ක සහ සියයට 5.125 ක තරගකාරී ඵලදා අනුපාතික සහිතව නිකුත් කරන ලදී. නැගී එන ප්‍රාග්ධන වෙළඳපොළ කෙරෙහි ආයෝජකයින් තුළ වූ විශ්වාසය අඩු වීම රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළින් ද නිරීක්ෂණය කළ හැකි වූ අතර, රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙළඳපොළ 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 493 ක ශුද්ධ ලැබීම් ප්‍රමාණයට සාපේක්ෂව 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 113 ක ශුද්ධ ගෙවීම් ප්‍රමාණයක් වාර්තා කිරීම මගින් ද එය පිළිබිඹු වේ. පෞද්ගලික අංශය මගින් සිදු කළ ණය සුරැකුම්පත් නිකුත් කිරීම යටතේ ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් 2014 ජූනි මාසයේ දී නිකුත් කරන ලද එ.ජ. ඩොලර් මිලියන 175 ක පස් අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කරය වාර්ෂිකව සියයට 5.3 ක ඵලදා අනුපාතිකයක් අත්කර ගත්තේය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව ද වාර්ෂිකව සියයට 5.15 ක ඵලදා අනුපාතිකයක් සහිත එ.ජ. ඩොලර් මිලියන 250 ක වටිනාකමකින් යුත් පස් අවුරුදු බැඳුම්කරයක් 2014 සැප්තැම්බර් මාසයේ දී නිකුත් කළේය.

## 5.7.3 වෙනත් ආයෝජන

### මුදල් සහ තැන්පතු

**2014 වසර තුළ දී මුදල් සහ තැන්පතුවලට අදාළ ගනුදෙනු මත වූ වත්කම් හා වගකීම් ඉහළ ගියේය.** ඒ අනුව, තැන්පතු භාර ගන්නා ආයතනවල පවත්නා මුදල් සහ තැන්පතු ශුද්ධ වත්කම් අත්කර ගැනීම් හා සම්බන්ධ ගනුදෙනු, 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 459 ක ශුද්ධ අඩුවීම සමඟ සැසඳීමේ දී 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 276 ක ශුද්ධ වැඩිවීමක් වාර්තා කළේය. තවද, ප්‍රධාන වශයෙන් 2014 වසරේ තැන්පතු භාර ගන්නා ආයතනයන්හි තැන්පතු වගකීම් එ.ජ. ඩොලර් මිලියන 293 කින් අඩු වීම, මුදල් සහ තැන්පතු වගකීම්හි ශුද්ධ අත්කර ගැනීම් එ.ජ. ඩොලර් මිලියන 292 කින් අඩු වීමට හේතු විය.

### විදේශීය ණය

**2014 වසරේ දී මූල්‍ය ගිණුම වෙත වූ විදේශීය ණය ලැබීම් අඛණ්ඩව වාර්තා විය.** වසර තුළ දී තැන්පතු භාරගන්නා ආයතන වෙත ලැබුණු ශුද්ධ විදේශීය ණය ඉහළ ගිය අතර, පෙර වසර සමඟ සැසඳීමේ දී රජය සහ පෞද්ගලික අංශය/රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් අඩු විය. ඒ අනුව, 2014 වසරේ දී සමස්ත ශුද්ධ විදේශීය ණය ලැබීම් 2013 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,118 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,847 ක් විය.

**2014 වසරේ දී රජය වෙත ලැබුණු විදේශීය ණය පහත වැටුණි.** 2014 වසරේ දී රජය ලබාගත් සමස්ත ණය ප්‍රමාණය 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,677 සමඟ සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,439 ක් දක්වා අඩු විය. මේ අතර, 2014 වසරේ දී රජය විසින් සිදු කළ විදේශීය ණය ආපසු ගෙවීම් 2013 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 836 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 793 ක් විය. ඒ අනුව, 2014 වසරේ දී රජය වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් 2013 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 841 සිට එ.ජ. ඩොලර් මිලියන 646 දක්වා අඩු විය. 2014 වසරේ දී ප්‍රමුඛතාගත මාර්ග ව්‍යාපෘතිය මූල්‍යයනය කිරීම සඳහා ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 292 ක මුළු ලැබීම් රජය වෙත වූ ප්‍රධාන විදේශීය ණය ලැබීම විය. මේ අතර, ඕමන්තේ-පලාලි, මඩු-තලෙයිමන්නාරම සහ මැදවච්චිය සම්බන්ධ කිරීමේ දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය, මාතර-කතරගම දුම්රිය මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ මාතර-බෙලිඅත්ත ව්‍යාපෘතිය, මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය, රුසියානු ණය අරමුදල, උතුරු පළාත් දුම්රිය සේවාව ප්‍රතිසංස්කරණය කිරීම, අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සහ කුරුණෑගල ජල සම්පාදන හා ජලාපවහන ව්‍යාපෘතිය යන ව්‍යාපෘති සඳහා ද ණය ලැබීම් වාර්තා විය. 2014 වසර අවසානයේ දී රජය ලබාගත් ණය, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ණය වශයෙන් නොපියවා ඉතිරිව ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 53.1 ක් සහනදායී කොන්දේසි මත වූ ණය විය.

**5.8.ආ සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන

| ශීර්ෂය | 2013 (අ) | | 2014 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| අනෙකුත් ආයෝජන (පිටු අංක 132 හා සම්බන්ධයි) | | | | |
| ණය | - | 1,118 | - | 1,847 |
| මහ බැංකුව | - | -453 | - | -719 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | -453 | - | -719 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 124 | - | 1,358 |
| කෙටි කාලීන | - | -124 | - | 1,156 |
| දිගු කාලීන | - | 248 | - | 202 |
| රජය | - | 841 | - | 646 |
| දිගු කාලීන | - | 841 | - | 646 |
| අනෙකුත් අංශ (ඇ) | - | 605 | - | 563 |
| දිගු කාලීන | - | 605 | - | 563 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 225 | -235 | 98 | -407 |
| තැන්පතු භාරගන්නා ආයතන | 15 | - | 8 | - |
| කෙටි කාලීන | 15 | - | 8 | - |
| අනෙකුත් අංශ (ඈ) | 211 | -235 | 90 | -407 |
| කෙටි කාලීන | 211 | -235 | 90 | -407 |
| අනෙකුත් ගිණුම් ලැබිය යුතු / ගෙවිය යුතු | 42 | 58 | 314 | 151 |
| මහ බැංකුව | - | 58 | - | 151 |
| කෙටි කාලීන (ඉ) | - | 58 | - | 151 |
| තැන්පතු භාරගන්නා ආයතන | 42 | - | 314 | - |
| කෙටි කාලීන | 42 | - | 314 | - |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි) | - | - | - | - |
| **සංචිත වත්කම්** | **1,112** | | **1,548** | |
| මූල්‍ය රත්‍රන් | 351 | | 9 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 12 | | -6 | |
| ජා. මූ. අරමුදලේ සංචිත මට්ටම | - | | - | |
| අනෙකුත් සංචිත වත්කම් | 749 | | 1,545 | |
| මුදල් සහ තැන්පතු | 1,297 | | 496 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 1,462 | | -1,041 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | -165 | | 1,538 | |
| සුරැකුම්පත් | -548 | | 1,049 | |
| ණය සුරැකුම්පත් | -548 | | 1,049 | |
| දිගු කාලීන | -548 | | 1,049 | |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **3,064** | | **1,936** | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)** | | **841** | | **646** |
| ලැබීම් (ණය මුදා හැරීම්) | | 1,677 | | 1,439 |
| ගෙවීම් | | 836 | | 793 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.
(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.
(ඉ) ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2014 වසරේ දී තැන්පතු භාර ගන්නා ආයතනවල ශුද්ධ විදේශීය ණය ගැනීම් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ශ්‍රී ලංකා මහ බැංකුව ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම හා සම්බන්ධ ආපසු ගෙවීම් අඛණ්ඩව සිදු කළේය. බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs), බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (LFCs)වලින් සමන්විත තැන්පතු භාරගන්නා ආයතන වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් 2013 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 124 සමඟ සැසඳීමේ දී 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,358 ක් විය. 2014 වසරේ දී තැන්පතු භාරගන්නා ආයතන වෙත වූ ශුද්ධ කෙටි කාලීන ණය ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 1,156 ක් වූ අතර, 2014 වසරේ දී තැන්පතු භාර ගන්නා ආයතන වෙත වූ ශුද්ධ දිගු කාලීන ණය ලැබීම් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 239 ක ශුද්ධ ලැබීම්වලින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙතින් වූ එ.ජ. ඩොලර් මිලියන 37 ක ශුද්ධ ගෙවීම්වලින් සමන්විත විය. 2014 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම හා සම්බන්ධව එ.ජ. ඩොලර් මිලියන 719 ක ණය ආපසු ගෙවීමක් සිදු කර ඇත. 2009 සිට 2012 දක්වා වූ කාලපරිච්ඡේදයේ දී ලබාගන්නා ලද එ.ජ. ඩොලර් බිලියන 2.6 ක් වූ ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම 2017 වසරේ ජූලි මාසය වන විට ගෙවා අවසන් කිරීමට නියමිතය.

**2014 වසරේ දී පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ විදේශීය ණය ලැබීම් පහත වැටුණි.** 2014 වසරේ දී පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ ණය ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 777 ක් වූ අතර, එය 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,079 ට සාපේක්ෂව අඩු අගයක් විය. මෙයින්, එ.ජ. ඩොලර් මිලියන 403 ක් පෞද්ගලික අංශය වෙත ලැබුණු අතර, එ.ජ. ඩොලර් මිලියන 375 ක් රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත ලැබුණි. 2014 වසරේ දී පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් 2013 වසරේ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 605 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 563 ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණි. පෞද්ගලික අංශය වෙත ලැබුණු ණය මූලිකවම විදුලි සන්දේශ, ක්ෂුද්‍ර මූල්‍ය, බහලු පර්යන්ත සහ මිශ්‍ර සංවර්ධන අංශ වෙත යොමු කෙරිණි. පෞද්ගලික අංශයේ සමාගම් ලද එ.ජ. ඩොලර් මිලියන 566 ක් වූ මුළු ණය ලැබීම්වලින් සියයට 72.8 ක් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් විසින් ලබා ගන්නා ලදී. මූලිකවම ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ තුළ පවත්නා තරගකාරී පොලී අනුපාතික හේතුවෙන් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්, එම සමාගම් සමඟ ඍජු සබඳතාවයක් නොමැති පාර්ශ්වයන් වෙතින් විදේශීය ණය ලබාගැනීම කෙරෙහි යොමු වීම ඉහළ යෑමේ ප්‍රවණතාව මෙමගින් පිළිබිඹු කරයි. මේ අතර, රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත ලැබුණු ණය හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ එ.ජ. ඩොලර් මිලියන 167 කින්, ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 150 කින් සහ පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා වූ එ.ජ. ඩොලර් මිලියන 51 කින් සමන්විත විය.

**5.9 සංඛ්‍යා සටහන** — **2014 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්**

| ආයකයා සහ ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ.ඩොලර් මිලියන |
|---|---|
| **රජයේ ව්‍යාපෘතීන් මුළු එකතුව** | **1,439** |
| එයින්; | |
| **චීන සංවර්ධන බැංකුව** | **292** |
| ප්‍රමුඛතාගත මාර්ග ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 292 |
| **ආසියානු සංවර්ධන බැංකුව** | **247** |
| එයින්; | |
| ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය | 45 |
| තිරසාර බලශක්ති සහයක ව්‍යාපෘතිය | 29 |
| ජාතික අධිවේගී මාර්ග පද්ධතිය සඳහා අතිරේක මුදල් සම්පාදනය | 25 |
| උතුරු පළාත් මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතිය | 24 |
| **ජපානය** | **240** |
| එයින්; | |
| මහ කොළඹ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - II අදියර | 111 |
| මහ කොළඹ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | 32 |
| ප්‍රාදේශීය/ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම සහ සබරගමුව පළාත්) | 29 |
| ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය - II අදියර | 22 |
| **ජාත්‍යන්තර සංවර්ධන සංගමය** | **161** |
| එයින්; | |
| මාර්ග සංවර්ධනය සඳහා වූ දෙවන අතිරේක අරමුදල් සම්පාදනය | 33 |
| ද්විතියික සෞඛ්‍ය අංශය ප්‍රවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය | 27 |
| පළාත් මහා මාර්ග ව්‍යාපෘතිය | 22 |
| **චීන අපනයන - ආනයන බැංකුව** | **141** |
| එයින්; | |
| කුරුණෑගල ජල සැපයුම් සහ ජලාපවහන ව්‍යාපෘතිය | 21 |
| පුත්තලම - මරිච්චිකඩේ - මන්නාරම මාර්ගය ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 20 |
| **ඉන්දියාව** | **115** |
| එයින්; | |
| උතුරු පළාත් දුම්රිය සේවාව ප්‍රතිසංස්කරණය | 67 |
| ඕමන්තේ, පලාලි, මඩු-තලෙයිමන්නාරම සහ මැදවච්චිය දුම්රිය මාර්ග ව්‍යාපෘතිය | 32 |
| **නෙදර්ලන්ත රබෝ බැංකුව (Rabobank)** | **40** |
| එයින්; | |
| හම්බන්තොට මහ රෝහල් සංවර්ධන ව්‍යාපෘතිය | 14 |
| ශ්‍රී ලංකාවේ රුධිර පාරවිලයන සේවාව නගා සිටුවීම | 11 |
| **කොරියානු සමූහාණ්ඩුව** | **20** |
| එයින්; | |
| රුහුණුපුර ජල සැපයුම් ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය | 19 |
| **යුරෝපා ආයෝජන බැංකුව** | **21** |
| ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ හරිත බල ශක්ති සංවර්ධනය කිරීමේ ගෝලීය ණය පහසුකම | 21 |
| **රජය සතු වාණිජ ව්‍යවසායයන්වල මුළු එකතුව** | **375** |
| හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය - II අදියර | 167 |
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | 150 |
| පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය - II අදියර | 51 |
| මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ව්‍යාපෘතිය | 7 |

මූලය: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

### වෙළඳ ණය හා අත්තිකාරම් සහ අනෙක් ලැබිය යුතු/ ගෙවිය යුතු ගිණුම්

2014 වසර තුළ දී ලැබිය යුතු සහ ගෙවිය යුතු වෙළඳ ණය හා සම්බන්ධ ගනුදෙනු මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. වෙළඳ ණය වගකීම්වල ශුද්ධ වෙනස්වීම් 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 235 ක අඩු වීමට සාපේක්ෂව 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 407 කින් අඩු විය. 2014 වසරේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් සිදු කළ වෙළඳ ණය පියවීම් මෙම අඩු වීම සඳහා ප්‍රධානතම හේතුව විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ශේෂයෙන් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයකට දායක විය. මේ අතර, ප්‍රධාන වශයෙන් අනේවාසිකයන් සඳහා කෙටි කාලීන ණය පහසුකම් ලබා දෙන ශ්‍රී ලංකාවේ අපනයන සමාගම්වල ශුද්ධ වෙළඳ ණය අත්කර ගැනීම් 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 225 ට සාපේක්ෂව 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 98 කින් අඩු විය. තවද, මූලික වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ඇතුළත් අනෙකුත් ගෙවිය යුතු ගිණුම්, 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 58 ක ශුද්ධ වැඩි වීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 151 ක ශුද්ධ වැඩි වීමක් වාර්තා කළේය. මේ අතර, 2013 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 42 ක වැඩි වීමක් වාර්තා කළ අනෙකුත් ලැබිය යුතු ගිණුම් වශයෙන් සැලකෙන බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක් වෙරළ බැංකු ඒකක (OBUs) වෙත වූ ලැබීම් 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 314 ක වැඩි වීමක් වාර්තා කළේය.

### 5.7.4 විදේශීය සංචිත වත්කම්

2014 වසරේ දී විදේශීය සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු වර්ධනය විය. නිල සංචිත වර්ධනය වීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල වැඩි වශයෙන් ආයෝජනය කිරීම සහ අනේවාසිකයින් වෙත ඇති විදේශීය මුදල් තැන්පතු ප්‍රමාණය වැඩිවීම සඳහා හේතු විය. ඒ අනුව, 2014 වසර තුළ දී ස්ථාවර ආදායම් සුරැකුම්පත් ගනුදෙනු එ.ජ. ඩොලර් මිලියන 1,049 කින් වැඩි වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන ඇති මුදල් හා තැන්පතු එ.ජ. ඩොලර් මිලියන 496 කින් වර්ධනය විය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි රත්‍රන් මිල අඩු වීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍යමය රත්‍රන් ප්‍රමාණය එලෙසම රඳවා ගැනීම නිසා 2014 වසර තුළ දී රත්‍රන් හා සම්බන්ධ ශුද්ධ ගනුදෙනු 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 351 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 9 ක අඩු අගයක් විය.

**5.10 රූප සටහන** **ගෙවුම් තුලනය**




## 5.8 ගෙවුම් තුලනය

2014 වසරේ දී ගෙවුම් තුලනයෙහි අතිරික්තයක් වාර්තා කළේය. ජංගම ගිණුමේ වර්ධනය සහ මූල්‍ය ගිණුම වෙත වූ සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් ලැබීම් හේතුවෙන් ගෙවුම් තුලනය 2013 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 985 ක අතිරික්තය සමග සැසඳීමේ දී 2014 වසරේ දී සියයට 38.9 කින් වර්ධනය වෙමින් එ.ජ. ඩොලර් මිලියන 1,369 ක අතිරික්තයක් වාර්තා කළේය.

## 5.9 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (IIP) අනුව, 2014 වසර අවසානයේ දී විදේශීය මූල්‍ය වත්කම් හා වගකීම්වල වර්ධනයක් පෙන්නුම් කළේය. සංචිත වත්කම්හි සැලකිය යුතු වර්ධනය හේතුවෙන් මුළු විදේශීය වත්කම් 2013 වසර අවසානයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් බිලියන 9.5 ට සාපේක්ෂව සියයට 15.5 ක වර්ධනයක් වාර්තා කරමින් 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 10.9 ක් දක්වා වැඩි විය. මේ අතර, 2014 වසරේ දී ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීම සමග ප්‍රධාන වශයෙන් නොපියවා ඉතිරිව ඇති ණය සුරැකුම්පත් වර්ධනය වීම හේතුවෙන් විදේශීය වගකීම් 2013 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 47.8 ක සිට 2014 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 53.2 ක් දක්වා වර්ධනය විය. මුළු විදේශීය වගකීම්වලින්, සියයට 49.5 ක් රජය හා ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශීය වගකීම් වූ අතර සියයට 50.5 ක් පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය වගකීම් විය. තව ද, රජය, බැංකු අංශය සහ පෞද්ගලික අංශයන්හි දිගු කාලීන මූල්‍යනයේ සිදු වූ ඉහළ යෑම පිළිබිඹු කරමින්

**5.10 සංඛ්‍යා සටහන** **අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන
*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2013 (අ) | | 2014 (ආ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ඇ)** | **540** | **8,959** | **607** | **10,511** |
| හිමිකම් සහ ආයෝජන කොටස් | 537 | 6,859 | 604 | 7,984 |
| ණය උපකරණ | 3 | 2,100 | 3 | 2,527 |
| **විවිධ ආයෝජන** | - | **9,473** | - | **12,918** |
| හිමිකම් සහ ආයෝජන කොටස් | - | 1,044 | - | 2,192 |
| අනෙකුත් අංශ | - | 1,044 | - | 2,192 |
| ණය සුරැකුම්පත් (ඈ) | - | 8,429 | - | 10,726 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 1,954 | - | 2,263 |
| දිගු කාලීන | - | 1,954 | - | 2,263 |
| රජය | - | 6,476 | - | 8,289 |
| කෙටි කාලීන | - | 507 | - | 399 |
| දිගු කාලීන | - | 5,968 | - | 7,890 |
| අනෙකුත් අංශ | - | - | - | 174 |
| දිගු කාලීන | - | - | - | 174 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **1,420** | **29,376** | **2,108** | **29,736** |
| **මුදල් සහ තැන්පතු** | **283** | **1,886** | **558** | **1,594** |
| මහ බැංකුව | - | 6 | - | 6 |
| කෙටි කාලීන | - | 6 | - | 6 |
| දිගු කාලීන | - | - | - | - |
| තැන්පතු භාරගන්නා ආයතන | 283 | 1,880 | 558 | 1,587 |
| කෙටි කාලීන | 246 | 1,880 | 388 | 1,587 |
| දිගු කාලීන | 37 | - | 171 | - |
| **ණය** | - | **24,507** | - | **25,451** |
| මහ බැංකුව | - | 2,056 | - | 1,248 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | 2,056 | - | 1,248 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 2,924 | - | 4,282 |
| කෙටි කාලීන | - | 2,003 | - | 3,159 |
| දිගු කාලීන | - | 921 | - | 1,123 |
| රජය | - | 15,814 | - | 15,762 |
| දිගු කාලීන | - | 15,814 | - | 15,762 |
| අනෙකුත් අංශ (ඉ) | - | 3,713 | - | 4,159 |
| දිගු කාලීන | - | 3,713 | - | 4,159 |
| **වෙළඳ ණය සහ අත්තිකාරම්** | **460** | **2,089** | **558** | **1,681** |
| තැන්පතු භාරගන්නා ආයතන | 118 | - | 126 | - |
| කෙටි කාලීන | 118 | - | 126 | - |
| අනෙකුත් අංශ (ඊ) | 342 | 2,089 | 432 | 1,681 |
| කෙටි කාලීන | 342 | 2,089 | 432 | 1,681 |
| **අනෙකුත් ගිණුම් ලැබිය යුතු/ගෙවිය යුතු** | **678** | **285** | **992** | **437** |
| මහ බැංකුව (උ) | - | 285 | - | 437 |
| කෙටි කාලීන | - | 285 | - | 437 |
| තැන්පතු භාරගන්නා ආයතන | 678 | - | 992 | - |
| කෙටි කාලීන | 678 | - | 992 | - |
| **විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි)** | - | **609** | - | **573** |
| **සංචිත වත්කම්** | **7,495** | | **8,208** | |
| මූල්‍ය රත්‍රන් | 884 | | 893 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 16 | | 9 | |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | 74 | | 69 | |
| අනෙකුත් සංචිත වත්කම් | 6,522 | | 7,237 | |
| මුදල් සහ තැන්පතු | 3,309 | | 3,795 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 2,843 | | 1,798 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 465 | | 1,997 | |
| සුරැකුම්පත් | 3,213 | | 3,442 | |
| ණය සුරැකුම්පත් | 3,213 | | 3,442 | |
| **මුළු වත්කම්/වගකීම්** | **9,456** | **47,808** | **10,924** | **53,164** |
| **ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | | **-38,353** | | **-42,241** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය | | | | |
| කෙටි කාලීන | 1,384 | 7,814 | 1,937 | 9,462 |
| දිගු කාලීන | 8,072 | 39,994 | 8,986 | 43,703 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති සෘජු ආයෝජනද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය එකතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2014 වසර අවසානයේ දී මුළු විදේශීය වගකීම්වලින් සියයට 82.2 ක ප්‍රමාණයක් දිගු කාලීන වගකීම් විය. 2014 වසර අවසානයේ දී නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය වගකීම් ප්‍රමාණයෙන් සියයට 47.9 ක් නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ලෙස සහ සියයට 20.2 ක් ණය සුරැකුම්පත් ලෙස පැවතුණි. නොපියවා ඉතිරිව ඇති විදේශීය වගකීම් සහ වත්කම් තත්ත්වයේ වර්ධනය සමඟ ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය 2013 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 38.4 ක සිට 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 42.2 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය.

### 5.9.1 සෘජු ආයෝජන තත්ත්වය

**කොටස් හිමිකම් හා ණය උපකරණවලින් සමන්විත සෘජු ආයෝජන තත්ත්වය 2014 වසර අවසානයේ දී වර්ධනය විය.** 2014 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 944 ක සෘජු ආයෝජන ලැබීම් සමඟ සමස්ත සෘජු ආයෝජන තත්ත්වය, 2013 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 9.0 සමඟ සැසඳීමේ දී 2014 වසර අවසානයේදී එ.ජ. ඩොලර් බිලියන 10.5 දක්වා වර්ධනය විය. සමස්ත සෘජු ආයෝජන තත්ත්වයෙන් සියයට 76.0 ක් කොටස් හිමිකම් ලෙස පැවති අතර, සියයට 24.0 ක් අන්තර් සමාගම් ණය ගැනීම් සහ කොටස්කරුවන්ගේ අත්තිකාරම් ලෙස පැවතුණි. වසර තුළ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම් තුළ සිදුකර ඇති සෘජු ආයෝජනයන්හි වෙළඳ මිල ඉහළ යැම තුළින් සැලකිය යුතු ලෙස ලාභ හිමිවීම හේතුවෙන් කොටස් හිමිකම්වල මුළු වටිනාකම 2014 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 7,984 දක්වා සියයට 16.4 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් සෘජු ආයෝජන සමාගම්හි අන්තර් සමාගම් ණයගැනීම්වලින් සමන්විත, නොපියවා ඉතිරිව ඇති සමස්ත ණය ප්‍රමාණය 2014 වසර අවසානයේ දී, එ.ජ. ඩොලර් මිලියන 2,527 දක්වා සියයට 20.3 කින් වර්ධනය විය. තව ද, ශ්‍රී ලාංකික සමාගම් විසින් විදේශයන්හි සිදු කළ සෘජු ආයෝජන ප්‍රමාණය 2013 වසර අවසානයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 540 හා සැසඳීමේ දී 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 607 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය. විදේශයන්හි සිදු කළ මෙම ආයෝජනයන් ප්‍රධාන වශයෙන් අග්නිදිග ආසියානු රටවල ලැයිස්තුගත කර ඇති සමාගම්වල සිදු කර ඇති ආයෝජනවලින් සමන්විත විය.

### 5.9.2 විවිධ ආයෝජන තත්ත්වය

**හිමිකම් හා ආයෝජන අරමුදල් කොටස් සහ ණය සුරැකුම්පත්වලින් සමන්විත විවිධ ආයෝජන 2014 වසරේ දී වර්ධනය විය.** ඒ අනුව, විවිධ ආයෝජන තත්ත්වය, 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 12.9 ක් දක්වා ඉහළ ගිය අතර, එය 2013 වසර අවසානය සමඟ සැසඳීමේ දී සියයට 36.4 ක වර්ධනයකි. සමස්ත විවිධ ආයෝජන තත්ත්වයෙන් එ.ජ. ඩොලර් බිලියන 2.2 ක් හිමිකම් හා ආයෝජන අරමුදල් කොටස් ලෙස පැවති අතර, එ.ජ. ඩොලර් බිලියන 10.7 ක් ණය සුරැකුම්පත් ලෙස පැවතුණි. රජය, බැංකු අංශය සහ රාජ්‍ය සංස්ථා නිකුත් කළ ණය සුරැකුම්පත්වලින් සමන්විත ණය සුරැකුම්පත්වල විදේශ ආයෝජන තත්ත්වය වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 2.3 කින් ඉහළ ගියේය. රජය විසින් එ.ජ. ඩොලර් බිලියන 1.5 ක වටිනාකමින් යුත් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම, ජාතික ඉතිරි කිරීමේ බැංකුව එ.ජ. ඩොලර් මිලියන 250 ක ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම, ශ්‍රී ලංකන් ගුවන් සමාගම එ.ජ. ඩොලර් මිලියන 175 ක ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම සහ එ.ජ. ඩොලර් බිලියන 3.0 ක් වූ නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල වෙළඳ මිල ඉහළ යෑම ණය සුරැකුම්පත්වල ආයෝජන තත්ත්වය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2014 වසර අවසානයේ දී නොපියවා ඉතිරිව ඇති මුළු ණය සුරැකුම්පත් ප්‍රමාණයෙන් සියයට 3.7 ක් පමණක් වසරකට අඩු කාලයක් තුළ දී කල්පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත විය.

### 5.9.3 අනෙකුත් ආයෝජන තත්ත්වය

#### මුදල් සහ තැන්පතු

**2014 වසර අවසානයේදී මුදල් සහ තැන්පතුවල වත්කම් තත්ත්වය ඉහළ ගිය අතර වගකීම් තත්ත්වය පහළ ගියේය.** බලපත්‍රලාභී වාණිජ බැංකු විදේශයන්හි පිහිටි බැංකුවල පවත්වා ගෙන යන තැන්පතුවලින් සමන්විත මුදල් හා තැන්පතු සම්බන්ධ වත්කම් 2013 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 283 සමඟ සැසඳීමේ දී 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 558 ක් විය. මේ අතර, මූලිකවම දේශීය බලපත්‍රලාභී වාණිජ බැංකුවල ඇති විදේශිකයින් සතු විදේශ මුදල් ගිණුම්වල ශේෂයන්ගෙන් සමන්විත මුදල් හා තැන්පතු වගකීම් 2013 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 1.9 ක සිට 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 1.6 දක්වා අඩු විය.

#### විදේශීය ණය

**2014 වසර අවසාන වනවිට තැන්පතු භාර ගන්නා ආයතන, පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය වැඩි වූ අතර, රජය සතු නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය සහ ජා.මූ. අරමුදල වෙනුවෙන්**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය වගකීම් ප්‍රමාණය අඩු විය.** සමස්ත වගකීම්වලින් සියයට 47.9 ක් පමණ වන විදේශීය ණය වගකීම් 2013 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 24.5 ක සිට 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 25.5 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. මේ අතර, එ.ජ. ඩොලර් මිලියන 646 ක ශුද්ධ විදේශීය ණය ලැබීම් හමුවේ වුව ද විනිමය අනුපාතික වෙනස්වීම්හි බලපෑම හේතුවෙන් රජයේ මුළු ණය වගකීම් ප්‍රමාණය 2013 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 15,814 ක සිට 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 15,762 දක්වා අඩු විය. කෙටි කාලීන මෙන්ම දිගු කාලීන වගකීම් වැඩි වීම සමඟ තැන්පතු භාරගන්නා ආයතනවල ශුද්ධ වගකීම් 2014 අවසානයේදී එ.ජ. ඩොලර් බිලියන 4.3 දක්වා ඉහළ ගියේය. පෞද්ගලික අංශයෙහි හා රජය සතු වාණිජ ව්‍යවසායයන්වල නොපියවා ඉතිරිව ඇති ණය වගකීම් ප්‍රමාණය 2013 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.7 සිට 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 4.2 දක්වා වැඩි විය. ණය වාරික අඛණ්ඩව ආපසු ගෙවීම හේතුවෙන් ජා.මූ. අරමුදලේ සම්පස්ථ ණය පහසුකමෙහි නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය 2014 වසර අවසාශයේ දී එ.ජ. ඩොලර් බිලියන 1.2 දක්වා අඩු විය.

### වෙළඳ ණය සහ අත්තිකාරම්

2014 වසර අවසානයේ දී ලබාදුන් වෙළඳ ණය සහ අත්තිකාරම්වල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය වැඩි වූ අතර, ලබාගත් වෙළඳ ණය සහ අත්තිකාරම්වල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය අඩු විය. අපනයනකරුවන් විදේශිකයින්ට අඛණ්ඩව ණය පහසුකම් ලබාදීම සමඟ, 2014 දෙසැම්බර් මස අවසානයේ දී ශ්‍රී ලාංකික සමාගම් විදේශිකයින් වෙත ලබාදුන් වෙළඳ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 558 දක්වා සුළු වශයෙන් වැඩි විය. මේ අතර, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබාගත් වෙළඳ ණය පියවීම හේතුවෙන් නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ප්‍රමාණය 2013 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 2,089 සිට 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,681 දක්වා අඩු විය.

### අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම් සහ විශේෂ ගැනුම් හිමිකම්

**2014 වසර අවසානයේ දී නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්වල තත්ත්වයන්හි ඉහළ යෑමක් වාර්තා විය.** මූලිකවම, තැන්පතු භාර ගන්නා ආයතනවල කෙටි කාලීන ශේෂයන්ගෙන් සමන්විත අනෙකුත් ලැබිය යුතු ගිණුම් 2014 වසර අවසානයේ දී ඉහළ ගියේය. මහ බැංකුව වෙත ඇති ආසියානු නිෂ්කාශන සංගමයේ නොපියවා ඉතිරිව ඇති කෙටිකාලීන ණය වගකීම්වලින් මූලික වශයෙන් සමන්විත අනෙකුත් ගෙවිය යුතු ගිණුම් 2013 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 285 සිට 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 437 දක්වා වැඩි විය. මේ අතර, එ.ජ. ඩොලර් මිලියන 573 ක් වූ විශේෂ ගැනුම් හිමිකම්හි (වි.ගැ.හි.) ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය විනිමය අනුපාතික වෙනස්වීම් හේතුවෙන් 2014 වසර අවසාන වන විට සුළු වශයෙන් වෙනස් විය.

### 5.9.4 විදේශීය සංචිත වත්කම් තත්ත්වය

**විදේශීය සංචිත මුදල්, රත්රන් ශේෂයන්, ජා.මූ. අරමුදලේ ඇති සංචිත තත්ත්වය, වි.ගැ.හි. වෙන් කිරීම් සහ අනෙකුත් විදේශීය සංචිත වත්කම්වලින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය සතු විදේශීය සංචිත වත්කම් 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 8.2 ක් විය.** විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ ජා.මූ. අරමුදලේ සම්පස්ථ ණය පහසුකම සඳහා වන ගෙවීම් හමුවේ වුව ද, 2014 වසරේ ජනවාරි සහ අප්‍රේල් මාසවල ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවලින් ලද ලැබීම්, ව්‍යාපෘති මූල්‍යනය කිරීම සඳහා ලද විදේශීය අරමුදල් ලැබීම් සහ විදේශීය විනිමය වෙළඳපොළෙහි පැවති අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම, 2014 වසරේ විදේශීය සංචිත වත්කම් තත්ත්වය වර්ධනය වීමට හේතු විය. මේ අතර, සංචිත වත්කම් මෙන්ම තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය මූල්‍ය වත්කම් ඇතුළත් මුළු විදේශීය වත්කම් 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 9.9 දක්වා වර්ධනය විය.

**5.11 රූප සටහන** කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්



**ජාත්‍යන්තරව පිළිගත් සම්මතය වන ආනයනික මාස 3 හා සැසඳීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය සතු විදේශීය සංචිත වත්කම් තත්ත්වය 2014 වසර අවසානයේ දී භාණ්ඩ ආනයනික මාස 5.1 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.3 කට සමාන විය.** මුළු විදේශීය වත්කම් ප්‍රමාණය භාණ්ඩ ආනයනික මාස 6.1 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 5.1 කට සමාන විය. මේ අතර, 2014 වසර අවසානයේ දී විදේශීය සංචිත වත්කම් තත්ත්වය රටෙහි කෙටි කාලීන ණය සහ වගකීම්වලින් සියයට 64 ක් ආවරණය කළ අතර, එය 2013 වසර අවසානයේ දී පැවති මට්ටමට සමාන අගයකි. විදේශීය සංචිත වත්කම් වර්ධනය වීම හමුවේ වුව ද කෙටි කාලීන ණය වැඩිවීම හේතුවෙන් සංචිත ප්‍රමාණාත්මකතා අනුපාතය නොවෙනස්ව පැවතුණි. විදේශීය සංචිත වත්කම්, වසරකට වැඩි කාලයක් තුළ දී කල්පිරීමට නියමිත භාණ්ඩාගාර බැඳුම්කර හැර කෙටි කාලීන ණයෙහි අනුපාතයක් ලෙස ගත් විට 2013 වසර අවසානයේ දී වූ සියයට 85 ක සිට 2014 වසර අවසානයේ දී සියයට 84 දක්වා සුළු වශයෙන් අඩු විය.

**5.11 සංඛ්‍යා සටහන**

**දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය**

*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*

| | එ.ජ.ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 (අ) | 2010 | 2011 | 2012 | 2013 | 2014 (අ) |
| 1. රජයේ විදේශීය වත්කම් | 88 | 615 | 631 | 465 | 635 | 9,747 | 70,088 | 80,209 | 60,857 | 83,262 |
| 2. මහ බැංකුවේ විදේශීය වත්කම් | 7,109 | 6,134 | 6,475 | 7,030 | 7,573 | 788,722 | 698,666 | 823,375 | 919,171 | 992,438 |
| 3. දළ නිල සංචිත වත්කම් (1+2) | 7,196 | 6,749 | 7,106 | 7,495 | 8,208 | 798,469 | 768,754 | 903,584 | 980,028 | 1,075,700 |
| 4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම් | 1,424 | 1,241 | 1,480 | 1,078 | 1,676 | 158,031 | 141,394 | 188,195 | 141,008 | 219,641 |
| 5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ) | 8,621 | 7,991 | 8,586 | 8,574 | 9,884 | 956,500 | 910,148 | 1,091,779 | 1,121,036 | 1,295,342 |
| 6. සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 2,125 | 2,737 | 2,943 | 2,347 | 1,691 | 235,770 | 311,769 | 374,185 | 306,825 | 221,593 |
| 7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6) | 5,071 | 4,012 | 4,163 | 5,149 | 6,517 | 562,701 | 456,985 | 529,399 | 673,203 | 854,107 |
| 8. සමස්ත ශේෂය (ඈ) | 921 | -1,059 | 151 | 985 | 1,369 | 87,974 | -105,716 | 72,414 | 143,804 | 180,904 |
| 9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | | | | | | |
| 9.1 වෙළඳ භාණ්ඩ | 6.4 | 4.0 | 4.4 | 5.0 | 5.1 | | | | | |
| 9.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 5.7 | 3.6 | 3.9 | 4.2 | 4.3 | | | | | |
| 10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | | | | | | |
| 10.1 වෙළඳ භාණ්ඩ | 7.7 | 4.7 | 5.4 | 5.7 | 6.1 | | | | | |
| 10.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 6.8 | 4.3 | 4.7 | 4.8 | 5.1 | | | | | |

(අ) තාවකාලික

(ආ) 'විදේශයන්හි සිදුකරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.

(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)

(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සටහන : ගෙවුම් තුලන අත්පොතෙහි 6 වන සංස්කරණය (BPM6) අනුගමනය කිරීමෙන් පසු ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය ගණනය කිරීම**

2013 වසරේ දී ගෙවුම් තුලන අත්පොතෙහි 6 වන සංස්කරණය අනුගමනය කිරීමත් සමඟ සමස්ත ශේෂය ගණනය කළ හැකි වන්නේ පහත දැක්වෙන අයුරින් ශුද්ධ විදේශීය සංචිත තත්ත්වයේ වෙනස්වීම මගින් පමණි.

සමස්ත ශේෂය = ශුද්ධ විදේශීය සංචිතවල වෙනස් වීම

= කාලපරිච්ඡේදය අවසානයේ දී ශුද්ධ සංචිත වත්කම් තත්ත්වය - කාලපරිච්ඡේදය ආරම්භයේ දී ශුද්ධ සංචිත වත්කම් තත්ත්වය

සංචිත වත්කම් තත්ත්වය සහ සංචිත ආශ්‍රිත වගකීම් තත්ත්වය අතර වෙනස, ශුද්ධ සංචිත වත්කම් තත්ත්වය ලෙස නිර්වචනය කෙරෙයි.

මේ අනුව, සමස්ත ශේෂය ගෙවුම් තුලනය තුළින් තවදුරටත් ගණනය නොකෙරෙයි. 2014 වාර්ෂික වාර්තාවෙහි '5.11 සංඛ්‍යා සටහන: දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය' යටතේ සවිස්තරාත්මකව දැක්වෙනු ඇති අතර, මින් පසුව පළ කෙරෙන ප්‍රකාශනයන්ට ද එය අදාළ වේ.

## 5.10 විදේශීය ණය සහ ණය සේවාකරණය

### 5.10.1 විදේශීය ණය

**2014 වසර අවසාන වන විට රටෙහි විදේශීය ණය මට්ටම ඉහළ ගියේය.** 2014 වසර අවසානයේ දී ශ්‍රී ලංකාවේ සමස්ත විදේශීය ණය ප්‍රමාණය 2013 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 39.9 ක සිට එ.ජ. ඩොලර් බිලියන 43.0 දක්වා ඉහළ ගියේය. එ.ජ. ඩොලර් බිලියන 1.5 ක වටිනාකමකින් යුත් හයවන සහ හත්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිදුකළ බැඳුම්කර නිකුතුව (එ.ජ. ඩොලර් මිලියන 250) සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් සිදු කළ ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව (එ.ජ. ඩොලර් මිලියන 175), රජය, රජය සතු වාණිජ ව්‍යවසායයන්, පෞද්ගලික අංශය හා තැන්පතු භාරගන්නා ආයතනයන් වෙත වූ දිගු කාලීන විදේශීය ණයවල ශුද්ධ වැඩි වීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ නමුත්, සමස්ත විදේශීය ණය මට්ටමෙහි වර්ධනයට වඩා වැඩි වේගයකින් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය වීම හේතුවෙන් 2013 වසර අවසානයේ දී ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 59.4 ක් වූ විදේශීය ණය ප්‍රමාණය, 2014 වසර අවසානයේ දී සියයට 57.4 ක් ලෙස අඩු විය.

**2014 වසර අවසානයේ දී පැවති ශ්‍රී ලංකාවේ විදේශීය ණයවල සංයුතිය සැලකීමේ දී එය මූලික වශයෙන් සමස්ත විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 83.1 ක් වූ දිගු කාලීන විදේශීය ණයවලින් සමන්විත විය.** 2014 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් වූ කෙටි කාලීන විදේශීය ණය ප්‍රමාණය මුළු විදේශීය ණයවලින් සියයට 16.9 ක් වූ අතර, එය මූලික වශයෙන් වාණිජ බැංකුවල අනේවාසික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් ලෙස පවත්නා තැන්පතු වගකීම් සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණයවලින් සමන්විත විය. මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 59.2 ක් විදේශීය ණය වූ අතර, සියයට 25.0 ක් ණය සුරැකුම්පත් වශයෙන්ද, සියයට 5.9 ක් සෘජු ආයෝජන සමාගම්හි අන්තර් සමාගම් ණය වශයෙන්ද, සියයට 4.9 ක් වෙළඳ ණය හා අත්තිකාරම් වශයෙන්ද, සියයට 3.7 ක් මුදල් සහ තැන්පතු වශයෙන් පැවති අතර, ඉතිරිය අනෙකුත් ගෙවිය යුතු ගිණුම් ලෙස පැවතුණි. රජය මෙන්ම තැන්පතු භාර ගන්නා ආයතන ද ඔවුන්ගේ විදේශීය මූල්‍ය අවශ්‍යතා සඳහා ණය සුරැකුම්පත් නිකුත් කිරීම මත සැලකිය යුතු ලෙස රඳා පැවති අතර, 2014 වසර අවසානයේ දී රජය සහ තැන්පතු භාරගන්නා ආයතනයන් සතුව මුහුණත වටිනාකම පිළිවෙළින් එ.ජ. ඩොලර් බිලියන 5 ක් සහ එ.ජ. ඩොලර් බිලියන 2.1 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර පැවතුණි.

**5.12 සංඛ්‍යා සටහන — නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය (BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන
*(වසර අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2013 (අ) | 2014 (ආ) |
|---|---|---|
| **රජය** | **22,290** | **24,051** |
| **කෙටි කාලීන** | **507** | **399** |
| ණය සුරැකුම්පත් | 507 | 399 |
| භාණ්ඩාගාර බිල්පත් (ඇ) | 507 | 399 |
| **දිගු කාලීන** | **21,783** | **23,651** |
| ණය සුරැකුම්පත් | 5,968 | 7,890 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ඇ) | 2,483 | 2,603 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඈ) | 3,485 | 5,287 |
| ණය | 15,814 | 15,762 |
| **මහ බැංකුව** | **2,956** | **2,264** |
| **කෙටි කාලීන** | **291** | **443** |
| මුදල් සහ තැන්පතු | 6 | 6 |
| අනෙකුත් ගෙවිය යුතු ගෙවීම් | 285 | 437 |
| ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් | 285 | 437 |
| **දිගු කාලීන** | **2,665** | **1,821** |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 609 | 573 |
| ණය | 2,056 | 1,248 |
| ජා.මූ. අරමුදලේ ණය | 2,056 | 1,248 |
| සමීපස්ථ ණය පහසුකම | 2,056 | 1,248 |
| **තැන්පතු භාරගන්නා ආයතන** | **6,758** | **8,133** |
| **කෙටි කාලීන** | **3,884** | **4,747** |
| මුදල් සහ තැන්පතු (ඉ) | 1,880 | 1,587 |
| වාණිජ බැංකු | 1,880 | 1,587 |
| ණය | 2,003 | 3,159 |
| වාණිජ බැංකු | 2,003 | 3,159 |
| **දිගු කාලීන** | **2,875** | **3,386** |
| ණය සුරැකුම්පත් (ඇ) | 1,954 | 2,263 |
| වාණිජ බැංකු | 990 | 1,037 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 964 | 1,226 |
| ණය | 921 | 1,123 |
| වාණිජ බැංකු | 825 | 1,064 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 96 | 59 |
| **අනෙකුත් අංශ (ඊ)** | **5,801** | **6,014** |
| **කෙටි කාලීන** | **2,089** | **1,681** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (උ) | 2,089 | 1,681 |
| **දිගු කාලීන** | **3,713** | **4,333** |
| ණය සුරැකුම්පත් (ඇ) | - | 174 |
| ණය | 3,713 | 4,159 |
| පෞද්ගලික අංශය | 1,410 | 1,542 |
| රජය සතු ආයතන සහ රාජ්‍ය සංස්ථා | 2,303 | 2,618 |
| **සෘජු ආයෝජන : අන්තර් සමාගම් ණය (ඌ)** | **2,100** | **2,527** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **39,905** | **42,988** |
| ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් | | |
| දළ විදේශීය ණය | 59.4 | 57.4 |
| කෙටි කාලීන ණය | 10.1 | 9.7 |
| දිගු කාලීන ණය | 49.3 | 47.7 |
| දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන් | | |
| කෙටි කාලීන ණය | 17.0 | 16.9 |
| දිගු කාලීන ණය | 83.0 | 83.1 |
| **විශේෂිත අයිතමයන්** | | |
| **ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම - ආංශික වර්ගීකරණය** | **9,001** | **10,764** |
| රජය | 7,151 | 8,489 |
| භාණ්ඩාගාර බිල්පත් | 565 | 424 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 3,086 | 3,065 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 3,500 | 5,000 |
| මහ බැංකුව හැර තැන්පතු භාරගන්නා ආයතන | 1,850 | 2,100 |
| වාණිජ බැංකු | 1,000 | 1,000 |
| ලියාපදිංචි විශේෂිත බැංකු | 850 | 1,100 |
| අනෙකුත් අංශ | - | 175 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඉ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(ඊ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(උ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(ඌ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.12 රූප සටහන** **විදේශීය ණය**




## 5.10.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

2014 වසර තුළ දී ණය වාරික සහ පොලී ගෙවීම් ඇතුළත් සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණ පහත වැටුණි. මූලික වශයෙන් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ආපසු ගෙවීම් අඩු වීම සහ රජයේ දිගු කාලීන ණය හා සම්බන්ධ ණය වාරික ආපසු ගෙවීම් අඩු වීම හේතුවෙන් විදේශීය ණය සේවාකරණ ගෙවීම්වල නාමික වටිනාකම 2013 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,540 සිට 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,386 ක් දක්වා අඩු විය. සමස්ත ණය වාරික ගෙවීම්, රජයේ දිගු කාලීන ණය හා සම්බන්ධව එ.ජ. ඩොලර් මිලියන 793 ක ණය වාරික ආපසු ගෙවීම්, ජා.මූ. අරමුදලට එ.ජ. ඩොලර් මිලියන 719 ක ආපසු ගෙවීම්, එ.ජ. ඩොලර් මිලියන 503 ක රජයේ සුරැකුම්පත් කල්පිරීම් සහ පෞද්ගලික අංශයේ ණය වගකීම්වලට අදාළ එ.ජ. ඩොලර් මිලියන 215 ක ණය වාරික ආපසු ගෙවීම්වලින් සමන්විත විය. කෙසේ නමුත්, රජය සහ තැන්පතු භාර ගන්නා ආයතන විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර බැඳුම්කර මත වූ පොලී ගෙවීම් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මත වූ පොලී ගෙවීම් ඇතුළත් රජයේ මැදි හා දිගු කාලීන ණය සඳහා වූ පොලී ගෙවීම් වැඩි විය. මේ අතර, ප්‍රධාන වශයෙන් ණය වාරික ගෙවීම් අඩු වීමේ සහ භාණ්ඩ හා සේවා

**5.13 සංඛ්‍යා සටහන** **විදේශීය ණය සේවාකරණ ගෙවීම්**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013(අ) | 2014 (ආ) | 2010 | 2011 | 2012 | 2013(අ) | 2014 (ආ) |
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **1,853** | **1,798** | **2,672** | **3,540** | **3,386** | **208,984** | **199,233** | **334,592** | **456,095** | **441,972** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **1,234** | **1,092** | **1,791** | **2,481** | **2,230** | **138,941** | **121,246** | **222,916** | **319,749** | **291,003** |
| (i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට | 46 | 11 | 57 | 453 | 719 | 5,238 | 1,238 | 7,413 | 57,683 | 93,904 |
| (ii) අනෙකුත් | 1,188 | 1,081 | 1,734 | 2,028 | 1,510 | 133,703 | 120,008 | 222,828 | 262,065 | 197,100 |
| රජයේ මැදි සහ දිගුකාලීන | 665 | 789 | 862 | 836 | 793 | 74,932 | 87,754 | 110,412 | 107,861 | 103,510 |
| රාජ්‍ය සුරැකුම්පත් | 92 | 95 | 628 | 719 | 503 | 10,406 | 10,406 | 80,991 | 92,610 | 65,516 |
| රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 431 | 197 | 244 | 474 | 215 | 48,365 | 21,848 | 31,425 | 61,594 | 28,073 |
| **1.2 පොලී ගෙවීම්** | **619** | **706** | **881** | **1,059** | **1,157** | **70,043** | **77,987** | **111,676** | **136,346** | **150,969** |
| (i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට | 7 | 10 | 36 | 33 | 20 | 803 | 1,081 | 4,639 | 4,298 | 2,546 |
| (ii) අනෙකුත් | 612 | 697 | 845 | 1,026 | 1,137 | 69,240 | 76,905 | 107,036 | 132,047 | 148,423 |
| හිමිකම් | | | 437 | 402 | 379 | | | 55,743 | 51,920 | 49,454 |
| ණය සුරැකුම්පත් | | | 408 | 624 | 758 | | | 51,293 | 80,128 | 98,969 |
| **2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **11,100** | **13,643** | **13,573** | **15,079** | **16,735** | | | | | |
| **3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **15,592** | **19,314** | **19,754** | **21,639** | **23,934** | | | | | |
| **4. ණය සේවාකරණ අනුපාතිකය** | | | | | | | | | | |
| 4.1 ඉහත 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 16.7 | 13.2 | 19.7 | 23.5 | 20.2 | | | | | |
| (ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 16.2 | 13.0 | 19.0 | 20.3 | 15.8 | | | | | |
| 4.2 ඉහත 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 11.9 | 9.3 | 13.5 | 16.4 | 14.1 | | | | | |
| (ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 11.5 | 9.2 | 13.1 | 14.1 | 11.1 | | | | | |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ) | 1,219 | 1,474 | 2,191 | 2,386 | 2,172 | | | | | |
| 5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 65.8 | 82.0 | 82.0 | 67.4 | 64.1 | | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන ඉපැයුම් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ හා සේවා අපනයනයන්හි ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2013 වසරේ දී වාර්තා වූ සියයට 23.4 සිට 2014 වසරේ දී සියයට 20.2 ක් දක්වා අඩු විය.

### 5.11 විනිමය අනුපාතිකයේ වෙනස්වීම්

2014 වසරේ විදේශ විනිමය ප්‍රතිපත්තිය, **විදේශ විනිමය වෙළඳපොළ ස්ථාවරත්වය පවත්වා ගනිමින් විනිමය අනුපාතිකයේ කෙටි කාලීන උච්චාවචනය අවම කර ගැනීම කෙරෙහි යොමු විය.** වසරේ පළමු කාර්තු තුන තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව අධිප්‍රමාණය වූ අතර, ඒ අනුව රුපියල අධික ලෙස අධිප්‍රමාණය වීම වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් මැදිහත්වීමක් අවශ්‍ය විය. අපනයන ඉපැයුම්, සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, රාජ්‍ය සුරැකුම්පත් මත වූ ලැබීම්, රජය හා පෞද්ගලික අංශය වෙත වූ විදේශ ණය සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන ලෙස ලද අනෙකුත් මූල්‍ය ලැබීම් ඇතුළත් විදේශ විනිමය ලැබීම් ඉහළ යෑම ශ්‍රී ලංකා රුපියල අධිප්‍රමාණය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2014 වසරේ තුන්වන කාර්තුව අවසාන වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 0.29 කින් අධිප්‍රමාණය විය. කෙසේ නමුත්, 2014 වසරේ අවසාන කාර්තුවේ දී ආනයන ඉල්ලුම ඉහළ යෑම සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ ශුද්ධ ගෙවීමක් වාර්තා වීම, ශ්‍රී ලංකා රුපියල මත පීඩනයක් ඇති කළ අතර, එය එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 0.47 කින් අවප්‍රමාණය වීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2014 වසර අවසානයේ දී රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 0.23 කින් අවප්‍රමාණය විය. ඒ අනුව, එ.ජ. ඩොලරයට එරෙහිව වසර අග සහ වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකයන් පිළිවෙළින් රුපියල් 131.05 සහ රුපියල් 130.56 ක් ලෙස පැවතුණි.

**2014 වසරේ දී ශ්‍රී ලංකා රුපියල අනෙකුත් සියලුම ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව අධිප්‍රමාණය විය.** ජාත්‍යන්තර වෙළඳපොළ තුළ එ.ජ. ඩොලරයට එරෙහිව අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පෙන්නුම් කරමින්, රුපියල, ජපන් යෙන්වලට එරෙහිව සියයට 13.48 කින් ද, යුරෝවලට එරෙහිව සියයට 13.19 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 5.65 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 2.13 කින් අධිප්‍රමාණය විය. ඒ අනුව, 2014 වසර අවසානයේ දී රුපියල වි.ගැ.හි. ඒකකයට එරෙහිව සියයට 6.05 කින් අධිප්‍රමාණය විය.

**5.14 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2012 | 2013 | 2014 | 2012 | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 |
| යුරෝ | 168.13 | 180.45 | 159.42 | 164.01 | 171.51 | 173.47 | -6.83 | 13.19 | -4.37 | -1.13 |
| ඉන්දියානු රුපියල් | 2.33 | 2.11 | 2.07 | 2.39 | 2.21 | 2.14 | 10.16 | 2.13 | 8.22 | 3.28 |
| ජපන් යෙන් | 1.48 | 1.25 | 1.10 | 1.60 | 1.32 | 1.24 | 18.78 | 13.48 | 20.74 | 7.17 |
| බ්‍රිතාන්‍ය පවුම් | 205.47 | 215.58 | 204.04 | 202.28 | 202.08 | 215.16 | -4.69 | 5.65 | 0.10 | -6.08 |
| එක්සත් ජනපද ඩොලර් | 127.16 | 130.75 | 131.05 | 127.60 | 129.11 | 130.56 | -2.75 | -0.23 | -1.17 | -1.11 |
| විශේෂ ගැනුම් හිමිකම් | 195.31 | 201.36 | 189.86 | 195.38 | 196.19 | 198.35 | -3.00 | 6.05 | -0.42 | -1.09 |
| **සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2010 = 100)** | **වර්ෂය අග දර්ශකය** | | | **වාර්ෂික සාමාන්‍යය දර්ශකය** | | | **පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම** | | | |
| | | | | | | | **වර්ෂය අග දර්ශකය** | | **වාර්ෂික සාමාන්‍යය දර්ශකය** | |
| | **2012** | **2013** | **2014** | **2012** | **2013** | **2014** | **2013** | **2014** | **2013** | **2014** |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 90.33 | 90.97 | 96.44 | 90.44 | 91.39 | 91.99 | 0.71 | 6.02 | 1.05 | 0.66 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 97.85 | 100.31 | 106.30 | 95.80 | 100.61 | 101.94 | 2.51 | 5.97 | 5.02 | 1.32 |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. ධන හෝ ඍණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට එරෙහිව අඩු වීම පෙන්නුම් කරයි.

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24 ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමග සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. ඍණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම හෝ පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.13 රූප සටහන** **විනිමය අනුපාතිකයේ වෙනස්වීම්**




### 5.11.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

**2014 වසර තුළ දී, නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් තවදුරටත් අධිප්‍රමාණය විය.** ශ්‍රී ලංකා රුපියල මුදල් පැසයන්හි ඇතුළත් අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව නාමිකව අධිප්‍රමාණය වීම පෙන්නුම් කරමින් මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශකයන් සියයට 6.02 ක සමාන අගයකින් අධිප්‍රමාණය විය. ශ්‍රී ලංකාව සහ වෙළඳ හවුල්කාර රටවල් අතර උද්ධමන වෙනස්වීම් ගලපා ගණනය කරනු ලබන මුදල් වර්ග 5 කින් සහ 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් පිළිවෙළින් සියයට 6.47 කින් සහ සියයට 5.97 කින් අධිප්‍රමාණය විය. නාමික සඵල විනිමය අනුපාතික අධිප්‍රමාණය වීම මෙන්ම වෙළඳ හවුල්කාර සහ තරගකාරී රටවලට සාපේක්ෂව ඉහළ දේශීය උද්ධමනයක් පැවතීම මූර්ත සඵල විනිමය අනුපාතික අධිප්‍රමාණය වීමට හේතු විය.

### 5.11.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

**2014 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය ඉහළ ගියේය.** ජාත්‍යන්තර වෙළඳාම වර්ධනය වීම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ සංචාරක ඉපැයුම් මෙන්ම ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුමේ ලැබීම් ඉහළ යෑම, දේශීය විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය වැඩිවීමට දායක විය. ඒ අනුව, එතැන් වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2013 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 8,332 හා සැසඳීමේ දී, 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 8,804 (මුළු ගනුදෙනුවලින් සියයට 56.9) ක් දක්වා වර්ධනය විය. තවද, 2013 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,373 ක් වූ ඉදිරි වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,672 ක් දක්වා වර්ධනය විය. සමස්තයක් ලෙස, 2013 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 13,706 ක් වූ අන්තර් බැංකු මුළු විදේශ විනිමය ගනුදෙනු ප්‍රමාණය 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 15,475 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2014 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළට ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත් වීම, වෙළඳපොළ ස්ථායීතාව පවත්වා ගැනීමේ උපකරණයක් ලෙස යොදා ගැනුණි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් එ.ජ. ඩොලර් මිලියන 1,407 ක් අවශෝෂණය කර ගැනීම සහ එ.ජ. ඩොලර් මිලියන 862 ක් වෙළඳපොළට සැපයීම සිදු කරන ලද අතර, අවශෝෂණය කරගත් ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 545 ක් විය.

**දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට ඉදිරි කෙටි කාලයක් තුළ දී තවදුරටත් මූල්‍ය ප්‍රවාහ ලැබෙනු ඇතැයි යන වෙළඳපොළ අපේක්ෂාව පිළිබිඹු කරමින්, සමස්තයක් වශයෙන් 2014 වසරේ දී මාසය, මාස තුන, මාස හය සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධි**

**5.14 රූප සටහන** **කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්**



**මිල පොලී අනුපාතික අන්තරයට වඩා පහළ මට්ටමක පැවතුණි.** කෙසේ නමුත්, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව අවප්‍රමාණය වනු ඇතැයි යන අපේක්ෂාව පෙන්නුම් කරමින්, මාසයක් සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධි මිල වසරේ අවසාන මාසයේ දී සමස්තයක් වශයෙන් පොලී අනුපාතික අන්තරයට වඩා ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, 2014 වසරේ වැඩි කාලයක් තුළ වාණිජ බැංකු තම ශුද්ධ අනාවරණ තත්ත්වය අවම, එහෙත් සෘණ මට්ටමක පවත්වා ගෙන ඇත. කෙසේ නමුත්, එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල අවප්‍රමාණය වනු ඇතැයි යන වෙළඳපොළ අපේක්ෂාව පිළිබිඹු කරමින්, 2014 වසරේ අවසාන කාර්තුව තුළ සමස්තයක් වශයෙන් ශුද්ධ අනාවරණ තත්ත්වය ධන මට්ටමක පවත්වා ගැනුණි.